2021

# ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයේ දැක්මඃ දෙන ලද පොරොන්දු සහ වත්මන් ප්‍රවණතා ගැන විවේචනාත්මක විමසුමක්

වාර්තාව

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්‍ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඩ විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +9411 2081384, +94112081385, +94112081386
ෆැක්ස්: +9411 2081388
වෙබ්: www.cpalanka.org
ඊමේල්: info@cpalanka.org
ෆේස්බුක්: www.facebook.com/cpasl
ට්විටර්: @cpasl



ප්‍රකාශනය:  විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), කොළඹ 5, ශ්‍රී ලංකාව

ISBN අංකය – ISBN978-624-5914-02-9

Bar Code - 9 786245 914029



ප්‍රකාශන හිමිකම © | CPA

# ස්තුතිය

මෙම වාර්තාව සමීක්ෂණය කොට ලියන ලද්දේ භවානි ෆොන්සේකා සහ උවින් දිසානායක විසිනි. සමීක්ෂණ සහාය ලබා දෙන ලද්දේ අදීබ් අන්වර්, රාජිනී චන්ද්‍රසේගරම්, මුජිබර් රහ්මන්, සහ සන්දීප් තිස්සආරච්චි විසිනි. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ලුවී ගනේෂදාසන් කෙටුම් පත පිළිබඳව අදහස් ඉදිරිපත් කළහ. මෙම වාර්තාවේ සොයා ගැනීම් පෝෂණය කළ තොරතුරු සහ නිරීක්ෂණ ලබා දුන් තවත් බොහෝ දෙනකුගේ සහාය ද කතුවරු අගය කරති.

# කෙටි යෙදුම්

CDF සිවිල් ආරක්ෂක බලකාය

ECT නැගෙනහිර බහාලුම් පර්යන්තය

FTZ නිදහස් වෙළඳ කලාපය

GSP සමාත්යික වරණාත්මක පද්ධතිය

GDP දළ දේශීය නිෂ්පාදිතය

ICCPR සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සන්ධානය

KNDU ජනරාල් සර් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලය

LTTE තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය

MCC සහශ්‍රක අභියෝග සහයෝගිතාවය (Millennium Challenge Corporation)

NMRA ජාතික ඖෂධ නියාමන අධිකාරිය

NPP ජාතික ජන බලවේගය

PTA ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

SJB සමගි ජන බලවේගය

SLPA ශ්‍රී ලංකා වරාය අධිකාරිය

SLPP ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

TNA දෙමළ ජාතික සන්ධානය

TMTK දෙමළ ජනතා දේශීය පක්ෂය

UNHRC එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලය

WCT බටහිර බහාලුම් පර්යන්තය

WHO ලෝක සෞඛ්‍ය සංවිධානය

# පටුන

**හැඳින්වීම** ....................................................................................................4
1. පාලනය....................................................................................................5
තාක්ෂණ තාන්ත්‍රික පාලනයක පොරොන්දුව ....................................................................................................5
ප්‍රබල පාලකයෙකුගේ ප්‍රතිරූපය ගොඩ නැගීම සහ වෙනසක් ඇති කිරීමේ පොරොන්දුව ....................6
ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කිරීම සහ රාජ්‍ය බලය ග්‍රහණයට ගැනීම....................................................7
වසංගතයේ ඉහළ යන පිරිවැය ....................................................................................................9
වර්ධනය වන අසාර්ථකත්වය සහ පොරොන්දු අමතක කිරීම ....................................................13
වගවීමක් නොමැතිවීම, මුක්තිය ශක්තිමත්වීම සහ දේශපාලන පලිගැනීම් ....................................15
**2. හමුදාකරණය**....................................................................................................18
හමුදා පත්වීම් සහ හමුදාකරණය වූ ආයතන ....................................................................................18
වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම හමුදාකරණය විම ....................................................................19
හමුදාකරණය මතවාදී වශයෙන් හේතු යුක්ති කිරීම ....................................................................21
ඉඩම් සහ හමුදාකරණය ....................................................................................................22
**3. සන්හිඳියාව**....................................................................................................24
වාර්ගික බහුතරවාදය සහ නව රාමු ....................................................................................................24
වසංගත තත්වය තුළ සුළුතර අයිතිවාසිකම්....................................................................................25
ඉඩම් පිළිබඳ ගැටුම් සහ සංහිඳියාවට ඇති බලපෑම ....................................................................35
**4. සංවර්ධන ගමන් මාර්ගය සහ එහි බලපෑම්** ....................................................................43
පෝර්ට් සිටි ව්‍යාපෘතිය....................................................................................................43
සංවර්ධනය පිළිබඳ අනෙකුත් මුලපිරුම් සහ ගැටලු....................................................................45
බලය විමධ්‍යගත කිරීම, සංහිඳියාව පිළිබඳ බලපෑම සහ භූ දේශපාලන අනුමිතිය. ......................47
අසමානතාවය උග්‍රවීම ....................................................................................................48
**නිගමනය** ....................................................................................................51

## හැඳින්වීම

ශ්‍රී ලංකාව පෙර නොවූ විරු අභියෝගවලට මුහුණ දෙමින් සිටී. ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 අර්බුදය ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වන මහජන සෞඛ්‍ය සහ ආර්ථික අභියෝගවලින් පමණක් සීමා නොවේ. වසංගත තත්වය තුළ කලක සිට පැවති ගැටලු ගණනාවක් ඉස්මතු කරයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කිරීමේ තර්ජනයක් සහ ව්‍යුහාත්මක අසමානතා ක්‍රියාවලියක් වන පාලනයේ පවතින දුර්වලතා මෙම කාල පරිච්ඡේදය තුළ වඩාත් පුළුල් වෙමින් ඇත.

යුද්ධය නිම කර වසර 12ක් පසු කලද ශ්‍රී ලංකාවේ දේශපාලන සිතියමේ වාර්ගික නොසන්සුන්තාවය, හමුදාකරණය සහ හිතුවක්කාර පාලනය අපි තවමත් අත්විඳිමින් සිටිමු. වසංගත තත්වය රටේ පවතින දේශපාලන ක්‍රියා මාර්ගයට බලපෑමක් වන අන්තර්වාර්ගික ගැටළු දිරි ගැන්වෙන අතර සිදුවෙමින් පවතින ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කිරීමේ ක්‍රියාවලිය සුජාත කිරීමේ සහ ප්‍රවේගවත් කරන තත්වයන් නිර්මාණය කරයි.

වත්මන් ආණ්ඩුව පරිපාලනයේ කාර්යක්ෂමතාවය වැඩි කරන සහ ආර්ථික සංවර්ධනය ප්‍රවේගවත් කරන ගමන් මාර්ගයකට මග සැලසෙන අනම් මනම් නැති වඩාත් විනය ගරුක පාලනයක් ඇති කිරීමට ඡන්ද දායකයන්ගෙන් සුවිශාල වරමත් ලබා ගත්තේය.

වඩාත් වැඩි කාර්යක්ෂමතාවය සහ සංවර්ධනය ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති තනතුරට පත්වීමත් සමග වඩාත් හිතුවක්කාර පාලනයක් හා ගැට ගැසී ඇති බව අපට දැක ගන්නට ලැබිණ. මැතිවරණයට පෙර සිටම රටේ කාර්යක්ෂමතාවය සහ සංවර්ධනය නැංවීමේ සැබෑ යාන්ත්‍රණයක් සේ ශක්තිමත් විධායකය සහ හමුදාකරණය හුවා දැක්විණ. නව ආණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යාපෘතියෙන් විධායක බලතල පිළිබඳව ඇති සංවරණ සහ තුලන සීමාවන්ගෙන් මිදුණ පාලන ක්‍රමයක් ඇති කරනු ඇතැයි තර්ක කෙරිණ. මෙම සංවරණ සහ තුලන සීමාවන් ආණ්ඩුවේ පාලනය තුළ අතීරණය සහ අකාර්යක්ෂමතාවය නිර්මාණය කරනු ඇතැයි ඔවුන්ගේ තර්කය විය. වසංගත තත්වය භාවිතයෙන්ම මෙය පැහැදිලිවම ගෙනහැර දැක්වීමට කදිම අවස්ථාවක් උදා කෙරිණ. කෙසේ වුවත් කොවිඩ් 19 වසංගත තත්වය පාලනය කිරීමේ දී ඇති වූ පසුබෑම් යෝජිත තාක්ෂණ තාන්ත්‍රික පාලනයේ සහ හමුදා පාලනයේ ඇති සිමාවන් හෙළිදරවු කොට කාර්යක්ෂමතාවය පිළිබඳ ප්‍රවාදය ප්‍රශ්නයට භාජනය කෙරිණ. කෙසේ වුවත් මධ්‍යගත නායකත්වය මෙම සන්දර්භයේ දී දුෂ්පාලනය සහ ප්‍රතිපත්තිමය වැරදි ගණනාවක් සිදු කිරීමෙන් අකාර්යක්ෂම බව තහවුරු කිරීම ආණ්ඩුවේ ප්‍රතිරූපය කෙරේ සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට හේතු විය.

වසංගත තත්වය ඇතිවීමට පෙරත් ඉන් පසුවත් හමුදාකරණයට ගාමක බලවේගයක් වූයේ සංවර්ධන සේවයේ කාර්යක්ෂමතාවය පිළිබඳව සහ ජනතාව නියෝජනය කරන ආයතනයක් ලෙස හමුදාව පිළිබඳව පැවති  සංකල්පයේ ජනප්‍රිය ප්‍රවාදය යි. කෙසේ වුවත් මේවා සියලු ජනතාව අතර පවතින ප්‍රවාද නොවේ. වඩාත් පුළුල්ව පාලන ක්‍රමය තුළ හමුදා මැදිහත්වීම වැඩි වීමෙන් පාලනය පිළිබඳ ගැටලු මතුවීම පමණක් නොව සංහිඳියාව සහ අන්තර්-වාර්ගික සම්බන්ධතා කෙරේද සැලකිය යුතු බලපෑමක් වනු ඇත.

අනෙකුත් දේශපාලන කරුණු බැහැර කොට සංවර්ධනය ගැන අවධානය යොමු කිරීමෙන් එවැනි යොමුවක් හේතු යුක්ති කළ සහ ඔපමට්ටම් කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියෙන් ඔබ්බට යන තවත් බැඳීම් ඇති කරවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කරුණු නොසලකා පෝර්ට් සිටි ව්‍යාපෘතිය සහ එවැනි වෙනත් වැඩ පිළිවෙළ වැනි දේට ප්‍රමුඛතාවය ලබා දීමෙන් දීර්ඝ කාලීන බලපෑම් ඇති විය හැකිය. වසංගත සමයේ ආර්ථිකය පවත්වා ගැනීමට සහ ආණ්ඩුවේ ආර්ථික සංවර්ධනාත්මක දැක්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ආර්ථික නිෂ්පාදනය පවත්වා ගැනීමේ කාර්ය භාරය පැවරුණ වැඩ කරන ජනතාව මුහුණ දුන් දුෂ්කරතා සැලකිල්ලට ගැනීමේ දී මෙය පැහැදිලි ය.

රාජපක්ෂ පරම්පරාව නැවත බලයට පැමිණීමේ දී වැදගත් භූමිකාවක් ඉටු කළ වාර්ගික-බහුතරවාදය තහවුරුවීම සුළුතර කොටස්වල අයිතිවාසිකම් පිළිබඳව සැලකිය යුතු ඵලවිපාක ඇති කරවන බව අපි දුටුවෙමු. මෙම මතවාදයේ බලපෑම රාජ්‍ය ක්‍රියාකාරීත්වයේ සියලු මට්ටම්වල දැකිය හැකිය. ඒවා දීර්ඝ කාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ව්‍යාපෘති, මහජන ප්‍රතිපත්ති සකස් කිරීමේ ප්‍රමුඛතා සහ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආකාරයට ද බලපෑම් කරයි.

මෙම අධ්‍යයනයෙන් පාලන ක්‍රමය, හමුදාකරණය, සංහිඳියාව සහ සංවර්ධනය යන දෘෂ්ටි කෝණයෙන් ශ්‍රී ලංකාව මුහුණ දී ඇති විවිධාකාර අභියෝග පරීක්ෂාවට ලක් කරයි. එය සංයුක්ත සහ විචාරශීලී ප්‍රතිපත්ති සකස් කිරීමක් නොමැතිවීම, වාර්ගික-බහුතරවාදි මතවාදය පිළිගැනීම සහ හමුදාකරණය වූ පාලනයක් ක්‍රියාත්මක කිරීමෙන් අහිතකර ප්‍රතිඵල ඇති වූ ආකාරය ගවේෂණය කිරීමක් වන නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඇගයීමක් වනු ඇත.

ආරම්භයේ දීම මෙය සවිස්තරාත්මක අධ්‍යයනයක් නොව මෙම ආණ්ඩුවේ පටන් ගැන්මේ සිට, විශේෂයෙන්ම වසංගත තත්වය සහ රට දැනට මුහුණ දී සිටින ආර්ථික අර්බුදය සන්දර්භයේ අදාල ක්ෂේත්‍රවල නියෝජනාත්මක සමස්ත දැක්මක් ඉදිරිපත් කිරීමේ ප්‍රයත්නයක් බව අවධාරණය කළ යුතුය.

# 1. පාලනය

### තාක්ෂණ තාන්ත්‍රික පාලනයක පොරොන්දුව

2019 දී ඉදිරිපත් කළ ක්ෂේත්‍ර ගණනාවක් ගැන සඳහන් වූ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ලේඛනය තුළින් ආණ්ඩුවේ පාලනයේ ගැඹුරු වෙනස්කම් ඇති කිරීමට ශ්‍රී ලාංකිකයන්ට පොරොන්දු වූයේය. පොරොන්දු වූ සමහර ආශ්චර්යමත් කඩඉම් වූයේ කාර්යක්ෂමතාවය, සෞභාග්‍යය සහ ස්ථාවරත්වය යි. මෙම පරමාදර්ශ සාක්ෂාත් කර ගැනීමේ වාහකය ලෙස හුවා දැක් වූයේ තාක්ෂණ තන්ත්‍රය සහ හමුදා පන්නයේ පාලනය යි. 2019 ජනාධිපතිවරණයට පෙර සිටම වෘත්තීයවේදීන් සහ හිටපු හමුදා නිලධාරීන්ගෙන් සමන්විත වියත් මග සහ එළිය වැනි රාජ්‍ය නොවන සංවිධාන බිහිවනු දක්නට ලැබිණ. ඔවුන් හැඳින් වූයේ මෙම පරිණාමය ගෙන ඒමට සමත් පර්යාය කාරකයන් සේය. 2019 දී සිදු වූ ත්‍රස්තවාදි ප්‍රහාරයක් සහ වසර කීපයක් පැවති අවුල් වියවුල්වලින් පිරි දූෂිත සභාග ආණ්ඩුවකින් පසුව තාක්ෂණ තන්ත්‍රීය හමුදා පාලනයකින් සහාය ලබන හමුදා පසු බිමක් ඇති ප්‍රබල නායකයෙකුගේ ප්‍රතිරූපයක් ගොඩ නගා තිබිණ. සම්ප්‍රදායික දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම වෙනස් වීමේ අවශ්‍යතාවය 2019 නොවැම්බර් මාසයේ දී තදින් ප්‍රක්ෂේපනය කෙරිණ.[1]

ක්‍රමයේ වෙනසක අපේක්ෂාව ඉතා ඉහළ මට්ටමක පැවතිණ. ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ මුල් දිනවල ප්‍රධාන ආයතන ගණනාවකට වෘත්තීයවේදීන් සහ විශ්‍රාමික සහ දැනටත් සේවයේ සිටින හමුදා නිලධාරීන් ගණනාවක් පත් කරනු දක්නට ලැබිණ. හමුදාකරණ වැඩි වූ පාලන ආදර්ශය හුවා දැක් වූයේ අවශ්‍ය කරන විනය, කාර්යක්ෂමතාවය සහ ආරක්ෂාවේ පදනම සේය.

2020 මුල් භාගයේ දී වසංගතයේ පළමු රැල්ල ශ්‍රී ලංකාවට කඩා වැදුණ අතර ඒ සමග වඩාත් වැඩි වූ අත්තනෝමතික සහ හමුදාකරණය වූ පාලනයකට දොර විවෘත විය. සීමාන්තික විධායක බලතල, නීතියෙන් පරිබාහිර පියවර සහ හමුදාකරණය උත්සන්න කිරීම වසංගතයක් හා සටන් කිරීමේ පදනමක් සේ හැඳින් වීය.[2] වසංගත තත්වය පිළිබඳ පහත සඳහන් කොටසින් ඉස්මතු කර දැක්වෙන ආකාරයට නීත්‍යානුකූල භාවය, ප්‍රමාණානුකූල භාවය සහ අවශ්‍යතාවය ඇතුළත් ප්‍රශ්න ගණනාවක් මතු කෙරන පියවර ගණනාවක් ගනු ලැබිණ. මාස පහකට අධික කාලයක් පාර්ලිමේන්තුව රැස් නොකිරීමෙන් විධායක නියෝග යටතේ පාලනය කිරීමේ සහ ප්‍රබල කාර්ය සාධක බලකායන් කෙරේ දැඩි විශ්වාසයක් රැඳ වූ අතිශයෙන් ව්‍යාකූල තත්වයක් නිර්මාණය කෙරිණ.[3] වසංගතයේ පළමු රැල්ලේදීම ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රියාවලියට සැලකිල්ලක් නොදක්වමින්, වසංගත තත්වය තුළ තීරණාත්මක සහ ප්‍රබල දේශපාලන නායකත්වයක අවශ්‍යතාවයත් පවතින පද්ධතිය ව්‍යාකූල තත්වයක් බවත් දක්වමින් විධායක නියෝග යටතේ කෙරෙන පාලනයක ප්‍රවනතාවය පෙන්නුම් කෙරිණ. වසංගතයේ 2020 පළමු රැල්ල සමයේ සංඛ්‍යාත්මකව එය පාලනය කිරීමට ආණ්ඩුවට හැකිවීම තාක්ෂණ තාන්ත්‍රික හමුදාකරණීය වූ ආදර්ශය

[1] ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මැතිවරණ ප්‍රකාශනය: https://gota.lk/sri-lankapodujana-peramuna-manifesto-english.pdf

[2] ෆොන්සේකා බී, ගනේෂදාසන් එල් සහ වැලිකල ඒ., 2021. ශ්‍රී ලංකාව: වසංගත-උත්ප්‍රේරණය කළ ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑසීම. 2021 වී වී රාම්රාජ් හි ආසියාවේ කොවිඩ් -19: නීතිය සහ ප්‍රතිපත්ති සන්දර්භය, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය. පිටු 349-354

[3] කොවිඩ් 19 (2020) සන්දර්භයේ පැන නගින නීතිමය ගැටලු: බලන්න පහත සඳහන් https://www.cplanka.org/brief-guide-i-evolving.legal-issues-in-the-context-of-covid-19/

හේතු යුක්ති කිරීම ශක්තිමත් කළ අතර විධායකය තුළ බලතල වඩාත් ඒකරාශි කිරීමේ ඉල්ලීම් වැඩි කරවීය.

වසංගත තත්වයේ පළමු රැල්ල සාර්ථකව පාලනය කිරීමේ දී අත්කර ගත් ජනප්‍රියතාවය සහ 'සෞභාග්‍යය' උදා කිරීමේ පොරොන්දුව 2020 අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණයේ දී පුළුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන ඒමට අවශ්‍ය වන බහුතරය, ආණ්ඩුවට ලබා දෙමින් සුවිශාල මැතිවරණ ජයග්‍රහණයක් ළඟා කර ගැනීමට හැකි විය. ඡන්ද විමසීමෙන් සති කීපයකට පසුව ඉදිරිපත් කළ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතින් 2015-2018 සමයේ හඳුන්වා දුන් ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර සංශෝධන ආපසු හැරවීමටත් සීමිත සංවරණ සහ තුලනයන්ගෙන් යුත් සර්ව බලධාරී විධායක ජනාධිපති ක්‍රමයක් ස්ථාපිත කිරීමත් සිදු විය.[4] පහත සාකච්ඡා කරන සංශෝධන ඉදිරිපත් කිරීමේ දී අත්කර ගත් ව්‍යවස්ථාදායක ජයග්‍රහණය, ආණ්ඩුව තුළ පවතින අභ්‍යන්තර බෙදීම් පිළිබඳ පෙර සලකුණක් සහ ආණ්ඩුවේ ආධාර පදනමේ සමහර කොටස් අතර පවතින කලකිරීම මෙන්ම පාර්ලිමේන්තුවේ විපක්ෂයේ පවතින දුර්වලතා ද ඉස්මතු කරයි.

පළමු රැල්ල පාලනය කිරීමේ ජයග්‍රාහී මානසිකත්වය, 2020 අගෝස්තු මැතිවරණ ජයග්‍රහණය සහ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම ආණ්ඩුව තුළ තම පාලනය ගැන අධි විශ්වාසයක් ගොඩ නගා ගැනීමට හේතු වුවද දෙවන රැල්ල පාලනය කිරීමේ දී අත් වූ අවාසනාවන්ත තත්වය සහ මතු වෙමින් පවතින සෞඛ්‍ය සහ ආර්ථික අර්බුදයේ විපිළිසර කරවන දර්ශක ද මතු විය. අනතුරුව ගත වූ මාස කීපය තුළ දුෂ්කළමනාකරණයේ සහ අසාර්ථක වීමේ විවිධ අවස්ථා, දූෂණය පිළිබඳ වාර්තා සහ පාලන ක්ෂේත්‍ර ගණනාවක් තුළ වූ සමස්ත අකාර්යක්ෂමතාවය අවුල් සහගත තාක්ෂණ තන්ත්‍රය සහ හමුදා පාලන ආදර්ශය හෙළිදරව් කෙරිණ. ඉදිරිය වඩ වඩාත් අඳුරු වෙත්ම ශ්‍රී ලංකාවේ සහ එහි දුර්වල ප්‍රජාතන්ත්‍රවාදයේ නුදුරු අනාගතය පෙර නොවූ විරූ අභියෝග මතු කරනු ඇත.

## ප්‍රබල පාලකයෙකුගේ ප්‍රතිරූපය ගොඩ නැගීම සහ වෙනසක් ඇති කිරීමේ පොරොන්දුව

ජනාධිපති තනතුරට පත් වූ මුල් මාස කීපය තුළ සම්ප්‍රදායික දේශපාලකයන් හා බැඳුණු සිමාන්විත කටයුතුවලින් බැහැර වූ ප්‍රබල කාර්යක්ෂම පාලකයෙකුගේ ප්‍රතිරූපය ප්‍රවේශමෙන් ගොඩ නැගිණ. වැඩ කටයුතු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ කාර්යාලවලට ජනාධිපතිවරයා පුද්ගලිකවම යෑමේ රූප රාමුවලින් ඔහු කාර්යක්ෂමතාවය තම ප්‍රමුඛතාවය කර ගත් නායකයෙකු බව ජනතාවට පිළිගැන්වීය. ප්‍රතිරූපය වූයේ තාක්ෂණ තාන්ත්‍රික ආණ්ඩුවක් සහ ජනතාවගේ දුක්ගැනවිලි විසඳීම ප්‍රමුඛතාවය කර ගත් විධායකයෙකි. වැඩ අතපසු කිරීම අවම කරන, දූෂණ චෝදනා ආමන්ත්‍රණය කරන, ආයෝජක විශ්වාසය ආකර්ෂණය කෙරෙන පද්ධති ක්‍රමයක් තහවුරු කිරීම (අනෙක් කරුණ වූයේ ආරක්ෂාවයි.) 2019 දී ගෝඨාභය රාජපක්ෂගේ අපේක්ෂකත්වයට ජනතාව ආකර්ෂණය කරවීමට හේතු විය. එම ප්‍රතිරූපය, 'යහපාලනය' පැවති කාලය ඇතුළත්ව කලින් පැවති ආණ්ඩු සමයේ පාලනයේ දක්නට ලැබුණු ප්‍රමාදයන් සහ නොයෙකුත් බාධාවන්ට මුහුණ දුන් ජනතාවට අවසානයේ දී ඔවුන්ගේ දුක් ගැනවිලිවලට සවන් දෙන ආණ්ඩුවක් බිහිවීම බොහෝ දෙනකුගේ සතුට ට හේතු විය.

වසංගතයේ පළමු රැල්ල පාලනය කළ ආකාරයෙන් ක්‍රියා පටිපාටි සහ නීතියේ අවුල් සහගත විස්තරවල පැටලෙන්නේ නැති ජනාධිපතිවරයෙකු තත්වය ගෙන හැර දැක්වීය. පළමු රැල්ල හට ගත්තේ පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කළ වහාම ය.[5] පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ වසංගත තත්වයක් තුළ මැතිවරණයක් පැවැත්වීමේ අපහසුව ගැන මැතිවරණ කොමිසම සඳහන් කිරීමත් සමග ශ්‍රී ලංකාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයකට ලක්විය. හදිසි තත්වයක දී පාර්ලිමේන්තුව ආපසු කැඳවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තිබුණ ද, එම පියවර ගැනීමට විපක්ෂය ජනාධිපතිගෙන් ඉල්ලීම් කළ ද මාස පහකට අධික කාලයක් තිස්සේ ජනාධිපති විධායක නියෝග යටතේ රට පාලනය කිරීමට තීරණය කළේය.[6] ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ල වූ බරපතළ ගැටලු තිබුණ ද විධායකය

[4]දිනේෂා සමරරත්න ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිං පොං ක්‍රීඩාව, හිමල් මැගසින්. 25 සැප්තැම්බර 2020 : ආණ්ඩුක්‍රව ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයට කෙටි මගපෙන්වීමක්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) ජුනි 2021

[5]මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ කේන්ද්‍රය (CMEV) 2020 මහ මැතිවරණය කල් දමන්නැයි මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණය කිරීමේ කේන්ද්‍රය ඉල්ලයි.''2020 මාර්තු 17 https://cmev.org/2020/03/17/cmev-calls-for-postponement-of-general-ek\lection-2020/

[6]අර්ජුන රණවන ''විසුරුවා හැරීමෙන් මාස තුනකින් පසුවත් ඡන්දය පැවැත්වීමට නොහැකි වීමෙන් ව්‍යවස්ථා අර්බුදයක ලකුණු මතු වේ'' 2020 මාර්තු 17 ඉකොනොමි නෙක්ස්ට්; https://economynext.com/constitutional-crisis-crisis-looms-as-poll-date-goes-beyond-three-months-of-dissolution-67839/#modal-one; අසංග වැලිකල සහ සුරේන් ප්‍රනාන්දු, නීතිය සහ නිදහස සමග කාර්යක්ෂමතාවය තුලනය කිරීම: ප්‍රජාතන්ත්‍රවාදය පසු පසට නොදමා වසංගතය

අවසානයේ 2020 අගෝස්තු මස මැතිවරණය පවත් වන තෙක් පාර්ලිමේන්තු අධීක්ෂණයක් නැතිව පාලනය ගෙන ගියේය.

සම්මුතීන් හෝ ක්‍රියා පටිපාටිවලින් බැඳීමක් නැති සහ වැඩ කිරීම ප්‍රමුඛතාවය කර ගත් අනම් මනම් නැති විධායකයක ප්‍රතිරූපය ගොඩ නැගුණ අතර ඉන් මංත්‍රීන් 225කින් යුත් පාර්ලිමේන්තුවක අවශ්‍යතාවය ගැන සැක සංකා ඉපද වීය.[7] පළමු රැල්ල සාර්ථකව මැඩ පැවැත්වීමෙන් සහ වසංගතය පරාජය කිරීම පිළිබඳව සාවද්‍ය ආරක්ෂාවක් ගැන හැඟීමක් ජනතාව තුළ ඇති කිරීමෙන් සුපිරි ජනාධිපති ආදර්ශයක් සඳහා සහාය තවදුරටත් වැඩි කළ අතර ඊට වෘත්තීය වේදීන්ගේ සමහර පක්ෂපාතී කොටස්වල සහ හමුදාවේ සහාය නොමදව ලැබිණ.

පාස්කු ඉරිදා ප්‍රහාරය සහ අනතුරුව හට ගත් ප්‍රචණ්ඩ ක්‍රියා සහ ''බැඳුම්කර වංචාව'' වැනි අපකීර්තිමත් සිද්ධීන් ඇතුළත්ව යහ පාලන ආණ්ඩුව යටතේ අත්විඳි විවිධාකාර ආපදා සහිත පසුබිමක බොහෝ දෙනා අතර ස්ථාවරත්වය සහ ආරක්ෂාව සඳහා බලවත් ආශාවක් ගොඩ නැගී තිබිණ. ප්‍රබල විධායකයක් සමග තාක්ෂණ තාන්ත්‍රික පාලන ආදර්ශයකින් අදහස් කරන ලද්දේ මෙවැනි බිය සමනය කිරීම ය. හමුදාවෙන් ඉටු කරන ලද ප්‍රබල භූමිකාව සමග විධායකය වසංගත තත්වයේ පළමු රැල්ල සාර්ථකව ජය ගැනීමෙන් පාර්ලිමේන්තුවක පවතින පටලැවිලි සහ ප්‍රජාතන්ත්‍ර ක්‍රියා පටිපාටියක ඇති වෙනත් ලක්ෂණත් අවශ්‍ය වන්නේ ද යන කතිකාව පෝෂණය කළේය.

වසංගතයේ පළමු රැල්ල සාර්ථකව මැඩ පැවැත්වීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පාර්ලිමේන්තු මැතිවරණයේ දී ආසන 225කින් 145ක් දිනා ගැනීමෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගැනීමට හේතු විය. ඡන්ද ව්‍යාපාරයේ දී ඉදිරිපත් කර ඇති වේගවත් වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සුවිශාල ජයග්‍රහණයක් ලබා දෙන ලෙස රජයේ සමහරු ඉල්ලා සිටියහ. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ නිර්මාතෘවරයෙකු මෙන්ම එහි ජාතික සංවිධායක වූ බැසිල් රාජපක්ෂ මහතා මෙසේ පැවසූ බව වාර්තා වේ.[8] ''නමුත් ජනතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවෙන් සහ පොදු ජන පෙරමුණෙන් බලාපොරොත්තු වන මූලික දේ එයයි. ආණ්ඩුවක් පිහිටු වූ විට ජනතාව බොහෝ දේ බලාපොරොත්තු වෙනවා. ඒ අපේක්ෂා ඉටු කිරීමට අපට තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය යි. අපට පැහැදිලි ජනවරමක් ලැබුණු පසු එය කිරීම පහසුයි. එමනිසා තුනෙන් දෙකක බහුතරයක් අපට ලබා දීම ජනතාව සතු වගකීමක්. එය ලබා දුන හොත් ඔවුන්ගේ අපේක්ෂා ජනාධිපති තුමා ඉටු කරන බවට මම සහතික වෙනවා.''

මිත්‍ර පක්ෂවල සහාය ඇතිව ආණ්ඩුවට තුනෙන් දෙකක බහුතරයකට ආසන්න බලයක් ලබා ගැනීමට හැකි වූ අතර ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනය ගෙන ඒමට අවස්ථාව සැලසිණ. සුවිශාල මැතිවරණ ජයග්‍රහණයෙන් ඇති වූ ජයග්‍රාහී මානසිකත්වය නිසා වසංගතය පාලනය කිරීමට ගත යුතු පියවර රැසක් ගැනීමට නොහැකිවීම ඇතුළත් පසුබෑම් කීපයක් ඇති වීමට හේතු වූ අතර එය දෙවන රැල්ල මතු වීමටත් ඉන් අනතුරුව තුන්වැනි රැල්ලක් ඇතිවීමටත් හේතු විය. එමනිසා 2019 හා 2020 මැතිවරණවලදී ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් බව පෙන්නුම් කරන්නක් විය.

## ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කිරීම සහ රාජ්‍ය බලය ග්‍රහණයට ගැනීම

2020 මහා මැතිවරණයෙන් ලබා ගත් සුපිරි ජයග්‍රහණයෙන් පසුව ගත් මූලික පියවරවලින් එකක් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 20 වැනි සංශෝධනය යි. මැතිවරණයට පෙර කරන ලද ප්‍රකාශන සැලකිල්ලට ගැනීමේ දී මෙම කඩිනම් පියවර පුදුමයට කරුණක් නොවේ.[9] යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතින් වෙනත් කරුණු අතර නීතිමය අභියෝග කිරීම්වලින් මුක්තිය ලබා දීම, අගමැති සහ කැබිනට් මණ්ඩලයේ භූමිකාව දුර්වල කිරීමෙන් ජනාධිපති බලතල තව දුරටත් ශක්තිමත්

ගැන කටයුතු කිරීම2020 අප්‍රේල් 8 ඩේලි එෆ්ටී https://www.ft.lkopinion/Balancing-efficiency-with-law-and-liberty-Dealing-with-the-pandemic-without-democratic-backsliding/14-698609

[7]ශ්‍රී ලංකාව පවුලක රාජ්‍යයක් බවට පත්වේ 2020 අගොස්තු 16. ඉකොනොමිස්ට්; https://www.economist.com/asia/2020/08/13/sri-lanka-is-becoming-a-one-family-state අසංග වැලිකල ශ්‍රී ලංකාවේ අධිරාජ්‍ය ජනාධිපති තනතුරේ ආපසු පැමිණීම: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනතට ගෙන එන 20 වැනි සංශෝධනය 20202 සැප්තැම්බර් 8 constitutionnet; https://constitutionnet.org/news/return-sri-lanka-imperial-presidency-twentieth-amendment-constitution-bill

[8]උපුල් ජයසූරිය ''තුනෙන් දෙකේ බහුතරයක් ලබා දීම ජනතාවගේ යුතුකමක්.'' 2020 ජූලි 29 ඩේලි එෆ්ටී https://www.ft.lk/opinion/Up-to-the-people-to-give-us-a two-thirdsmajority-Basil/14-703809

[9] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2020. විසිවැනි සංශෝධනය පිළිබඳ ප්‍රකාශය: 2020 සැප්තැම්බර් බලන්න. https://www.cplanka.org/statement-on-Twentieth-amendment-2

කිරීම, ව්‍යවස්ථාදායක සභාව වෙනුවට සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු මංත්‍රීන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු සභාවත් පත් කිරීම, ස්වාධීන ආයතන දුර්වල කිරීම, හදිසි පනත් හඳුන්වාදීම සහ කෙටුම්පත් ව්‍යවස්ථා ගැන කටයුතු කිරීමට පුරවැසියන්ට ඇති කාලය අඩු කිරීම මගින් විධායක ජනාධිපති ක්‍රමය වඩාත් ශක්තිමත් කෙරිණ.[10] මෙම යෝජනා හේතු යුක්ති කරන ලද්දේ වැඩ කිරීමට හැකි ප්‍රබල නායකයෙකුට එවැනි බලතලවල අවශ්‍යතාවය සහ 2018 දී ශ්‍රී ලංකාවේ පැවති ආණ්ඩුක්‍රම ව්‍යස්ථා අර්බුදයේ දී මුහුණ දුන් ආකාරයට අවිනිශ්චිත භාවයක් නිර්මාණය කළ හැකි බල කේන්ද්‍ර දෙකක් ඇතිවීම වැළැක්වීම යන පදනම යටතේය.

ආණ්ඩුවේ මැතිවරණ ජයග්‍රහණය සහ වසංගත තත්වයේ පළමු රැල්ල මැඩ පැවැත්වීමෙන් ජනප්‍රියත්වයට පත් වුවත් 20 වැනි සංශෝධන පනතට ලැබුණු ප්‍රතිචාරය කැපී පෙනෙන සුළු ය. පනත ඉදිරිපත් කිරීමත් සමග කැබිනට් මණ්ඩලයේ සමහර අයගෙන් ද, ආණ්ඩු පක්ෂයේ සමහර මංත්‍රීන්ගෙන්ද බෞද්ධ භික්ෂූන් ඇතුළත් ආණ්ඩුවේ බලවත් ආධාරකරුවන්ගෙන් ද විරෝධයක් මතු විය. බොහෝ දෙනෙකු මෙම පනත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝග කිරීමත් සමග අත් වූ දේශපාලන පසුබෑම නිසා පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේ දී සංශෝධන කීපයක් ඉදිරිපත් කිරීමෙන් පනත සම්මත කර ගැනීම කඩිනමෙන් සිදු විය.[11] මෙම පනතට ඉදිරිපත් වූ විරෝධය ආණ්ඩුව තුළත් ඔවුන්ට පක්ෂපාත සමහර ආධාරකරුවන් අතරත් ඇති බෙදීම් ප්‍රසිද්ධියට පත් කළ පළමු අවස්ථාව යි.

මෙවැනි විරෝධයක් තිබුණ ද ආණ්ඩුවට තමන්ගේම මංත්‍රීන් ගේ සහ සමගි ජන බලවේගයේ මංත්‍රීන් 8 දෙනකුගේ සහායෙන් පනත සම්මත කර ගැනීමට හැකි විය. 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගැනීම ආණ්ඩුවේ පළමු ප්‍රධාන ව්‍යවස්ථාමය පරීක්ෂණය වුවද ඒ සමග අනපේක්ෂිත සමහර බාධක ද හෙළිදරවු විය. කෙසේ වුවත් මෙම පනත සම්මත කර ගැනීමෙන් විවිධ කොටස්වලින් විරෝධයක් මතු වුවද වැදගත් ව්‍යවස්ථා සම්මත කර ගැනීමට ආණ්ඩුවට ඇති හැකියාව ප්‍රදර්ශනය විය. සංශෝධනයට පක්ෂව තමන්ගේම පක්ෂයේ කීප දෙනකු ඡන්දය දීම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ගේ ද පළමු පරීක්ෂණය විය.

සංශෝධනයේ බලපෑම කැපී පෙනෙන සුලු ය. ඉන් විධායක ජනාධිපති තනතුර සීමිත සීමාකිරීම්වලින් යුත් සර්ව බලධාරි නිලයක් විය. නිදසුනක් වශයෙන් ඉහළ අධිකරණය සහ නීතිපති වැනි ස්වාධීන ආයතනවල සාමාජිකයන් ජනාධිපති විසින් පත් කරනු ඇත. පාර්ලිමේන්තු සභාවෙන් කෙරෙන්නේ ඔහු ඉදිරිපත් කරන නම් අනුමත කිරීම පමණි. ඉන් ජනාධිපතිට සහ ආණ්ඩුවට පක්ෂපාත අය පමණක් ප්‍රධාන තනතුරුවලට පත්වීම තහවුරු කෙරේ. පසුව වූ වර්ධනයන්ගෙන් විධායකයේ සීමාන්විත පියවර පරීක්ෂා කිරීම සඳහා වූ ආයතන මෑත වසරවල සැලකිය යුතු ආකාරයෙන් දුර්වල කළ බව දක්නට ලැබිණ. එම ආයතනවලින් අදහස් වූයේ හිතුවක්කාර පියවර නතර කිරීම ය. ජනාධිපති විසින් දැක්වූ ආකාරයට ප්‍රධාන තනතුරු දරන අයට විකල්ප අදහසක් දැරීමට අවකාශයක් නැත. තම දැක්ම ඉටු කිරීමේ දී කිසිම විරෝධතාවයක් අපේක්ෂා නොකරන බව ඔහු පැහැදිලි කෙළේය. '' මගේ පොරොන්දු ඉටු කිරීමේ දී රාජ්‍ය නිලධාරීන්ගෙන්, නීති සම්පාදකයන්ගෙන් හෝ අධිකරණයෙන් බාධා කිරීමක් මා අපේක්ෂා කරන්නේ නැත.''[12] මෙවැනි ප්‍රකාශන බොහෝ දෙනා විධායකයට යටහත් පහත් තත්වයට පත් කිරීමට හේතු විය. තම හඬ නැගූ අයට එම ක්‍රියාවට තරවටු කොට කොන් කෙරිණ.

මෙම තත්වය සම්පූර්ණ වූයේ රාජපක්ෂ පවුලේ සාමාජිකයන් සහ පක්ෂපාත අය ප්‍රධාන ආයතන සහ තනතුරුවලට පත් කිරීමෙනි. ඉන් රාජ්‍යයේ බලය ග්‍රහණයට ගැනීමත් ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලින් සහ ආයතන දුර්වල කිරීමත් සිදු විය.[13] 2020 වසරේ දක්නට ලැබුණු තවත් වර්ධනයක් වූයේ කාර්ය සාධක බලකා කීපයක් පත් කිරීම ය. මුලින්ම ඒවා වසංගත තත්වය සම්බන්ධයෙන් වුවද පසුව විනය පවත්වා ගැනිම මෙන්ම නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් දක්වා පුළුල් කෙරිණ.[14] මෙම

[10]20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කෙටි මගපෙන්වීමක්. 2021 ජූනි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

[11]20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කෙටි මගපෙන්වීමක්. 2021 ජූනි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

[12]ලහිරු පොත්මුල්ල. ''ජනතාවට දුන් පොරොන්දු ඉටු කිරීමේ දී මා ව්‍යවස්ථා සම්පාදකයන්ගෙන්, අධිකරණයෙන් මැදිහත්මක් අපේක්ෂා කරන්නේ නැත.'' 2020 පෙබරවාරි 4 ඩේලි මිරර්https://www.dailymirror,lk/breaking-news/don't-expect-interference-from-legilators-judiciary-when-fulfilling-duties-to-people-Prez/108-182475

[13]වඩාත් මෑතක දී බැසිල් රාජපක්ෂ ඡන්ද බලයට සහ ස්වෛරීත්වයට බලපෑමක් වන ආකාරයට ජාතික ලැයිස්තුවේ මංත්‍රී කෙනෙකු ලෙස පත් කෙරිණ. https://www.cpalanka.org/cpa-statement-on-the-constitutionality-of-the-slpp-national-list-appointment ට්‍රාන්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා " කිසි දින නොවූ ඊනියා සීනි වංචාව ගැන ආපසු හැරී බැලීමක් 2021 මැයි 1 https://www.tirilanka.org/a-look-at-the-alleged-sugar-scam/

[14]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020. ශ්‍රී ලංකාවේ කොවිඩ් -19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ව්‍යූහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය (මාර්ගගතව) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිළිබඳ ලුහුඬු සටහන. ප්‍රවේශ විය හැකි යොමුව.

සමහර කාර්ය සාධක බලකා සහ ඒවායේ අධිකාරිය පවතින රේඛීය අමාත්‍යංශ සහ සිවිල් පරිපාලනය හා ගැටෙන්නේ ද යන්න පිළිබඳවත් ඒවායේ නීත්‍යානුකූල භාවය ගැනත් ප්‍රශ්න මතු විය. වැඩි දුරටත් සමහර කාර්ය සාධක බලකාවල සංයුතිය ගැටලු සහගත ය. කාර්ය සාධක බලකා කීපයක් විශ්‍රාමික හෝ සේවයේ යෙදි සිටින හමුදා නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් හෝ සාමාජිකත්වයෙන් යුතුය. වඩාත් වැදගත්ව නැගෙනහිර පළාත සම්බන්ධයෙන් පත් කල කාර්ය සාධක බලකාය, එම ප්‍රදේශයේ බහුතරය දෙමළ සහ මුස්ලිම් වුවත් සම්පූර්ණයෙන්ම සිංහල අයගෙන් සමන්විතය.[15]

පාලනයේ හමුදාකරණ ස්වභාවයේ වැඩිවීමෙන් සැලකිය යුතු බලපෑම් ඇති විය. (මෙම කරුණ වාර්තාවේ පසුව සවිස්තරාත්මකව සාකච්ඡා කරනු ඇත.) වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම ඇතුළත්ව ආණ්ඩුවේ ප්‍රධාන තනතුරු බොහොමයකට විෂය කරුණු පිළිබඳ විශේෂඥයන් සහ සිවිල් පරිපාලකයන් යටපත් කර සහ නොසලකා හැර හමුදා පසුබිමක් ඇති පුද්ගලයන් පත් කර ඇත. ආරක්ෂාව, නීතිය සහ සාමය සහ තවත් ක්ෂේත්‍රවල ප්‍රධාන තනතුරු ගණනාවකට දැඩි සිංහල ජාතිවාදී මතවාදයක් ඇතැයි හැඳින්වෙන පුද්ගලයන්ට ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. වෘත්තීය හමුදා සේවය ද වැඩි වැඩියෙන් පක්ෂග්‍රාහී සහ දේශපාලනීය තත්වයකට පත් කෙරිණ. රාජපක්ෂලාගෙන් දේශපාලන අවස්ථා සහ ආවරණය ලැබීමෙන් හමුදාව ශ්‍රී ලංකාවේ වඩාත් බලවත් සහ ජනප්‍රිය ආයතන බවට පත් විය. පසුගිය මාසවල දක්නට ලැබුණු බලයේ ආශ්වාදය සැලකිල්ලට ගැනීමේ දී හමුදාව ආපසු මුළුමණින්ම සටන් කරන වෘත්තීය හමුදාවක් බවට පත් කිරීමේ හැකියාවක් පවතීද යන සැකය ඇති කරයි.

### වසංගතයේ ඉහළ යන පිරිවැය

ශ්‍රී ලංකාවේ වසංගතයට ප්‍රතිචාර දැක්වීම හැඩ ගසන ලද්දේ සෞඛ්‍ය සහ අනෙකුත් වෘත්තිකයන් බොහෝ කොට කොන් කරන ලද වැඩි වශයෙන්ම හමුදාකරණීය වූ පිවිසුමකින් 'වසංගතයට එරෙහි යුද්ධයක' ස්වභාවයෙනි. ඒ සඳහා නව ව්‍යුහයන් හඳුන්වා දෙන ලදී. නීත්‍යානුකූල භාවය, සමානුපාතික භාවය සහ අවශ්‍යතාවය පිළිබඳ මෙන්ම ක්‍රියාවලිය සහ මූල්‍ය කටයුතු පිළිබඳව ද ප්‍රශ්න මතුවිය.[16] වසංගත තත්වය තාක්ෂණ තන්ත්‍රය සහ හමුදාකරණය වූ පාලනය මත විශ්වාසය රැඳ වූ සුපිරි ජනාධිපති ක්‍රමයේ අසාර්ථකවීම් ද හෙළිදරව් කෙරිණ. එහි බරපතල සෞඛ්‍ය සහ ආර්ථික ප්‍රතිඵල ද ඇති විය.

**නෛතික සහ ප්‍රතිපත්ති සංගත භාවයක් නැතිවීම**

2020 වසරේ වසංගතය ව්‍යාප්ත වූ මුල් සති කීපය තුළ ආණ්ඩුවට, ප්‍රතිපත්ති සහ මහජනයාට පණිවුඩය ලබා දීමේ දී සංගත ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමට නොහැකි බව හෙළිවිය. එවැනිම ප්‍රවනතාවයක් දෙවන සහ තෙවන රැලි වලදී ද දක්නට ලැබිණ. වසංගත තත්වයට මුහුණ දීමේ දී අලුත් පියවර ගැනීමේ අවශ්‍යතාවය ගැන පිළිගැනීමක් පැවතිය ද සංචරණ සීමා පැනවීම වැනි හඳුන්වා දුන් සමහර පියවර ගැන නීතිමය ගැටලු ද මතුවිය.[17] එමෙන්ම හදිසි තත්වයන්ට සහ ආපදාවන්ට මුහුණ දීම සඳහා නීතිමය ප්‍රතිපාදන පැවතිය දී ඒවා යොදා නොගැනීම ගැටලු සහගත ය. ඒ විධායකය විසින් තීරණ ගැනීමේ අවශ්‍යතාවය හුවා දැක්වීමට සහ ව්‍යවස්ථාදායකයේ අධීක්ෂණය වැළැක්වීමට ද යන ප්‍රශ්නය මතු කෙරේ.

තීරණ සන්නිවේදනය කිරීම අවස්ථා කීපයක දී ජනාධිපති කාර්යාලයේ ප්‍රකාශන වලින් සිදු වූ අතර තවත් විටෙක පොලිසියේ මාධ්‍ය නිවේදන නිකුත් කිරීමෙන් තීරණ ගැනීමේ දී සහ තීරණ සන්නිවේදනය කිරීමේ දී නායකත්වය ගන්නේ කවුරුන්ද යන්න ගැන ව්‍යාකූලතා ඇති විය. වැඩි දුරටත්

https://www.cplanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presidential-task-force/

[15]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA ) 2020 ජනාධිපති කාර්ය සාධක බලකා දෙකක් පත් කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලන්න. https://www.cpalanka.org/the-appointment-of-the-two-presidential-task-forces/

[16]ෆොන්සේකා බී, ගනේෂදාසන් එල් සහ වැලිකල ඒ. , 2021. ශ්‍රී ලංකාව: වසංගත-උත්ප්‍රේරණය කළ ප්‍රජාතන්ත්‍රවාදී පසුබැසීම. 2021 වී වී රාම්රාජ් හි ආසියාවේ කොවිඩ් -19ඃ නීතිය සහ ප්‍රතිපත්ති සන්දර්භය, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය. පිටු 349-364

[17]මුලින්ම ශ්‍රී ලංකාවේ 'ඇඳිරි නීතිය' පනවා ඇත්ද යන්න මතු වූ විට එය ආඥාපනත අනුව 'හුදකලා කිරීම' හෝ 'සංචරණ සීමා' සහ 'වසා දැමීම' යනුවෙන් හැඳින්වීමේ ප්‍රයත්න දැකිය හැකිය. ඉන් නීතිමය ගැටලු සහ මෙම මූලපිරුම්වල තත් කාර්ය ස්වභාවය හෙළිදරවු විය. එමෙන්ම 'ඇඳිරි නීතිය' කඩ කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල භාවය ගැන සහ වෙනත් සීමාවන් පැනවීමේ ප්‍රයත්නයන් පිළිබඳවද ප්‍රශ්න මතු විය.

ආණ්ඩුව 1897 තරම් ඈත කාලයක පැනවූ යල්පිනූ නිරෝධායන සහ ලෙඩ රෝග වැළැක්වීමේ පනත මත රැඳී සිටිය අතර එය මෙම ව්‍යාකූලත්වය වැඩි කිරීමට තවත් හේතුවක් විය.[18]

**ප්‍රායෝගික අභියෝග-** 'වසා දැමීම' (Lockdown) හදිසියේම සිදු වීම නිසා එය සමාජ-ආර්ථික අභියෝග ගණනාවකට හේතු විය. වැඩියෙන්ම පීඩාවට ලක් වූයේ දෛනික කම්කරුවන් සහ නොවිධිමත් අංශයේ පුද්ගලයන් ය. ඒ වන විට වඩාත්ම අවදානමට ලක් වූවන්ට සහන සැලසීමේ පැහැදිලි සැලැස්මක් සකස් කර තිබුණේ නැත.

අනිවාර්යෙන් ආදාහනය කිරීම වැනි (එය මෙම වාර්තාවේ පසුව සාකච්ඡා කෙරෙනු ඇත.) වසංගත සමයේ හඳුන්වා දුන් ප්‍රතිපත්ති ගණනාවක්ම වැඩි වශයෙන්ම සුළුතර කොටස් ඉලක්ක කර ගත් ඒවාය. එය මුස්ලිම් ප්‍රජාවේ ආගමික විශ්වාසයන්ට ඍජුවම එල්ල වූ ප්‍රහාරයක් මෙන්ම ඊට කිසියම් විද්‍යාත්මක පසුබිමක් තිබුණේ නැත. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ඇතුළත් වෛද්‍ය විශේෂඥයන් ඊට වෙනස් මතයක් ඉදිරිපත් කළ ද ආණ්ඩුව මාස කීපයක්ම අනිවාර්ය ආදාහනය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කෙළේය. ආණ්ඩුව එය ඉවත් කර ගත්තේ ප්‍රජාවෙන් ඉදිරිපත් වූ ඉමහත් බලපෑම සහ 2021 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලයේ (UNHRC) ක්‍රියාවලියත් සමග මතු වූ අන්තර්ජාතික හෙළා දැකීමත් සමග ය.

වසංගතයේ පළමු රැල්ලේ දී වාර්තා වූයේ රෝගීන් සහ මරණ සුළු සංඛ්‍යාවක් නිසා එම තත්වය බලධාරීහු වසංගතය සාර්ථකව මැඩ පැවැත් වූයේයැයි තම ප්‍රතිරූපය නගා සිටුවීමට වහාම යොදා ගත්හ. සාවද්‍ය ජයග්‍රාහී මානසිකත්වයෙන් උදම් වී පාර්ලිමේන්තු මැතිවරණ ව්‍යාපාරයේ දී ආණ්ඩුව වසංගත තත්වය මැඩ පැවැත්වීම තමන්ගේ ප්‍රචාරක මාතෘකාවක් වශයෙන් යොදා ගත්තේය. දැවැන්ත මැතිවරණ රැස්වීම් පවත්වන ලද අතර මැතිවරණ ව්‍යාපාරයේ දී සෞඛ්‍ය ආරක්ෂණ විධි විධාන සැලකිල්ලට ගන්නා ලද්දේ සීමිතව ය. මැතිවරණය අවසන් වූ වහාම සහ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත් පසුව දෙවන රැල්ලක් පවතින බව තහවුරු වීමෙන් වාර්තාවන රෝගීන්ගේ සංඛ්‍යාවද ඉහළ යැමට පටන් ගත්තේය.

වසංගතයේ පළමු රැල්ල සාර්ථකව මැඩ පැවැත්වීමට හැකිවීම හා සැසඳීමේ දී ඊට වෙනස්ව 2020 සහ 2021 යන වසරවල වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ පසුබෑම් ගණනාවක්ම දක්නට ලැබිණ. රෝගීන් සංඛ්‍යාවේ සහ මරණ අනුපාතයේ ඉහළ යැමත් සමග පරීක්ෂා කිරීමේ, නිරෝධායන ක්‍රියාවලියේ, එන්නත් ලබා දීමේ, මහජන ප්‍රචාරක වැඩ කටයුතුවල සහ වසංගතයට ප්‍රතිචාර දැක්වීමට වෙන් කරන ලද සම්පත් පිළිබඳව විවිධාකාරයේ චෝදනා මතු විය.

වසංගත ව්‍යාප්තිය වැළැක්වීම සහ හානිය අවම කිරීමට අපොහොසත්වීමේ වගකීම පිළිගැනීම මූලික වශයෙන්ම දේශපාලකයෝ ප්‍රතික්ෂේප කළහ. 2021 ජූනි මාසය වන තෙක්ම වසංගතය සමාජය තුළ ව්‍යාප්තවීම නිල වශයෙන් පිළිගැනීමක් සිදු වූයේ නැත. ඒ වෙනුවට සඳහන් වූයේ 'පොකුරු' ව්‍යාප්තියක් ගැන ය.[19] ප්‍රජාව තුළ රෝගය පැතිර යැම පිළිගැනීමට ඇති අකමැත්ත තේරුම් ගත යුතු වන්නේ වයිරසයේ වත්මන් ප්‍රභේදය සීග්‍රයෙන් පැතිර යන බව සෞඛ්‍ය වෘත්තිකයන් පිළිගන්නා පසුබිමක ය. කලින් පැවති ප්‍රභේද මෙන් නොව නව ප්‍රභේදය මරණය ඇතුළත්ව බරපතළ සංකූලතා සහිත තරුණ රෝගීන් ද දක්නට ලැබිණ.

**සෞඛ්‍ය අංශය නොසලකා හැරීම:** වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමේ දී ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල මහජන සෞඛ්‍ය පද්ධතිය ද වාසියක් විය. එහෙත් එය ද පෙර නොවූවිරූ ආකාරයෙන් පරීක්ෂාවට ලක් විය. මෑත වසරවල සෞඛ්‍යය ඇතුළත් සමහර ක්ෂේත්‍රවල නොකඩවාම වියදම් කපා හැරීමක් දක්නට ලැබුණ අතර ආරක්ෂක වැය ශීර්ෂය නොකඩවාම ඉහළ ගියේය. යුද්ධය අවසන් වී වසර දොළහක් පසු වුව ද ආරක්ෂක වියදම්වලට ලැබුණේ ඉහළම තැනකි.[20] මෙවැනි ප්‍රමුඛතා ගත කිරීම්වලින් ආණ්ඩුවේ චින්තනය සහ උපාය මාර්ගය ඉස්මතු කර දැක්වෙන අතර මෙය වැදගත් වන්නේ විශේෂයෙන්ම ශ්‍රී ලංකාව පශ්චාත් යුද සමයක මුහුණ දී ඇති සෞඛ්‍ය අර්බුදකාරී සන්දර්භයක ය.

---

[18]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2021. *ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 වසංගතය පාලනයට නීතිමය රාමුව පිළිබඳ යාවත්කාලීන කිරීමක්*. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. ප්‍රවේශ විය හැකි යොමුව: https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/

[19]2020 දී ඊට ඇතුළත් වූයේ මිනුවන්ගොඩ පොකුරු, නාවික පොකුර, පෑලියගොඩ යනුවෙනි. 2021 දී නව පොකුර හැඳින් වූයේ 'අලුත් අවුරුදු පොකුර' යනුවෙනි.

[20]වර්ෂ 2020 අයවැය පිළිබඳ වෙරිටේ පර්යේෂණ (Verite Research) වාර්තාව: 2020 ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වියදම් ප්‍රතිපාදන සහ බදු අය කිරීමේ ප්‍රතිපත්තිය සමග ගැලපෙන්නනේ ද යන්න සම්බන්ධයෙන් ඇගයීමක්

වසංගත තත්වය තුළ දේශපාලන පත්වීම් ලැබූ අය සහ හමුදාව නායකත්වය අත් කර ගැනීමෙන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය දෙවැනි භූමිකාවකට පහත හෙළන ලද ආකාරයක් දක්නට ලැබිණ. 2020 වසරේ සති කීපයක්ම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් තනතුරු හිස්ව පැවති අතර වසංගත තත්වය පිළිබඳව තීරණ වැඩි වශයෙන්ම ගනු ලැබුවේ හමුදාව සහ වෛද්‍ය විශේෂඥත්වයක් නැති වෙනත් අය විසිනි.[21] විවේචනාත්මක වූ සහ නිල ස්ථාවරයට එකඟ නොවූ සෞඛ්‍ය වෘත්තීයවේදීන් පහත් කෙරිණ. ගැටලු ගැන කතා කළ අය නොසලකා හැරිණ. නිදසුනක් වශයෙන් ආණ්ඩුවේ සහෝදර ඇමතිවරයෙකු ගැන කලකිරීමට පත් රාජ්‍ය ඇමතිවරයෙකුට චෝදනා එල්ල විය.[22] පවතින සැබෑ තත්වය හෙළි කිරීම, වැඩ අවුල් කිරීම සහ අභ්‍යන්තර ආරවුල් හෙළිවීම සීමා කිරීමට සියලු උත්සාහයන් ගත් අතර ඒ ගැන කතා කළ අය උදහසට ලක්වීමේ අනතුරක් තිබිණ.

සෞඛ්‍ය වෘත්තීයවේදීන් ගේ සහ මහජන සෞඛ්‍ය පිළිබඳ විශේෂඥයන්ගේ උපදෙස් නොසලකා හරින ලද අවස්ථා දක්නට ලැබුණ අතර 2021 අප්‍රේල් මස සංචරණ සීමා පැනවීමට දෙන ලද උපදෙස් නොසලකා හැරීම නිසා රෝගීන් සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ යෑම සහ මරණ අනුපාතයේ වැඩිවීමක් දක්නට ලැබිණ.[23] සෞඛ්‍ය ප්‍රජාව විසින් ගනු ලැබූ තීරණ පසුව නොසලකා හැරිණ. නැතිනම් ඉවත් කෙරිණ. මේ නිසා වාර්තා වූ රෝගීන්ගේ සංඛ්‍යාව වැඩි වීමෙන් පිළියන්දල ප්‍රදේශය හුදකලා කිරීමට ගත් තීරණය සමග ඇති වූ කලබලකාරී තත්වයත් සමග සමහර ප්‍රදේශවල හුදකලා කිරීම් ඉවත් කිරීමට සිදු විය.[24] සෞඛ්‍ය වෘත්තීය වේදීන්ගේ උපදෙස් නොතකා ප්‍රදේශයේ හුදකලා කිරීම ඉවත් කිරීමට එම ප්‍රදේශයේ සිටින ආණ්ඩුවේ ඇමතිවරයෙකු ඉල්ලා සිටි බව අනතුරුව වාර්තා විය. එය වසංගතයට මුහුණ දීමේ දේශපාලන ස්වභාවයට නිදසුනකි.

**ප්‍රතිකාර සහ එන්නත් කිරීම:** ප්‍රතිකාර කිරීමේ සහ එන්නත් කිරීමේ ආණ්ඩුවේ මූල පිරුමත් සමග ප්‍රතිපත්ති සහ සැලසුම් කිරීමේ සංගත ස්වභාවයක් නැති බව දක්නට ලැබිණ. විද්‍යාත්මක සාක්ෂි නොමැති වුවද, පිරිත් සජ්ඣායනය, ගංගාවලට මුට්ටි දැමීම, බෞද්ධ භික්ෂූන් හෙලිකොප්ටරවලින් ගොස් පිරිත් පැන් ඉසීම, කාර්යක්ෂමතාවය ගැන සහතික නොකළ බෙහෙත් වර්ග ප්‍රවර්ධනය කිරීම වැනි විද්‍යාත්මක නොවන ක්‍රියා මාර්ග ආණ්ඩුව විසින් යොදා ගන්නා ලදී. මේ බොහොමයක් සෞඛ්‍ය ඇමතිනිය ඇතුළත් ආණ්ඩුවේ මුල් පෙළ ඇමතිවරු දිරිමත් කළහ. ඇමතිවරිය මාධ්‍ය ඉදිරියේ දී එවැනි පැණියක් පානය කර ඉන් තමාට වයිරසයෙන් ආරක්ෂා වී සිටීමට හැකියැයි ප්‍රකාශ කළා ය. එහෙත් ඉන් දින කීපයකට පසුව ඇය ආසාදනය වී ඇති බව හෙළිවීම නිසා රෝහල් ගත කිරීමට සිදු විය.[25] මෙවැනි ක්‍රියාවන් තුළින් ආරක්ෂාව පිළිබඳව සාවද්‍ය හැඟීමක් ඇති කරවීමෙන් ජනතාව ශ්‍රී ලංකාව ගිල ගනිමින් තිබූ සැබෑ අර්බුදයෙන් බැහැරට යොමු කෙරිණ.

එන්නත අනුමත කිරීම සහ ලබා දීමේදී ද මෙවැනිම අවුල් සහගත තත්වයක් දක්නට ලැබිණ. එන්නත් ලබා ගැනීමේ දී ගෝලීය වශයෙන් අභියෝග තිබුණ නමුත් ආණ්ඩුව 2021 මුල් කාලයේ දී එන්නත් ලබා ගැනීමට ප්‍රමාණවත්ව සැලසුම් කිරීමට අපොහොසත් විය. ඇස්ට්‍රා සෙනෙකා එන්නත ලබා දීමේ වැඩ සටහන ආරම්භ වුවද පළමු මාත්‍රාව ලබා ගැනීමෙන් පසුව දෙවන මාත්‍රාව ලබා ගන්නේ කෙසේද යන්න ගැන ජනතාව දැනුවත් කර තිබුණේ නැත. එය කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ලබා ගත හැකිද යන්න ගැන තොරතුරු තිබුණේ ද නැත. සැලසුම් කිරීමක් නොමැතිවීම මෙන්ම ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු සහ දේශපාලනීකරණය පැහැදිවම දක්නට ලැබිණ. කොළඹ දිස්ත්‍රික්කයේ එන්නත් කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක වන විට රෝගය බෝවීමේ අනතුරක් ඇති කාර්ය මණ්ඩලවලට එන්නත ලබා

---

[21]භවානි ෆොන්සේකා ශ්‍රී ලංකාවේ වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ අපහසුවට පත් කරන සත්‍යය ; 5 නොවැම්බර් 2020 ග්‍රවුන්ඩ් වීව්ස් https://groundviews.org/2020/11/05/uncomfortable-truths-with-the-pandemic-response-in-sri-lanka/

[22]අරුණ ප්‍රනාන්දු ' රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ සිත් තැවුලෙන් සිටින්නේයැයි අමත්‍ය ජොන්ස්ටන් කියයි' 2021 මැයි 19 කලම්බු පෝස්ට් http://www.thecolombopost.net/en/topstories-en/76874/

[23]තවදුරටත් විශේෂඥ උපදෙස් නොතකා බලධාරීන් සංචාරකයන් සඳහා ගුවන් තොටුපොළ විවෘතව තබා ගැනීමෙන් ඉන්දියාවේ දිනකට දහස් ගණන් මිය යන අර්බුදකාරී විනාශයක් පැවතිය ද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සංචාරක 'බුබුලක්' පවත්වා ගැනිම එවැනි අවස්ථාවකි.

[24]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2021. *ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 වසංගතය පාලනයට නීතිමය රාමුව පිළිබඳ යාවත්කාලීන කිරීමක්.* විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. ප්‍රවේශ විය හැකි යොමුව: https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/

[25]සෞඛ්‍ය ඇමතිනිය වැඩි දුර ප්‍රතිකාර සඳහා අයිඩීඑච් දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කරයි. 2021 ජනවාරි 29 කලම්බුපේජ්: http://www.colombopage.com/archive.21A/Jan29-161190586ch.php

දීමේ හිඩැස් සහ වෙනත් අයට එන්නත ලබා දීමේ දී දේශපාලන බලපෑම යොදා ගන්නා ආකාරය පිළිබඳ මාධ්‍ය වාර්තා පළ විය.[26]

ආණ්ඩුව චීන සිනෝපාර්ම් එන්නත සහ රුසියානු ස්පුට්නික් එන්නත ඇතුළත් වෙනත් එන්නත් අනුමත කර ගැනීමට කඩි මුඩියේ සූදානම් වෙත්ම එන්නත් හිඟයක් වාර්තා විය. සෞඛ්‍ය රාජ්‍ය ඇමතිවරයා එන්නත් අනුමත කිරීමේ අධිකාරි බලය පැවරී ඇති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සාමාජිකයන් සිවු දෙනෙකු හිතුවක්කාර ලෙස ඉවත් කිරීම පිළිබඳ මාධ්‍යයේ වාර්තා විය. ඊට හේතුව වූයේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් භාවිතයට මෙතෙක් අනුමැති කර නැති සිනොපාර්ම් එන්නත එම අධිකාරියෙන් අනුමත කිරීම ප්‍රමාද කිරීම ය.[27] එහි ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරියේ සභාපති විරෝධය පළ කරමින් ඉල්ලා අස් වූයේය. අධිකාරියේ පාලන මණ්ඩලයට ආණ්ඩුවේ සැලසුම්වලට අනුගතව වැඩ කරන අය පත් කිරීමෙන් හිස් තැන් පුරවන ලද අතර සිනොපාම් එන්නත වහාම ක්‍රියාත්මක වන පරිදි අනුමත කෙරිණ.

එන්නත් ලබා දීමේ වැඩ පිළිවෙළ නිසි පරිදි සිදු නොවන බව දක්නට ලැබුණේ කාලීන භාවය සහ නිල පණිවුඩ පිළිබඳව පැවති ව්‍යාකූලතාවයෙනි. මෙය වඩාත් පැහැදිලි වූයේ වෙනත් සමහර අයට වඩා වරප්‍රසාද සහ දේශපාලන සම්බන්ධතා ඇති අයට විශේෂත්වයක් හිමි වීමෙනි.[28] ඉතිරිව තිබුණ ඇස්ට්‍රා සෙනෙකා සීමිත තොගවලින් දෙවන මාත්‍රාව ලබා දීමේ දීද එය දක්නට ලැබිණ. ආණ්ඩුවේ මිතුරන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයටත් දේශපාලන සම්බන්ධතා ඇති අයටත් එන්නත් ලබා දීමේ දී වැඩි සැලකිලි ලබා දීම, පන්සල්වල එන්නත් ලබා දීම හිතුවක්කාර ලෙස සිදු කිරීම සහ සංචරණ සීමා පැවතියදීත් සමහර අය එන්නත් ලබා ගැනීමට වෙනත් පළාත්වලට යෑම වැනි සිද්ධීන් සමාජ මාධ්‍යයේ පළ විය.[29]

අසහනයට පත් බොහෝ දෙනා ආණ්ඩුව සම්පූර්ණ ක්‍රියාවලියම නොසැලකිල්ලෙන් මෙහෙයවන්නේයැයි විවේචනය කළහ. මෙම නොසැලකිලිමත් භාවයේ ප්‍රතිඵලයක් වශයෙන් කලකිරීමට සහ කෝපයට පත් බොහෝ දෙනා එන්නත ලබා දීමේ ප්‍රමාදය, පරීක්ෂා කිරීමේ සහ නිරෝධායන ක්‍රියාවලියේ පවතින අවුල් වියවුල්, ඉහළ යන මරණ සංඛ්‍යාව සහ රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට නොහැකිවීම ගැන විවේචනය කිරීම ආණ්ඩුවේ ජනප්‍රියතාවයට බලපෑය. ආර්ථික අභියෝග සමනය කිරීම සඳහා තිරසාර සහායක් ලබා නොදුන් තත්වයක් යටතේ බොහෝ දෙනකු ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දීමෙන් තත්වය වඩාත් සංකූල විය.

**මූල්‍ය වගවීම**: කොවිඩ් 19 වසංගත තත්වයට මුහුණ දීමට ආධාර මුදල් ලබා ගැනීම සඳහා ඉටුකම අරමුදල පිහිටුවීමෙන් මූල්‍ය විනිවිද භාවය සහ වගවීම පිළිබඳ තවත් ගැටලු මතු විය. මෑතක පළ වූ මාධ්‍ය වාර්තා අනුව ඉටුකම අරමුදලට රුපියල් බිලියන 1.7ක ආධාර ලැබී තිබුණත් භාවිතයට ගෙන ඇත්තේ ඉන් සියයට 23ක් පමණි. එය ජනතා කෝපයට හේතු විය.[30] අරමුදල පිහිටුවීමේ දී රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ පුද්ගලයන් මහත් උද්‍යෝගයෙන් ඊට ප්‍රධානයන් ලබා දුන් නමුත් වසරක් ගත වුවද අරමුදල කළමනාකරණය කරන්නේ කෙසේද, ඒවා භාවිතා කළේ කෙසේද යන්න ගැන ප්‍රසිද්ධ කර ඇත්තේ තොරතුරු සීමිත ප්‍රමාණයකි. ඒ විවිධ අභියෝගවලට මුහුණ දී සිටි ශ්‍රී ලංකාවට වසංගත තත්වයට මුහුණ දීමට අවශ්‍ය කෙරෙන එන්නත් සහ උපකරණ මිලදී ගැනීමට අරමුදල් දැඩිව අවශ්‍යව තිබූ තත්වයක් තුළය. තොරතුරු ප්‍රසිද්ධියට පත් නොකිරීම සහ වසංගතයට මුහුණ දීමේ වැඩ සටහන් අවුල් කර ගැනීම නිසා පිළිතුරු නැති ප්‍රශ්න ගණනාවක් මතු විය.

---

[26]සිතාරා, ''බලය සහ සම්බන්ධතා? පෝලිමේ ඉදිරියට යන්න.'' 2021 මැයි 16 ග්‍රවුන්ඩ් වීව්ස් https://groudviews.org2021/05/16/powerful-and-connected-go-to-the-head-of-the-queue/

[27]කුමුදිනී හෙට්ටිආරච්චි, රුක්යියා ඕන් සහ මෙලීසා රත්නායක.,"දත්ත නොමැතිව චීන එන්නත ආනයනයට සැරසෙන විට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සාමාජිකයන් සිවු දෙනකු ඉවතට 2021 මාර්තු 14 සන්ඩේ ටයිම්ස් පුවත්පත; ප්‍රවේශ විය හැකි යොමුව:https://www.sundaytimes.lk/210314/news/amid-moves-to-import-chinese-vaccine-sans-data-four-nmra-board-members-sacked-436357.html

[28]ඉමේෂ් රණසිංහ මොරටුව එන්නත් කොල්ල කෑමේ උත්සාහය: ශ්‍රී ලංකා පොලිසිය නගරාධිපති අත් අඩංගුවට ගනී'' 2021 මැයි 28 ඉකොනොමි නෙක්ස්ට් https://economynext.com/moratuwa-vaccine-hijack-attempt-sri-lanka-police-arrest-mayor-82518/#modal-one

[29]චානක ජයසිංහ 'අභයාරාමයේ දී අනුමැතියකින් තොරව එන්නත් ලබා දීම: විහාරාධිපති ආණ්ඩුවට දොස් කියයි' 2021 මැයි ඉකොනොමි නෙක්ස්ට් https://economynext.com/abhayaramas-unsanctioned-vaccine-rollout-chief-incumbent-blames-sri-lanka-govt-82578/#modal-one

[30]සිලෝන් ටුඩේ, 2021. ඉටුකම කෝවිඩ්-19 අරමුදලේ ඉතිරිය. සිලෝන් ටුඩේ, 2021. [මාර්ගගත] මැයි මස 11 වන දින. ප්‍රවේශ විය හැකි යොමුව:
https://ceylontoday.lk/news/remaining-itukama-covid-19-fund-for

## වර්ධනය වන අසාර්ථකත්වය සහ පොරොන්දු අමතක කිරීම

2019 දී සහ 2020 දී ආණ්ඩුවේ ජනප්‍රියතාවය ආරක්ෂාව, ස්ථාවරත්වය, කාර්යක්ෂමතාවය සහ සෞභාග්‍යය යන මූලික ඡන්ද පොරොන්දු මත රඳා පැවති නමුත් මෙම මූලික පොරොන්දු බොහොමයක් ලබා දිය නොහැකිවීමත් සමග එය ''මැකී යන දර්ශනයක්'[31] බවට පත් වෙමින් තිබිණ. වසංගත තත්වයට ප්‍රතිචාර, දූෂණය පිළිබඳ චෝදනා, පාරිසරික සහ සමුද්‍ර ජීවිතයට වූ ආපදා සහ ආර්ථිකයේ කඩා වැටීම සමග ඇති වූ විවිධ පසුබෑම්වලට වෙනත් කරුණු අතර නොසැලකිල්ල සහ අදක්ෂතාවය යන සංකලනය සෘජුවම හේතු විය. එය පොරොන්දුවලින් බෙහෙවින්ම වෙනස් වූ තත්වයකි. මෙම අසාර්ථකත්වය සහ නොමනා කළමනාකරණය ජනතාව තුළ මුළාවෙන් මිදීම සහ කෝපය ඇති කළ බව පැහැදිවම දක්නට ලැබිණ.

කලින් තිබූ ආණ්ඩුව ගැන වූ විවේචනයක් සහ එහි අප්‍රසාදයට ලක්වීම සහ පිරිහීමට සෘජුවම හේතු වූයේ 'බැඳුම්කර වංචාව' සහ ඉන් ඇති වූ තත්වය යි. එවකට පැවති ඒකාබද්ධ විපක්ෂය ඒවා ආණ්ඩුව සහ එහි විශ්වසනීයත්වය ප්‍රශ්න කිරීමට යොදා ගත්තේය. පද්ධතියේ වෙනසක් ඇති කිරීමේ පොරොන්දු මත බලයට පැමිණිය ද මූල්‍ය වංචා සහ නොමනා කළමනාකරණයෙන් ගහන වූ මෙම ආණ්ඩුව අව්‍යාජ ආරක්ෂාවන් නොමැතිවීමෙන් රාජ්‍ය බලය ග්‍රහණය කර ගැනීම ප්‍රවේගවත් වීමත් සමග නව දූෂණ ඇතිවීමේ හැකියාව ගැන බියක් පවතී.[32] ඉන් විශාලතම වන්නේ වාර්තාවෙන ආකාරයට ආණ්ඩුවට රු. බිලියන 15.9ක පාඩුවක් සිදු වූ ''සීනි ආනයන වංචාව'' යි. එය ශ්‍රී ලංකාවේ මෑත වසරවල සිදු වූ විශාලතම වංචාවයි.[33]

නිසි උපදෙස් නොමැතිව ගත් තීරණ සහ ප්‍රතිපත්ති හදිසියේම වෙනස් කිරීමෙන් ඇතිවන අවිනිශ්චිත තත්වය ගැනත් ආණ්ඩුව බරපතළ විවේචනයට ලක්ව ඇත. මෑත උදාහරණයක් වන්නේ වසංගත තත්වය මැද මංත්‍රීන්ට සුඛෝපභෝගී වාහන ගෙන්වීමේ උත්සාහය යි. මෙම යෝජනාව ඉදිරිපත් වූ අවස්ථාව නිසාත් අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍ර ගණනාවක දැඩි මුදල් හිඟයත් පවතින වාතාවරණයක මෙවැනි යෝජනාවක් ඉදිරිපත්වීම ගැනත් සමාජ මාධ්‍යයේ දැඩි විවේචන එල්ල කෙරිණ.[34] අනෙක වන්නේ නිසි සූදානමක් නැතිව කාබනික පොහොර භාවිතය හඳුන්වා දීම සහ රසායනික පොහොර ආනයනය තහනම් කිරීමේ කඩිනම් තීරණයයි.[35] එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ දෙනකුගේ ජීවන මාර්ගයට බලපාන ආකාරයට පොහොර හිඟයක් පවතින බවත් ඉන් බොහෝ ගොවීන්ගේ ආර්ථික දුෂ්කරතා උත්සන්නව ඇති බවත් ගොවි සංවිධාන පවසන බව මාධ්‍ය වාර්තාවල පළ විය.[36] පරීක්ෂා කිරීමේ අඩුපාඩු සහ වසංගතය හමුවේ පැහැදිලි පුළුල් සැලැස්මක් නැතිව එන්නත් ලබා දීම දේශපාලනීයකරණය වීම ගැන ද මෙවැනිම විවේචන එල්ල විය. [37]

---

[31]අමීර් අලි ''ගෝඨාගේ මැකී යන දැක්ම සහ අසුභ පෙරනිමිති 2021 මැයි 21, කලම්බු ටෙලිග්‍රාෆ්; https://www.colombotelegraph.com/index.php/gotas-vanishing-vistas-worrying-prognosis/

[32]''තීරණ ගැනීමේ අවුල අවසන් විය යුතුයි.'' 2021 ජූනි 19. Daily FT; https://www.ft.lk/ft_view__editorial/Muddled-decision-making-must-end/58-719380

[33]සීනි වංචාවෙන් ශ්‍රී ලංකාවට රු. බිලියන 15.9ක පාඩුවක් මුදල් අමාත්‍යංශය 2021 ජූනි 19 ඉකොනොමි නෙක්ස්ට් ;https://economynext.com/sugar-scam-costs-sri-lanka-rs-15-9-billion-in-tax-revenue-finance-ministry-79636/#modal-one ජව්පෙ එය ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් කර ඇත.

[34]රු. බිලියන 3.6කට අධික පිරිවැයක් දරා මංත්‍රීන්ට සුඛෝපභෝගී වාහන ගෙන්වීමේ සූදානමක් 2021 මැයි 24 Newsfirst; https://www.newsfirst.lk/2021/05/24/preprations-to-import-luxury-vehicles-for-mps-at-a-cost-of-over-3-6-billion-rupees/

[35]ක්‍රිස් කමලේන්ද්‍රන් ''නැව් ආපසු හරවා යවයි. ආණ්ඩුව රසායනික පොහොර තහනම ක්‍රියාත්මක කරයි, 2021 මැයි 2. ධ සන්ඩේ ටයිම්ස්; https://www.sundaytimes.lk/210502/news/shipments-turned-away-govt-pushes-ahead-with-chemical-fertiliser-ban-442126.html

[36]රසායනික පොහොර හා පළිබෝධනාශක සඳහා ආනයන සීමා කිරීම් හේතුවෙන් විශාල ආර්ථික පාඩු පිළිබඳව ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික සංගමය අනතුරු අඟවයි "2021 මැයි 30. ද අයිලන්ඩ්; ප්‍රවේශ විය හැකි යොමුව:; https://island.lk/saea-warns-of-big-economic-losses-due-to-import-restrictions-on-chemical-fertilizers-and-pesticides/

[37]ෂසිකා බණ්ඩාර ශ්‍රී ලංකාව කොවිඩ් 19 සඳහා දීර්ඝ කාලීන උපාය මාර්ගයක් සම්පූර්ණයෙන් අමතක කර, 2021 ජූනි 21." ග්‍රවුන්ඩ් වීව්ස්;https://groundviews.org/2021/06/21/sri-lanka-is-alarmingly-overdue-for-a-long-term-strategy-for-covid-19/; කාංචනා ඇන් රුවන්පුර සමන්ති ගුණවර්ධන සහ බුද්ධිමා පද්මසිරි එන්නත් දීමේ අසමානතාවය සහ ඇඟලුම් අංශයේ සේවකයන්ට එහි බලපෑම, 2021 මැයි 22 ග්‍රවුන්ඩ් වීව්ස්; https://groundviews.org/2021/05/22/vaccine-inequality-and-the-cost-to-garment-sector-workers/

අතපසුවීම් පිළිබඳ ආණ්ඩුවේ දීර්ඝ ලැයිස්තුවේ අලුත්ම සිද්ධිය වන්නේ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ආපදාව ගැන කටයුතු කළ ආකාරය යි. මාධ්‍ය වාර්තාවල සඳහන් වන ආකාරයට රසායනික සහ වෙනත් ද්‍රව්‍ය රැගත් මෙම නෞකාවේ පැවති කාන්දුවක් නිසා ඉන්දියාව සහ කටාර් යන රටවල් දෙකම ඊට තම සාගර කලාපයට ඇතුළුවීමට ඉඩ දී නැත[38]. එහෙත් ශ්‍රී ලංකාව එම නැවට තම සාගර කලාපයට ඇතුළුවීමට ඉඩ දුන්නේය. කාන්දුව නිසා පසුව එම නැව සම්පූර්ණයෙන්ම ගිනිබත් වූ අතර මුහුදු ජීවීන්ට සහ පරිසරයට පෙර නොවූ විරූ හානියක් සිදු විය. රටවල් දෙකක්ම එම නැවට තම සාගර කලාපයට ඇතුළුවීමට අවසර දීම ප්‍රතික්ෂේප කළ තත්වයක් යටතේ කාන්දුවෙන් සිදු විය හැකි හානිය ගැන පැහැදිලි අවබෝධයක් නැතිව ආණ්ඩුව නැවට තම සාගර කලාපයට ඇතුළුවීමට අවසර දුන්නේ ඇයි ද යන්න ගැන දැන් ප්‍රශ්න මතුව ඇත. දැන් එම කරුණ විමර්ශනයට භාජනය වී ඇති අතර ක්‍රියාවලිය සහ ආණ්ඩුවේ වගකීම පිළිබඳව තවත් ප්‍රශ්න මතු වෙමින් පවතී. ගින්නෙන් සහ තෙල් කාන්දුවකින් ඇති විය හැකි සම්පූර්ණ හානිය මෙතෙක් දැන ගත නොහැකි වුවද ලැබී ඇති වාර්තා අනුව එය මුහුදු ජීවීන්ට සහ ජීවන මාර්ගවලට රුපියල් බිලියන සංඛ්‍යාවක් විය හැකි බරපතළ හානියේ බලපෑමත් සමග ශ්‍රී ලංකාවට සිදු වූ දරුණුතම පරිසර හානිය විය හැකිය.[39] මෙම විනාශය පරිසරය සහ ධීවර සහ සංචාරක කර්මාන්තයට දීර්ඝ කාලීන බලපෑම් ඇති කළ හැකි අතර මෙම කරුණ ගැන නොසැලකිල්ලෙන් කටයුතු කළ ආකාරය ගැන ආණ්ඩුවට සමාජ මාධ්‍යය තුළින් බරපතළ විවේචන එල්ල විය.

ආණ්ඩුවේ ජනප්‍රියතාවය පිරිහීමට හේතු විය හැක්කේ ආර්ථික අර්බුදය සහ පොරොන්දු වූ කාර්යක්ෂමතාවය, ස්ථාවරත්වය සහ සෞභාගයය ලබා දීමට අපොහොසත් විම ය. ආණ්ඩුව පොරොන්දු වූ සෞභාග්‍යයේ දැක්මෙන් ආයෝජකයන් තුළ විශ්වාසයක් ගොඩ නැගෙන කාර්යක්ෂම ක්‍රමයක් අදහස් කරන්නට ඇත. මෙම අදහස බැසිල් රාජපක්ෂගේ පහත දැක්වෙන ප්‍රකාශයෙන් පැහැදිලි වේ. ''මම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ව්‍යාපාරිකයන්ට හිතකර පරිසරයක් නිර්මාණය කරන බවට විශේෂයෙන් ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ට පණිවුඩයක් ලබා දෙන්නෙමි. එය දූෂණයෙන් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් සහ පාතාල කල්ලිවලින් තොර රටක් වනු ඇත. එය ආර්ථික පුනරුදයේ  සංවර්ධන දශකය වනු ඇත. එමනිසා කරුණාකර අප හා එක් වන්න. අප මහන්සි වී වැඩ කළ යුතුය.''[40]

අසාර්ථකවීමේ සහ නොසැලකිලිමත් වීමේ ලැයිස්තුව තාක්ෂණ තන්ත්‍ර ආණ්ඩුව අපූරු ලෙසට හෙළිදරවු කරයි. වියත් මග සහ එළිය කණ්ඩායම්වල සංකලනය හා හමුදාව, වෘත්තීය භාවය, කාර්යක්ෂමතාවය සහ ආයෝජකයන්ගේ සහ ව්‍යාපාරික ප්‍රජාවේ විශ්වාසය සහතික කරනු ඇතැයි අදහස් කෙරිණ. එය තවම සිදුව නැත. වසංගතයේ තුන් වැනි රැල්ල මතු වූ විට ක්‍රියා කළ ආකාරයත් අනෙකුත් ක්ෂේත්‍රවල දිගින් දිගටම වැඩ අවුල් කර ගැනිමත් සම්පූර්ණයෙන්ම කිසියම් වෙනස් දෙයක් පොරොන්දු වූ ආණ්ඩුවේ පාලනයේ සිදුරක් ඇති කරවයි.

අවධානයට ලක් වූ වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිචාරය යි. ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් වන ෆිට්ච් (FITCH) විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ශ්‍රේණි ගත කිරීම B- සිට CCC දක්වා පහත දැම්මේය. එය ණය ආපසු ගෙවීම සහතික කිරීමට විශ්වාස කටයුතු උපාය මාර්ගයක් සකස් කිරීමට ආණ්ඩුවට ඇති හැකියාව ගැන විශ්වාසය බිඳ වැටීමේ දර්ශකයෙකි.[41] පහත හෙළීම සිදු වූයේ ආණ්ඩුවේ 2021 අයවැය[42] ඉදිරිපත් කිරීමෙන් පසුව ය. ඉන් ශ්‍රී ලංකාවට විදේශ ප්‍රාග්ධන වෙළඳ පොළට පිවිසීමට ඇති හැකියාව බරපතළ සේ සීමා කරයි. දළ ජාතික

[38]“සාගරයට SOS ”2 ජූනි 2021.ඩේලි එෆ්ටී ; https://www.ft.lk/ft_view__editorial/SOS-for-the-ocean/58-718684

[39]රංග සිරිලාල් සහ ඇන්ඩ්‍රියස් ඉල්මර් පරිසර විනාශයක් කළ විෂ නැවː එක්ස්-ප්‍රස් පර්ල්. 2021 ජූනි 10. බීබීසී ප්‍රවෘත්ති; https://www.bbc.com/news/world-asia-57395693

[40]උදිත ජයසූරියː අපට තුනෙන් දෙකේ බහුතරයක් ලබා දිම ජනතාව සතු කාර්යක් -බැසිල් 2020 ජූලි 29. ඩේලි එෆ්ටී;https://www.ft.lk/opinion/Up-to-the-people-to-give-us-a-two-thirdsmajority-Basil/14-703809

[41]අය වැයට පසුව Fitch ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ශ්‍රේණි ගත කිරීම ‘CCC’ දක්වා පහත දමයි. 2020 නොවැම්බර් 27. ඉකොනොමි නෙක්ස්ට් ;https://economynext.com/fitch-downgrades-sri-lanka-sovereign-rating-to-ccc-after-budget-76360/#modal-one

“Fitch affirms Sri Lanka rating at CCC” 16 ජූනි 2021. ඩේලි එෆ්ටී;https://www.ft.lk/front-page/Fitch-affirms-Sri-Lanka-rating-at-CCC/44-719284

[42]ඉහත එම

නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් රටේ ණය ප්‍රමාණය දැනට සියයට 115ක මට්ටමේ පවතී.[43] විදේශ විනිමය සංචිත පුදුම සහගත පහත මට්ටමකට වැටී ඇත. අර්බුදය නතර කිරීමට ආනයන පාලන පැනවීමට සිදුව ඇත.[44] ආසන්න ගෙවුම් ශේෂ අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා ආණ්ඩුව චීනය, ඉන්දියාව සහ බංග්ලාදේශය වැනි රටවල් සමග ද්විපාර්ශ්වික මුදල් හුවමාරු (Swaps) ගැන බලාපොරොත්තු තබා ඇත.[45] කෙසේ වුවත් මෙම තාවකාලික විසඳුම් ගත් නමුත් බලවත් ව්‍යුහාත්මක ප්‍රශ්න නොවිසඳී පවත්නා තෙක් දීර්ඝ කාලීන ආර්ථික බලාපොරොත්තු අඳුරු සහගත ය.[46]

වැඩි දුරටත් ආණ්ඩුවේම ආධාරකරුවන්ගේ විරෝධය නිසා මූලික ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම ජනාධිපතිට තමන්ගේම හිතවත් කොටස් පාලනය කිරීමට ඇති නොහැකියාව ගැන කැපී පෙනෙන සලකුණකි. මෙය කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය වටා ගොඩ නැගුණු විරෝධතාවයන්ගෙන් දැක ගත හැකි විය. ආණ්ඩුවට සම්බන්ධ වෘත්තීය සමිතිවල විරෝධය නිසා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සහ ජපානය අතර ඇති කර ගත් එකඟතාවය බිඳ වැටිණ.[47] ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට, 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පෝර්ට් සිටි පනත වැනි පියවරට ආණ්ඩුවේම සමහර මිතුරු පාර්ශ්වයන් විසින් දිගින් දිගටම විවේචනාත්මක ස්ථාවර ගනු ලැබිණ. මෙවැනි විවේචන සහ අභියෝග නිසා ආණ්ඩුවට සංශෝධන ඉදිරිපත් කිරීමටත්, මහජන සම්බන්ධතා උත්සන්න කිරීමටත් එමනිසාම සම්මුතීන් ගණනාවක් ඇති කර ගැනිමටත් සිදු විය. නැගෙනහිර බහාලුම් පර්යන්තය සම්බන්ධයෙන් ගිවිසුම අවලංගු කිරීමට සිදු විය.

නොයෙකුත් අසාර්ථකවීම් බලධාරින්ට එරෙහිව සමාජ මාධ්‍ය වේදිකාවෙන් තියුණු විවේචන එල්ල කිරීමට හේතු විය. පහර දීමේ සහ අත් අඩංගුවට ගැනිමේ තර්ජන තිබුණ ද බොහෝ ශ්‍රී ලාංකිකයන්ගේ වැඩි වෙමින් පවතින කලකිරීම සහ කෝපය පිට කිරීම නව නිර්මාණශීලීත්වයකින් නොකඩවා සිදු වේ. ඒ සමහරක් ජනතාවගේ අසහනය සහ ආණ්ඩුව කෙරේ උත්සන්න වෙමින් පවතින අප්‍රසාදය ඉස්මතු කරමින් ජනාධිපති, අගමැති සහ රාජපක්ෂ පවුලේ අනෙකුත් අය ඉලක්ක කර ගනී. මර්දනය උත්සන්න වෙමින් පවතින තත්වයක් යටතේ වුවද විවේචනය කළ හැකි වීම, පලිගැනීමට ලක් වීමේ බියක් නැතිව රටවැසියන්ට ආණ්ඩුව විවේචනය සහ අභියෝග කිරීමට අවකාශයක් 2015-2019 සමයේ විවෘතවීම ඊට හේතු වූවා විය හැකිය.

## වගවීමක් නොමැතිවීම, මුක්තිය ශක්තිමත්වීම සහ දේශපාලන පලිගැනීම්

ප්‍රජාතන්ත්‍රවාදයේ පසුබැසීම ශ්‍රී ලංකාවේ මුල් බැස ගත් දූෂණය සහ මුක්තිය ආමන්ත්‍රණය කිරීමට ප්‍රයත්නයක් වූ ක්‍රියාවලීන් සහ ආයතන කෙරේ ද එල්ල වූ ප්‍රහාරයන් සේ දැකිය හැකිය. පසුගිය මාසවල

[43] 2021 දී ශ්‍රී ලංකාවේ ද.දේ.නි යට ණය අනුපාතය 115% දක්වා ඉහළ යයි. දරිද්‍රතාවය 10.9% ලෝක බැංකුව 2021 අප්‍රේල් 2. ඉකොනොමි නෙක්ස්ට් ;https://economynext.com/sri-lanka-debt-to-gdp-to-rise-to-115-pct-in-2021-poverty-10-9-pct-world-bank-80356/#modal-one

[44] ශ්‍රී ලංකාවේ ශුද්ධ විදේශ සංචිත, මුදල් සංචිත වලින් සියයට 33 දක්වා පහත වැටේ 2021 ජූනි 11. ඉකොනොමි නෙක්ස්ට් ;https://economynext.com/sri-lanka-net-forex-reserves-fall-to-33-pct-of-reserve-money-82874/#modal-one
ශ්‍රී ලංකාව ඉතිහාසයේ දරුණුතම විදේශ විනිමය අර්බුදයක. ආනයන සීමා පැනවේ. ඇමති කියයි. 28 මැයි 2020. ඉකොනොමි නෙක්ස්ට් ;https://economynext.com/sri-lanka-facing-biggest-forex-crisis-in-history-triggering-import-controls-minister-70431/#modal-one

[45] ශ්‍රී ලංකා මහ බැංකුව, ''ශ්‍රී ලංකාවේ මහ බැංකුව චීනයේ මහජන බැංකුව සමග ද්විපාර්ශ්වික මුදල් හුවමාරු කර ගැනීමේ ගිවිසුමකට'' 2021 මාර්තු 22. ප්‍රවේශ විය හැකි යොමුව; https://www.cbsl.gov.lk/en/node/9944
"Bangladesh Bank approves US$200mn currency swap for Sri Lanka: report" 25 මැයි 2021. ඉකොනොමි නෙක්ස්ට්;https://economynext.com/bangladesh-bank-approves-us200mn-currency-swap-for-sri-lanka-report-82351/#modal-one
ශ්‍රී ලංකාව ඉන්දියාවේ සංචිත බැංකුව සමග මුදල් හුවමාරුවකට ආපසු යයි 12 ජූනි 2021. ඩේලි නිවුස්;https://www.dailynews.lk/2021/06/12/local/251468/sri-lanka-reverts-foreign-currency-swap-rbi

[46] උමේෂ් මොරමුදලි 'ශ්‍රී ලංකාවේ විදේශ ණය අර්බුදය 2021 දී උග්‍ර විය හැකිය 2021 පෙබරවාරි 9. The Diplomat;https://thediplomat.com/2021/02/sri-lankas-foreign-debt-crisis-could-get-critical-in-2021/

[47] මීරා ශ්‍රීනිවාසන් ඉන්දියාව, ජපානය ශ්‍රී ලංකාවේ වෙනත් වරාය ව්‍යාපෘතියක 2021 මාර්තු 2. ද හින්දු ;https://www.thehindu.com/news/international/sri-lanka-now-clears-indian-investment-at-another-colombo-port-terminal/article33969407.ece

බරපතළ අවධානයට ලක් වූයේ සංකේතාත්මක නඩු සහ ප්‍රජාතන්ත්‍රවාදී නැඹුරුවක් ඇති සංශෝධන ඉවත් කිරීම වටා ගොඩ නැගුණු විරෝධය යි.[48]

'දේශපාලන පලිගැනිම්' යන්න දඩමීමා කර ගෙන විමර්ශකයන්, නීතිඥයන් සහ කලින් පැවති පාලන සමයේ ප්‍රධාන නඩු කීපයක් තැන වැඩ කටයුතු කළ අය ඉලක්ක කර ගනු දැකිය හැකිය. ඉන් කීප දෙනෙක් තම වෘත්තීමය සීමාවන් තුළ කරන ලද කාර්යන් වෙනුවෙන් අත් අඩංගුවට ගැනීමට සහ දඩයම් කිරීමට ලක් වූහ.[49] මෙම ක්ෂේත්‍රවල කරන ලද සීමිත වැඩ කොටස ඉවත දැමීම සහ දේශපාලන පලිගැනීම් මෙම සිද්ධීන් ගැන පරික්ෂා කිරීමට ජනාධිපති කොමිසන් සභා පත් කිරීමෙන් පෙනේ. මෙම ක්‍රියාවලිය ගැන ප්‍රශ්න ගණනාවක් මතු වූ අතර එහි හිතුවක්කාර නිගමන ගැන බරපතළ විවේචන එල්ල විය. එම නිගමන අභියෝග කරමින් අධිකරණයේ නඩු කීපයක් ද පවරා ඇත.[50] තවදුරටත් සමහර පුද්ගලයන්ට සිවිල් අශක්නුතා පැනවීමට කළ නිර්දේශය අනුව දැනට සේවයේ සිටින ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවෙතුගේ ප්‍රධානත්වයෙන් ඒ සඳහා විශේෂ ජනාධිපති කොමිසමක් පත් කර ඇති අතර එහි කාලය 2021 ඔක්තෝබර් දක්වා දිර්ඝ කර ඇත.[51]

දේශපාලන පලිගැනීම් සුජාත කිරීමේ ප්‍රයත්නයක් වශයෙක් අගමැති අධිකරණය ඉදිරියේ අපරාධ නඩු පවරා ඇති රාජපක්ෂ පවුලේ අය සහ ඔවුන්ගේ ආධාරකරුවන්ට එරෙහිව ඇති චෝදනා ඉවත් කර ගැනීමට යෝජනාවක් අප්‍රේල් 9 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙළේය.[52] මෙය බලතල වෙන් කිරීමේ කේන්ද්‍රයටම පහරක් වන ආකාරයට අධිකරණය ඉදිරියේ ඇති නඩු යටපත් කිරීමට පාර්ලිමේන්තුව යොදා ගැනීමට ආණ්ඩුව ගත් කම්පාවට පත් කෙරෙන තීරණයකි. එය බලයේ සිටින අය නීතියට ඉහළින් සිටින්නේය යන්න තහවුරු කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය යටපත් කිරීමට ගත් උත්සාහයකි. ''රාජපක්ෂ පාලනය යටතේ යුක්තියට සහ වගවීමට ඇති සියලු දොරවල් වසා අගුළු දමා ඇතැයි තිසරණී ගුණසේකර කියයි.[53] 2015-2019 සමයේ කරන ලද සීමිත වැඩ කොටස යටපත් කිරීමට විවිධ අංශවලින් ගත් ප්‍රයත්නය රාජපක්ෂ පවුලේ වුවමනාව සහ ශ්‍රී ලංකාවේ මුක්තිය තවදුරටත් තහවුරු කිරීමට ගත් බලවත් උත්සාහයකි.

අතීත කටයුතු ගැන සහ පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව පවතින අපැහැදිලිතාවය ගැන ප්‍රශ්න මතු කළ අයට දිගින් දිගටම පහර ගැසීම් සිදු විය. ආණ්ඩුවේ ආධාරකරුවෙකු වන අගරදගුරු මැල්කම් රංජිත් පසුගිය මාස කීපයේ දී ප්‍රහාරය ගැන වගකිව යුත්තන් හෙළි කිරීමට ප්‍රමාදවීම ගැන ප්‍රශ්න කෙළේය. ප්‍රහාරයේ දෙවන සංවත්සරයට පෙර එම ප්‍රහාරය ආගමික අන්තවාදයට වඩා දේශපාලනයේ ප්‍රතිඵලයක්යැයි කීවේය. ''පාස්ක ඉරිදා ප්‍රහාරය ආගමික උන්මාදය නිසා සිදු කළ එකක් නොව බලය අල්ලා ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ උත්සාහයක්යැයි'' ප්‍රකාශ කෙළේය.[54] පාස්කු ඉරිදා ප්‍රහාරය වටා ඇති අපැහැදිලිතාවය විශ්‍රාම යන නීතිපති කළ ප්‍රකාශයකින් වඩාත් ගැටලුකාරී තත්වයට පත් විය. ප්‍රහාරය පිටුපස ඇති අරමුණු ගැන ප්‍රශ්න මතු කරමින් ඔහු ප්‍රහාරය වටා ඇති මහා කුමන්ත්‍රණයක්

---

[48]හවානි ෆොන්සේකා, චාර්යා සමරකෝන් සහ කුෂ්මිලා රණසිංහ ''ශ්‍රී ලංකාවේ සංකේතාත්මක නඩු දහයක් දෙස ආපසු හැරී බැලීම: යුක්තිය මිරිඟුවක්ව පවතින්නේ ඇයි? 2021 ජනවාරි 20. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. ප්‍රවේශ විය හැකි යොමුව; https://www.cpalanka.org/revisiting-ten-emblematic-cases-in-sri-lanka-why-justice-remains-elusive/

[49]''ශ්‍රී ලංකාව: දේශපාලන පලිගැනීම් වාර්තාව ඉවත දමන්න''30 අප්‍රේල් 2021. Human Rights Watch; https://www.hrw.org/news/2021/04/30/sri-lanka-reject-political-victimization-findings

[50]හවානි ෆොන්සේකා, කුෂ්මිලා රණසිංහ සහ චර්යා සමරකෝන් ''ජනාධිපති පරීක්ෂණ කොමිසම සහ දේශපාලන පලිගැනීම් පිළිබඳ විශේෂ පරීක්ෂණ කොමිසම පිළිබඳ විවරණයක් 2021 අප්‍රේල් 21. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. ප්‍රවේශ විය හැකි යොමුව; https://www.cpalanka.org/a-commentary-on-the-pcoi-and-the-special-pcoi-on-political-victimization/

[51]ඉහත එම

[52]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, දේශපාලන වින්දිතයන් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගැන කෙටි සටහනක්. 2021 අප්‍රේල් 19 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. ප්‍රවේශ විය හැකි යොමුව; https://www.cpalanka.org/short-note-on-the-resolution-seeking-parliamentary-approval-to-implement-the-recommendations-of-the-coi-on-political-victimization/

[53]තිසරණී ගුණසේකර.,රාජපක්ෂ බල කඳවුරේ විලි රුදාව''2021 අප්‍රේල් 18 ග්‍රවුන්ඩ් වීව්ස්;https://groundviews.org/2021/04/18/birth-pangs-of-the-rajapaksa-satrapy/

[54]යොහාන් පෙරේරා ''පාස්කු ඉරිදා ප්‍රහාර ආගමික අන්තවාදයේ නොව දේශපාලන අන්තවාදයේ ප්‍රතිඵලයක්'' අගරදගුරු 2021 අප්‍රේල් 19 ඩේලි මිරර්; https://www.dailymirror.lk/front_page/Easter-Sunday-attacks-a-result-of-political-extremism-not-religious-extremism-Cardinal/238-210123

ගැන කතා කෙළේය[55]. 2019 පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ වාර්තාවෙන් ද මීට සමාන අදහස් දක්වා තිබිණ. ''පාස්කු ප්‍රහාර සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ සමහර ස්ථානවල දක්නට ලැබුණු වාර්ගික ප්‍රචණ්ඩත්වය මහජනයා අතර බිය සහ දේශපාලන නායකත්වය සහ ආරක්ෂක අංශ කෙරේ විවේචනය නව තලයකට පත් කෙරිණ. එය ආණ්ඩු වෙනසක් සඳහා ඉල්ලීම් මතු වූ කාලයකි. මෙය එකවරම සිදු වූවක් නොවේ. ඒ ගැන වැඩි දුරටත් විමර්ශනය කළ යුතුය. බුද්ධි අංශ යාන්ත්‍රණයේ සමහර කොටස්වල භූමිකාව සහ ආරක්ෂාව, මැතිවරණ ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකාවේ අනාගතය හැඩ ගැස්වීමට ගන්නා උත්සාහය අතිශයෙන් වැදගත් ප්‍රශ්නයි.''[56]

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව හට ගත් ප්‍රචණ්ඩ ක්‍රියා ගැන පරීක්ෂා කිරීමට සහ විමර්ශනය කිරීමට එවකට සිටි ජනාධිපති විසින් පත් කළ කොමිටියක්, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් සහ ජනාධිපති පරීක්ෂණ කොමිසමක් ආදි වශයෙන් මුල පිරුම් ගණනාවක්ම දක්නට ලැබිණ. ඊට අමතරව ද විමර්ශන සිදු විය. මෙම සියලු උත්සාහයන් තිබුණ ද සිද්ධියට වසර දෙකක් ගත වුවද, ප්‍රහාරයේ මහ මොළකරු කවුද යන්න ගැන නිරවුල් කිරීමක් හෝ වින්දිතයන්ට සත්‍යය දැන ගැනීමට අවස්ථාවක් හෝ යුක්තිය ලබා ගැනීමට නොහැකිව ඇත.

මෙය සිදුවන්නේ විවේචනය සහ විරෝධය නොඉවසන කාල සමයක ය. වසංගත තත්වය ගැන කටයුතු කළ ආකාරයේ පැවති අඩුපාඩු ආණ්ඩුවේම ආධාරකරුවන් ගේ විවේචනයට ලක් විය. එහෙත් ඒවා නොසලකා හරින ලද අතර විවේචකයන් හාස්‍යයට ලක් කොට ඔවුන්ගේ අදහස් නිසා තරවටු කරන ලදී. මෙවැනි විරෝධතාවයක් 20 වැනි සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේ දී සහ වඩාත් මෑතක පෝර්ට් සිටි විවාදයේ දී දක්නට ලැබිණ. මෙම කසුකුසු නැගුණේ ආණ්ඩුවේම මංත්‍රීන්ගෙන් සහ ඔවුන්ගේ ආධාරකරුවන්ගෙනි. විපක්ෂය, විවේචකයන්, සුළුතර කණ්ඩායම් සහ අභියෝග කිරීමට තරම් නිර්භීත වූ අනෙකුත් අය නොයෙකුත් මට්ටමේ කොන් කිරීම්වලට ලක් විය. නිදසුනක් වශයෙන් ජනාධිපති සහ පෝර්ට් සිටි පනත විවේචනය කළ පාර්ලිමේන්තු මංත්‍රී විජේදාස රාජපක්ෂට ජනාධිපතිගෙන් තියුණු වාග් ප්‍රහාරයක් එල්ල වූ බව වාර්තා විය.[57] අනෙකුත් විවේචකයන්ට ද හිරිහැර කිරීම්, තත්වයෙන් පහත දැමීම හෝ තර්ජනවලට මුහුණ දීමට සිදු විය. ජනාධිපතිගේ පණිවුඩය පැහැදිලි ය. ''අද අපට අවශ්‍ය වන්නේ සාධනීය දැක්මකින් රට වැසියන්ට සහාය ලබා දෙන, තමන්ගේ රටට ආදරය කරන, සමාජයට දායකත්වයක් ලබා දෙන සහ අසාධාරණ විවේචන ඉදිරිපත් නොකරන සහ අප මුහුණ දෙන ගැටලුවලට ප්‍රායෝගික විසඳුම් ලබා දෙන අයයි.[58]

[55]පාස්කු ප්‍රහාරය පිටුපස මහා කුමන්ත්‍රණයක් ශ්‍රී ලංකාවේ නීතිපති කියයි. 2021 මැයි 18 ඉකොනොමි නෙක්ස්ට්; https://economynext.com/sri-lanka-attorney-general-claims-grand-conspiracy-behind-easter-attack-report-82074/#

[56]2019 අප්‍රේල් 21 ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳව සොයා බැලීමට සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ වාර්තාව 2019 අප්‍රේල් 21, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව https://www.parliament.lk/featured-on-the-sri-lanka-parliament/1715-sc-report-april-attacks

[57]''ජනාධිපතිගෙන් තමාට තර්ජනාත්මක දුර කතන ඇමතුමක් ලැබුණ බව විජේදාස කියයි.''2021 අප්‍රේල් 16 ඉකොනොමි නෙක්ස්ට්; https://economynext.com/wijeyadasa-claims-he-received-threatening-phone-call-from-president-80824/

[58]2021 නිදහස් දින කතාව. ප්‍රවේශ විය හැකි යොමුව; https://www.president.gov.lk/independence-day-speech-2021/

# 2. හමුදාකරණය

නව ආණ්ඩුව යටතේ සිදු වූ ඉතාමත් වැදගත් සහ බියගැන්වෙන තත්වයක් වූයේ හමුදාකරණ ක්‍රියාවලියට ආපසු යෑමේ නිර්-ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය යි.

මෙම ක්‍රියාවලිය කොවිඩ් 19 පැතිර යෑම පටන් ගැනීමට පෙර සිටම පැවතිය ද වසංගත තත්වය එය ප්‍රවේගවත් කිරීමට සන්දර්භයක් විය. හමුදාකරණය හේතු යුක්ති කිරීමට ඉදිරිපත් කළ හේතු වූයේ වසංගත තත්වයට ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීමේ දී කාර්යක්ෂමතාවය වැඩි වීම සහ සුපිරි හැකියාවක් යන්නයි. මෙය හමුදාව සිවිල් පරිපාලනයේ අධීක්ෂණයට ලක් කිරීම, ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකවේ මෑත අතීතයේ පැවති අන්තර්-වාර්ගික අසමගිතාවය තුළ ප්‍රශ්න ගණනාවක් ඇති කිරීමට තුඩු දුන්නේය.

2019 නොවැම්බර් ගෝඨාභය රාජපක්ෂ තේරී පත්වීමත් සමග හමුදාකරණය සිදු වෙමින් පවතින බවට මාර්ග ගණනාවකින්ම දක්නට ලැබිණ. එය ප්‍රථමයෙන්ම සිදු වූයේ රජයේ ප්‍රධාන තනතුරුවලට හමුදාවේ සේවය කරන සහ විශ්‍රාම ගිය නිලධාරීන් පත් කිරීම තුළිනි.

## හමුදා පත්වීම් සහ හමුදාකරණය වූ ආයතන

නායකත්ව සහ පරිපාලන භූමිකා ගණනාවකම[59] හමුදා පත්වීම් කරනු ලැබිණ. කෘෂිකර්මයේ සිට අල්ලස් කොමිසම දක්වා විවිධ වූ ක්ෂේත්‍ර ගණනාවක සහ නොයෙකුත් රාජ්‍ය ආයතනවල නායකත්ව තනතුරු 39ක් දැනට හමුදා නිලධාරීන් විසින් උසුලනු ලැබේ. තවත් රාජ්‍ය ආයතන රාශියක බලවත් තනතුරු ගණනාවකට හමුදා නිලධාරීන් පත් කිරීමට අමතරව රාජ්‍ය යන්ත්‍රය සංවිධානමය ප්‍රතිව්‍යුහකරණය තුළ හමුදාකරණයක් සිදුවෙමින් පවතින බව දක්නට ලැබේ. වඩාත් සුවිශේෂීව රාජ්‍ය යාන්ත්‍රණයේ හමුදා පාලනය වැඩිවීම පොලීසිය සහ විදුලි සංදේශ නියාමන අධිකාරිය ඇතුළත් රාජ්‍ය ආයතන 31ක් ආරක්ෂක අමාත්‍යංශය යටතේ ගැසට් කිරීමෙන් දක්නට ලැබිණ.[60]

වත්මන් විශ්ව විද්‍යාල පනතින් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ පාලනයෙන් බැහැර සමාන්තර උසස් අධ්‍යාපන ව්‍යුහයක් ස්ථාපිත කිරීම අරමුණු කර ගත් ජනරාල් කොතලාවල ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාල (KNDU) පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හමුදාකරණය ව්‍යාප්ත කර ඇත.[61] එම පනතෙන් දැක්වෙන පරිදි විශ්ව විද්‍යාලය නම දෙනකුගෙන් යුත් මණ්ඩලයකින් පාලනය වන අතර උපරිම වශයෙන් සිවිල් වැසියන් සිවු දෙනකුට එහි සාමාජිකයන් විය හැකිය. කොතලාවල ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලය හමුදාවේ පමණක් නොව රටේ වෙනත් රාජ්‍ය නිලධාරීන්ගේ ද සුදුසුකම් නියම කරනු ඇත. මෙම පනත යටතේ පිහිටුවන ලද වෙනත් ආයතනවලින් ලබා දෙන පාඨ මාලා පිළිගැනීමේ හැකියාව ද විශ්ව විද්‍යාලයට ලබා දේ. ඒ අනුව හමුදාවෙන් පාලනය වන සමාන්තර අධ්‍යාපන ක්‍රමයක් රට තුළ නිර්මාණය කෙරෙන අතර එය සිවිල් වැසියන්ගේ කටයුතු කෙරේ හමුදා බලපෑම ව්‍යාප්ත කිරීමකි.

විශේෂයෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සමග දේශපාලන පක්ෂපාත භාවයක් පවත්වන හමුදාව සිවිල් පරිපාලනය කෙරේ දැනටමත් සැලකිය යුතු ග්‍රහණයක් හිමි කර ගෙන ඇති අතර ඉදිරියේ දී එය

[59]ඒකාබද්ධ පුවත් ප්‍රකාශයඃ පාලන මණ්ඩලයේ සිට සටන් බිමට ශ්‍රී ලංකාව හමුදාකරණය වීම 2021 ජනවාරි 19ඃ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජනමාධ්‍යවේදීන් (JDS); https://itjpsl.com/assets/press/ENGLISH-Battlefield-to-Boardroom-copy.pdf

[60]චාන්දනී කිරින්ද "31 institutions including Police, SIS, TRC brought under Defence Ministry purview" 12 December 2019. ඩේලි එෆ්ටී; https://www.ft.lk/front-page/31-institutions-including-Police-SIS-TRC-brought-under-Defence-Ministry-purview/44-691465

[61]https://ceylontoday.lk/news/gen-sir-john-kotelawala-national-defence-university-bill-why-it-s-a-bad-idea?fbclid=IwAR2NB3ABxsEoNIXyUMouVx840QeSKTKUbYWKRcJCdPcIHD8tlmB9D_f_n-s

වඩාත් වැඩිවනු ඇත. මෙම සම්බන්ධතාවය නිසා සිවිල් පරිපාලනය මත ඔවුන්ගේ බලපෑම වැඩිවීම විධායක බලතලවලම දිගුවකි. ජනාධිපති විසින් පවත්වා ගෙන යන නිලධාරි තන්ත්‍රයේ වැඩිවන බල පදනම මෙම ආණ්ඩුව යටතේ දක්නට ලැබුණු සමගාමීව සිදු වන විධායකය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය හා බැඳී පවතී.

## වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම හමුදාකරණය වීම

හමුදාව වසංගතයට ප්‍රතිචාර දැක්වීමේ සියලු මට්ටම්වලටම සම්බන්ධව සිටීමෙන් ඉහතින් දැක් වූ ආකාරයට කොවිඩ්-19 ට ප්‍රතිචාර දැක්වීම හමුදාකරණය වීමේ ප්‍රවණතා වඩාත් තීව්‍ර කරයි.

පළමුවෙන්ම හමුදාව, නිරෝධායන මධ්‍යස්ථාන ඉදි කිරීම සහ පවත්වා ගැනීම, වසා දැමීම් සහ සංචරණ සීමා ක්‍රියාත්මක කිරීම, හමුදා බුද්ධි අංශ යොදා ගෙන සම්බන්ධතා පැවැත් වූ පුද්ගලයන් සොයා යෑම, වෛද්‍ය යටිතල පහසුකම් ගොඩ නැගීම සහ සමහර එන්නත් කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගැනීම යනාදි වශයෙන් දැඩිවම සම්බන්ධව ඇත.[62]

හමුදාව වසංගත තත්වය පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පමණක් නොව මහජන සෞඛ්‍ය පියවර ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ද සම්බන්ධ විය. මෙය ජනරාල් ෂවේන්ද්‍ර සිල්වා NOCPCO ආයතනයේ ප්‍රධානි වශයෙන් පත් කිරීමට තෝරා ගැනීමෙන් පැහැදිලි ය.[63] දැනට සේවයේ සිටින සහ විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් 25ක් දිස්ත්‍රික්ක මට්ටමේ වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමට අදාල කටයුතු භාර ''ප්‍රධාන සම්බන්ධීකාරක''තනතුරුවලට තෝරා ගෙන ඇත.[64]

මෙම භූමිකාව තුළ මෙම නිලධාරීන්ට අදාල දිස්ත්‍රික්කවල වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ සියලු කරුණු පිළිබඳව අධිකාරි බලය හිමි වේ. මෙම නිලධාරීන්ගේ අධිකාරි බලය දිස්ත්‍රික්ක මට්ටමේ දැනටමත් ක්‍රියාත්මක වන පරිපාලන සහ දේශපාලන ධූරාවලිය හා ගැලපෙන්නේ කෙසේද යන්න පැහැදිලි නැත. කොවිඩ් 19 මෙම අවස්ථාවේ රටේ අවධානය යොමු වූ ප්‍රධානම කරුණ වී ඇති තත්වයක් යටතේ වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමට අදාල විය හැකි ඕනෑම ක්ෂේත්‍රයක මෙම ප්‍රධාන සම්බන්ධීකාරකයන්ට තම අධිකාරි බලය යෙදවීම සඳහා බලවත් දේශපාලන අනුග්‍රහයක් පවතී.

අවශ්‍ය කරන අත්දැකීම් සහ විශේෂඥතාවය ඇති සිවිල් සේවකයන් පසෙකට දැමීමත් සමග රාජ්‍ය යාන්ත්‍රණයේ වැදගත් සැලකිය යුතු ක්ෂේත්‍ර ගණනාවක්ම මේ ආකාරයට නිශ්චිත ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමක් නොමැති හමුදා නිලධාරීන් අතට පත් විය.

මෙම තත්වය වගවීම සහ හමුදාව සිවිල් වැසියන් ගේ අධීක්ෂණයට ලක්වීම පිළිබඳ ගැටලු ගණනාවක් මතු කරයි. විධායකය වඩාත් ශක්තිමත් වීම සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් පවතින නිසා හමුදාවේ අධීක්ෂණය වැඩි වශයෙන්ම සිදු වන්නේ ඒ හා ගැඹුරු බැඳීම් පවතින සහ පොදු පක්ෂ දේශපාලන වුවමනාවන් ඇති ආණ්ඩුවේ අංශ දෙකක සිටින එකම අය විසිනි.

ව්‍යුහාත්මක ප්‍රශ්නවලට අමතරව හමුදාවේ ආයතනික ස්වභාවය පිළිබඳව ද ගැට ලු මතු වේ. හමුදාව පිහිටුවා ඇත්තේ ජාතික ආරක්ෂාව පිළිබඳ නිශ්චිත කරුණු ගණනාවක් ගැන කටයුතු කිරීමට ය. හමුදාවේ පවතින නොයෙකුත් ආයතනික ලක්ෂණ ගොඩ නැගි ඇත්තේ එම කාර්ය සඳහා ය. එවැනි ලක්ෂණ වසංගත තත්වය හෝ වඩාත් පුළුල්ව මහජන ප්‍රතිපත්තියේ වෙනත් බොහෝ ක්ෂේත්‍රවල ගැටලු ගැන කටයුතු කිරීමට වඩාත් ගැලපෙන ඒවා නොවේ. ඒ සඳහා ම වූ ක්‍රමවේද සහ විශේෂඥ මණ්ඩල අවශ්‍ය ය. වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමේ දී හමුදාවේ මූලික භූමිකාව වූයේ එම තත්වය ආරක්ෂාවට ඇති තර්ජනයක් සේ හැඩ ගසා ගැනීම ය. ඒ ආකාරයේ ප්‍රශ්නයක් නිසා ප්‍රතිචාර දැක්වීමට

[62] මීරා ශ්‍රීනිවාසන් ''කොවිඩ් 19 ශ්‍රී ලංකාවේ හමුදාව වසංගතය හා සටන් කිරීමට උදවු දේ'' 15 අප්‍රේල් 2020. ද හින්දු;https://www.thehindu.com/news/international/covid-19-sri-lankan-military-is-helping-the-country-fight-the-pandemic/article31350778.ece

[63] ඉහත එම

[64] ''කොවිඩ් 19 පාලන කටයුතු සඳහා පත් කළ දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් මෙම සතියේ ස්වකීය වැඩ කටයුතු අරඹති.'' 2021 අප්‍රේල් 1. ශ්‍රී ලංකා යුධ හමුදාව; https://www.army.lk/news/district-coordinators-covid-19-control-work-commence-their-work

වඩාත්ම සුදුසු වන්නේ හමුදාව යි.[65] වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව ආරක්ෂාව පිළිබඳ කෝණයකින් සංකල්ප ගත කිරීම නිසා අහිතකර ප්‍රතිඵල ගණනාවක් ඇති වීමට හේතු විය.

මෙම තත්වය හමුදාව 2020 ඔක්තෝබර් 20 නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් නිරෝධායනයට යොමු කළ ආකාරයෙන් දක්නට ලැබිණ.[66]සේවකයන්ට සලකන ලද්දේ බලහත්කාරී අනවශ්‍ය ආකාරයේ ගැටුම් ඇති වන ආකාරයට ය. ඉතාමත් අයහපත් තත්වයක් පැවති නිරෝධායන මධ්‍යස්ථානයකට යැවීමට මගීන්ගෙන් පිරී ගිය බසයටකට ගොඩ කිරීමට පෙර ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් සකස් කර ගැනීමට ලබා දී ඇත්තේ විනාඩි පහක් දහයක් පමණි. ඔවුන් ගෙන යන්නේ කොතැනට ද යන්න ඔවුන්ට කියා නැත. පීසීආර් පරීක්ෂණ කිරීමක් හෝ මුව ආවරණ ලබා දීමක් නොවූ නිසා සෙනග පිරි තත්වයක් යටතේ කොවිඩ් ආසාදනය වීමේ අනතුරක් ද තිබිණ. සංචරණ සීමා කඩ කිරීම සම්බන්ධයෙන් මුස්ලිම් ජනතාව දණ ගසා සිටුවීමේ සිද්ධියකට ද හමුදාවේ නිලධාරීන්ගේ සම්බන්ධතාවයක් වාර්තා විය.[67]

මේවා හුදෙක් වරක් පමණක් වන සිද්ධීන් නොව හමුදාවේ ආයතනික ස්වභාවය ගැටුම් විසඳීමේ සමහර ආකාරයන්ට හිතකර වුවද තවත් විටෙක අනවශ්‍ය ආකාරයේ ගැටුම් ඇතිවීමට හෝ පරිපාලන කාලය සහ ශක්තිය අකාර්යක්ෂමව යොදා ගැනීමට ද හේතු විය හැකි ය.

නිදසුනක් වශයෙන් නිරෝධායන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට සහ ඒවා පිළිනොපදින අය අත් අඩංගුවට ගැනිමට හමුදාවේ ක්ෂණික විහිදුම් යතුරු පැදි ධාවක කණ්ඩායම (Army Quick Reaction Riders Team) යොදා ගැනීම මෙන්ම ගුවන් හමුදාවේ ඩ්‍රෝන යාත්‍රා යොදා ගැනීම මෙවැනි හමුදා මෙහෙයුම් පිළිබඳ අවස්ථා ය.[68] මෙම සෑම පියවරක්ම දඬුවම් දීමේ ආකාරයෙන් සහ වසා තැබීමේ රෙගුලාසි කඩ කරන්නන් අත් අඩංගුවට ගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන ලදී. වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමේ කාල සීමාවේ දී හමුදාවට සම්පත් වෙන් කිරීමත් හමුදා ක්‍රියාකාරකම් සඳහා පරිපාලන කාලය සහ ශක්තිය වැය කිරීමත් අවධානය සහ අරමුදල් වෙන් කළ යුතු අනෙකුත් ආයතන සහ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආවස්ථික පිරිවැයක් නිර්මාණය කෙරිණ. පෙර නොවූ විරූ මහජන සෞඛ්‍ය තත්වයක් පැවති වසරක් සහ දැඩි සත්කාර ඒකකවල ඇඳන් සහ වෙනත් වෛද්‍ය අවශ්‍යතා හිගයක් පැවතිය ද හමුදාවට බඳවා ගැනීම් නොකඩවා සිදු කිරීම සැලකිල්ලට ගත යුතු කාරණයකි.[69]

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයත් සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට එරෙහිව යුද අපාරාධ චෝදනා එල්ලවී තිබීමත් සමග රාජ්‍ය ව්‍යුහය තුළ හමුදා ශක්තිය වැඩි වීම ශ්‍රී ලංකා දේශපාලනයට තවත් බලපෑම් ඇති කරවයි. ආයතනයක් වශයෙන් හමුදාවේ ඕනෑ එපාකම් සහ වගවීම ඉල්ලා සිටින අය සෘජුවම ප්‍රතිවිරුද්ධ වන තත්වයකට ඉතිහාසය විසින් අප පත් කර ඇත.

රාජ්‍යය වැඩියෙන් හමුදාකරණයට ලක්වීම රාජ්‍යයේ වුවමනාවන් සහ බරපතළ අපහරණ ගැන චෝදනා එල්ල වී ඇති හමුදා නිලධාරීන්ගේ වුවමනාවන් සමග වඩාත් අනන්‍යවීමේ තත්වයකට තුඩු දී ඇත. එවැනි අපහරණ චෝදනා එල්ල වී ඇති සමහරු හමුදාව තුළ මෙන්ම පරිපාලන ධූරාවලියේ ඉහළ තැන්වලට පත්ව සිටිති. උතුර සහ නැගෙනහිර හමුදාකරණය වැඩි කිරීමෙන් අදහස් වන්නේ පාලනය

---

[65]''කොවිඩ් 19 වසංගතයට හමුදා ප්‍රතිචාරයක්' 2020 ඔක්තෝබර් 20 ආරක්ෂක අමාත්‍යංශය' http://www.defence.lk/Article/view_article/2463?fbclid=IwAR2KZ0FHQt6VQnfWNUhebfg4dtxABatALrNQ8tTaaRJTk5ZFlqRtETfGW5A

[66]බෝරාම් ජන්ග් ''ශ්‍රී ලංකාව: අවදානම් සහිත කණ්ඩායම් කොවිඩ් 19 ප්‍රතිචාරය හමුදාකරණයේ මිල ගෙවිය යුතුයි''2020 ඔක්තෝබර් 27. ඩේලි එෆ්ටී;https://www.ft.lk/opinion/Sri-Lanka-Vulnerable-groups-pay-the-price-for-militarisation-of-COVID-19-response/14-708073

[67]මීරා ශ්‍රීනිවාසන් ''ශ්‍රී ලකාව මුස්ලිම් ආගමිකයන්ට එල්ල කළ හමුදා ප්‍රහාරය සහ අවමන් කිරීම පරික්ෂා කිරීමට යයි.'' 2021 ජූනි 20.ද හින්දු ;https://www.thehindu.com/news/international/sri-lanka-to-probe-army-attack-and-humiliation-of-muslims/article34871262.ece

[68]''ශ්‍රී ලංකා යුද හමුදාවේ යතුරු පැදි බලකාය විසින් වයිරසය පැතිරීම වැළැක්වීමට පොලිසියේ සහායට 2021 මැයි 29'' ආරක්ෂක අමාත්‍යංශය; https://www.defence.lk/Article/view_article/3505
සුල්ෆික් ෆර්සාන් "කොවිඩ්-19 වසංගත පාලන ව්‍යාපෘති සඳහා යුද හමුදාවට ඩ්‍රෝන් කැමරාව පරිත්‍යාග බරන ලදි" 2020 අප්‍රේල් 15. නිවුස් ෆස්ට්;https://www.newsfirst.lk/2020/04/15/drone-camera-donated-to-the-army-for-its-covid-19-control-projects/

[69]''තරුණයන් හමුදාවට බඳවා ගැනීම ඇරඹේ: ඵලදායි සහ වෘත්තීය හමුදා භටයන් වශයෙන් අප හා එක්වන්න.'' 2021 ජනවාරි 24' ශ්‍රී ලංකා යුධ හමුදාව;https://www.army.lk/news/youth-recruitment-drive-begins-join-us-productive-professional-army-soldiers

සහ අත්‍යවශ්‍ය සෞඛ්‍ය කාර්යන් හසුරවන්නේ ඔවුන් පාලනය කරන ප්‍රජාවට එරෙහිව අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ආයතනයක් වීම ය.[70]

ඊට අමතරව ආශ්‍රිතයන් සෙවීමට හමුදාව සම්බන්ධ කර ගැනීමෙන් හමුදාවේ සෝදිසි කිරීමේ යටිතල පහසුකම් හේතු යුක්ති කිරීමට සහ වර්ධනයට ඉඩ ලැබිණ. මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නන්, සුළුතරය සහ ආණ්ඩුවේ විවේචකයන් බිය ගැන්වීම සඳහා සෝදිසියට ලක් කිරීමේ සන්දර්භයක් තුළ සෝදිසි කිරීම සාමාන්‍යකරණය සහ හේතු යුක්ති කිරීම කනස්සල්ලට හේතු වන ප්‍රවනතාවයකි.

## හමුදාකරණය මතවාදී වශයෙන් හේතු යුක්ති කිරීම

මෙම ආණ්ඩුව යටතේ හමුදාකරණය හේතු යුක්ති කිරීම එකිනෙකට වෙනස් එහෙත් ඌණපූරක ගමන් මාර්ග දෙකක් ගත්තේය. එකක් වන්නේ හමුදාව 'අව්‍යාජ මිනිසුන්ගේ' ආයතනයක් ලෙස හුවා දැක්වීමය. දෙවැන්න හමුදාව අලස සහ අක්‍රීය නිලධාරි තන්ත්‍රයට කාර්යක්ෂමතාවය ගෙන දෙන සහ ඵලදායී තාක්ෂණ තාන්ත්‍රීය ක්‍රියාකාරිකයෙකු ලෙස දැක්වීම යි.

පහසුවෙන් ළඟාවිය නොහැකි සහ දූෂිත ස්ථාපිත නිලධාරි තන්ත්‍රය සහ දේශපාලකයන්ට වඩා හමුදාව අව්‍යාජ ජනතා නියෝජිතයන් වශයෙන් පිළිගැනීමක් විය. ඇත්තෙන්ම වැඩි වශයෙන්ම පොදුජන පෙරමුණේ ඡන්ද පදනම වූ සිංහලයන් අතර රටේ වෙනත් දේශපාලන ආයතන හා සැසඳීමේ දී හමුදාව කෙරේ එක්තරා මට්ටමක මහජන විශ්වාසයක් පවතී. සෝෂල් ඉන්ඩිකේටර් 2019 දී සිංහල ප්‍රජාව අතර පවත්වන ලද මහජන අදහස් විමසීමක දී ඔවුන් අනෙකුත් මූලික රාජ්‍ය ක්‍රියාකාරීන්ට වඩා හමුදාව කෙරේ විශ්වාසය රඳවා ඇති බව හෙළි විය. හමුදාව කෙරේ වූ විශ්වාසය සියයට 91.4ක් වූ අතර දේශපාලන පක්ෂ කෙරේ වූ විශ්වාසය සියයට 16.7 කි.[71]

හමුදාව නැගෙනහිර පළාතේ සේවා නියුක්තියෙන් සියයට 23ක් සපයන තත්වයන් යටතේ හමුදාව ජනතාවාදී ආයතනක් ලෙස දැකීමට අඩ වශයෙන් හෝ ආර්ථික පදනමක් ද පවතී. විරැකියාව ඉතා ඉහළ මට්ටමක පවතින ජනවිද්‍යාත්මක තත්වයක් යටතේ හමුදාව මූලික ආදයම් මාර්ගයක් වී ඇත. ද්වීතීක අධ්‍යාපනය නිම කළ ද වැඩි දුර අධ්‍යාපනයක් නොමැති ජන සංඛ්‍යාවේ කොටස සැලකිල්ලට ගැනීමේ දී විරැකියා අනුපාතය ඉතා ඉහළ මට්ටමක පවතින අතර සියලු සේවා නියුක්තියෙන් සියයට 17ක් සැපයෙන්නේ හමුදාවෙනි.[72] වයස 18-25ත් අතර සිංහල ජන කොටස් සැලකිල්ලට ගැනීමේ දී ඉන් හරි අඩක්ම ඉහතින් සඳහන් කළ විස්තරයට ගැලපේ.[73] පුද්ගලික අංශය හෝ සිවිල් රාජ්‍ය අංශයේ රැකියා ලබා ගැනීම දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල හමුදාව සුරක්ෂිත සහ බෙහෙවින්ම අවශ්‍ය වූ ආදායම් මාර්ගයක් ලබා දේ. හමුදාවට සුළුතර කොටස්වලින් බඳවා ගැනීමේ දැඩි ප්‍රයත්නයක් පවතින නිසා සහ සිවිල් ආරක්ෂක බලකාය පුළුල් කිරීම නිසාත් සුළුතර ප්‍රජාව තුළ ද සමාන වූ ගතිකත්වයක් නිර්මාණය කිරීමේ ප්‍රයත්නයක් දැකිය හැකිය.

හමුදාකරණයට සහාය දැක්වෙන අනෙකුත් ප්‍රධාන කතිකාව වන්නේ හමුදාව ආයතනයක් ලෙස කාර්යක්ෂම වන්නේය යන්නයි. හමුදාව පරිපාලනයේ සහ මහජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී නොවැනෙනසුලු පිවිසුමක් ගන්නේය යන්න ද පතුරුවා හැර ඇති අදහසකි. මෙම අදහස විශේෂයෙන්ම ප්‍රකාශයට පත් වූයේ කොවිඩ් 19ට ප්‍රතිචාර දැක්වීමේ දීය. මුල්දී සාර්ථක වසංගත ප්‍රතිචාරයක් ලෙස හැඳින් වූ හමුදාවේ දායකත්වය පැසසුමට ලක් විය. එහෙත් අප දැනට මුහුණ දෙමින් සිටින මහජන සෞඛ්‍ය අර්බුදයෙන් පැහැදිලි වන ආකාරයට වසංගත තත්වයට මුහුණ දීමේ මෙම කතිකාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිත බව පෙනේ.

---

[70]ප්‍රතිපත්ති සමීක්ෂණය සඳහා වූ අඩයාලම් කේන්ද්‍රය (ACPR)., ''ශ්‍රී ලංකාවේ හමුදාකරණය වූ ප්‍රතිචාරය මානව අයිතිවාසිකම්වලට බලවත් තර්ජනයක්'' 2020 අප්‍රේල් 30. ප්‍රවේශ විය හැකි යොමුව; ප්‍රතිපත්ති සමීක්ෂණය සඳහා වූ අඩයාලම් කේන්ද්‍රය; http://adayaalam.org/situation-brief-no-3-covid-19-sri-lankas-militarised-response-poses-grave-threats-to-human-rights/

[71]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - Social Indicator- වසර 70ක නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අගයන් සහ ආකල්ප පිළිබඳ සමීක්ෂණය - https://www.cpalanka.org/wp-content/uploads/2019/02/70-Years-of-Independence-Survey-Report-Social-Indicator.pdf

[72]'ශ්‍රී ලංකාවේ ජාතිවාදය, සංවර්ධනය සහ වාර්ගික ගැටුම' (Venugopal, 2018:113)

[73]ඉහත එම

කෙසේ වුවත් හමුදාවේ කාර්යක්ෂමතාවය පිළිබඳ මෙම කතිකාව වඩාත් පොදුවේ හේතු යුක්ති කළ නොහැකි බවට සාධක දක්නට ඇත. සන්නද්ධ හමුදා පිළිබඳ 2019 විගනකාධිපතිගේ වාර්තාවෙන් මහජන අරමුදල් නාස්තිය සහ නො මනා කළමනාකරණය පිළිබඳ අවස්ථා කීපයක්ම හෙළි කිරීමෙන් මෙම කතිකාව පිළිබඳව සැක මතු කරයි.[74] වැඩි කාර්යක්ෂමතාවය පදනම් කර ගත් හමුදාකරණය පිළිබඳ මෙම හේතු යුක්ති කිරීම් දේශපාලන ක්‍රියාවලිය දුර්වල වෙත්ම වඩාත් හීන වන බව දැකිය හැකිය.

## ඉඩම් සහ හමුදාකරණය

රට තුළ ඇති හමුදාකරණ ක්‍රියාවලිය තේරුම් ගැනීමට හමුදාව විශේෂයෙන්ම උතුර සහ නැගෙනහිර ඉඩම් අයිතිය සම්බන්ධයෙන් ඉටු කරන භූමිකාව තේරුම් ගත යුතුය. මෙම වාර්තාවෙන් තවදුරටත් විමසා බලන ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කාරණය සංහිඳියාව ඇති කිරීමේ සන්දර්භයේ දී වැදගත් මාතෘකාවකි. එහි දී ඉඩම්වල අයිතිය පිළිබඳව අභියෝග කරන ප්‍රධාන ක්‍රියාකාරිකයෙකු වන්නේ හමුදාව යි.

කෘෂිකර්මය, සංවර්ධනය සහ සංහිඳියාව ඇතුළත් ශ්‍රී ලංකාවේ පාලනයේ ක්ෂේත්‍ර ගණනාවක හමුදාකරණය වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීම බලවත් වීමත් සමග ආරක්ෂක හමුදා විසින් අත්පත් කර ගෙන ඇති ඉඩම් ඒවායේ නීත්‍යානුකූල අයිතිකරුවන්ට ආපසු භාර දීම, 2019 නොවැම්බර් මස සිට නතර කර දමා ඇත. ආරක්ෂක හමුදා විසින් විශාල ඉඩම් ප්‍රමාණයක් දිගටම අත්පත් කර ගෙන සිටීම ජනතාව අවතැන් කිරීමට හේතුවක් වන අතරම දරිද්‍රතාවය උග්‍ර කරවීමක් ද වේ. ප්‍රදේශ කීපයකම හමුදාව ගොවිබිම් සහ සංචාරක කර්මාන්තය සඳහා මෙම ඉඩම් යොදා ගැනීමෙන් හමුදාවට ආදායම් උපදවන නමුත් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවෝ විධිමත් ආදායමක් ලබා ගැනීමට නොහැකිව සිටිති. පසුගිය මාසවල 'ජාතික ආරක්ෂාව' තර කිරීම සහ රැඩිකල් කොටස් ඉවත් කිරීමේ මුවාවෙන් නව හමුදා කඳවුරු ඉදි කළ අතර ඒවා සුළුතර ජන කොටස් සහ ආණ්ඩුවේ විවේචකයන් ඉලක්ක කර ගැනීමට යොදා ගනු ඇතැයි බියක් පවතී.[75]

ත්‍රිවිධ හමුදාව (ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව) තම හමුදා කඳවුරු සඳහා උතුරු නැගෙනහිර විශාල ඉඩම් ප්‍රමාණයක් තවමත් අත්පත් කර ගෙන සිටී. අවස්ථා කීපයකදීම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නීති ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර සමහර ඒවා අධිකරණයේ අභියෝගයට ද ලක්ව ඇත. 2015-2019 කාල සීමාවේ දී යාපනයේ සහ ත්‍රිකුණාමලයේ සමහර ප්‍රදේශවල ඉඩම් ඒවායේ නීත්‍යානුකූල අයිතිකරුවන්ට ලබා දී ඇති නමුත් තවත් ඉඩම් විශාල ප්‍රමාණයක් ආරක්ෂක හමුදා භාරයේම පවතී. හිමිකරුවන්ට ඒවාට යෑමට හෝ හිමිකම ලබා ගැනීමට හෝ ඇති ඉඩකඩ බෙහෙවින් සීමිත ය. අත්පත් කර ගෙන සිටින ස්ථාන කීපයකම නිවාස සහ ආගමික ස්ථාන ඇතුළත් ගොඩනැගිලි විනාශ කර ඇති අතර ඒවාට වන්දි ගෙවීම ඇතුළත් හානිපූරණ ලබා දීමට උත්සාහයක් ගෙන නැත.

ඉඩම් අත්පත් කර ගැනීම වැඩි වශයෙන් සිදුව ඇත්තේ යුද්ධය පැවති සමයේ වලිකාමම් වැනි අධි ආරක්ෂක කලාප තුළය. එහෙත් වෙනත් ප්‍රදේශවල යුද්ධයෙන් පසුව ද ඉඩම් අත්පත් කර ගෙන ඇත. මෙසේ අත්පත් කර ගෙන ඇත්තේ කෙප්පපිලවු, සිලාවතුර, මුලිකුළම්, පානම සහ තවත් ප්‍රදේශ කීපයක ය. මෙම ස්ථාන වසර ගණනාවක් තිස්සේ විරෝධතා, ප්‍රචාරක ව්‍යාපාර සහ සමහර අවස්ථාවල අධිකරණය ඉදිරියේ නීතිමය අභියෝග කිරීම් ඇතුළත්ව ප්‍රජා උද්සෝෂණ සහ අභියෝග කිරීම්වලට ලක් වූ ඒවාය. ඉඩම් අත්පත් කිරීමෙන් සියලුම ප්‍රජාවන් බලපෑම්වලට ලක් වුවද මුස්ලිම් සහ දෙමළ ප්‍රජාවන් වැඩියෙන්ම බලපෑමට ලක්ව ඇත.

තවත් සමහර ස්ථානවල ඉඩම් අත්පත් කර ගැනීමට විවිධ කොටස් සම්බන්ධව ඇත. නිදසුනක් වශයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ පානම ඉඩම් ගැටලුවලට නාවික හමුදාව සහ ගුවන් හමුදාව මෙන්ම දේශපාලකයන් ද සම්බන්ධව ඇති අතර ඉන් වැඩියෙන්ම බලපෑමට ලක්ව ඇත්තේ සිංහලයන් ය. වසර ගණනාවක් තිස්සේ පැවති උද්සෝෂණ නිසා සමහර ප්‍රදේශ නිදහස් කළ ද එම ඉඩම්වලට යෑමේ දී සහ භාවිතා කිරීමේ දී ප්‍රදේශයේ ජනතාව තවමත් අභියෝගවලට මුහුණ දෙති. උතුරේ ද මෙවැනිම

[74]ශ්‍රී ලංකා හමුදාව http://www.auditorgeneral.gov.lk/web/images/audit-reports/upload/2019/mindept_19/1-X/Head222SriLankaArmyE.pdf

[75]නව හමුදා කඳවුරු පිහිටුවීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ 2021 මාර්තු 13 වැනි දින හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත් වූ ඔහුගේ කතාවේ දී සඳහන් කෙළේය.

අත්පත් කර ගැනීමේ ප්‍රවනතා සහ ප්‍රජා උද්ඝෝෂණ දක්නට ලැබිණ. මුලතිවු දිස්ත්‍රික්කයේ මෙන්ම මන්නාරම් දිස්ත්‍රික්කයේ ද ස්ථාන කීපයක[76] ඉඩම් අත්පත් කර ගැනීම් සහ විරෝධතා දක්නට ලැබිණ. නිදසුනක් වශයෙන් සිලාවතුරේ හි මුස්ලිම් ඉඩම් හිමියන්ට අයත් අක්කර 42ක් නාවික හමුදාව අත්පත් කර ගෙන ඇත. මුස්ලිම් පවුල්වලට අයත් මෙම ඉඩම්වලින් ඔවුන් 1990 දී එල්ටීටීඊය විසින් පලවා හරින ලද අතර ඔවුන් අවතැන්ව පුත්තලමේ ජීවත් වූහ. ප්‍රජාවගේ උද්ඝෝෂණ නිසා සමහර ඉඩම් කොටස් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ලැබුණ අතර තවත් ඉඩම් කොටස් ආරක්ෂක කටයුතු සඳහා අවශ්‍යයැයි නාවික හමුදාව පවසා ඇත. මුල්ලිකුළම් 2007 සිට නාවික හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගෙන ඇති මන්නාරමේ තවත් ස්ථානයකි. වයඹ නාවික අණ දෙන මූලස්ථානය එහි ඉදි කර ඇති අතර ආරක්ෂක කටයුතු සඳහා එම කඳවුර පවත්වා ගත යුතුයැයි නාවික හමුදාව කියයි. අක්කර 1500ක පමණ ප්‍රදේශයක පැතිර ඇති එම ගමේ පවුල් 400ක් පමණ ජීවත් වූහ. නැවතත් උද්ඝෝෂණය කිරීම නිසා ඉඩම් ප්‍රමාණයක් නිදහස් කළ නමුත් නාවික හමුදාව එම ප්‍රදේශයේ තවත් ඉඩම් අත්පත් කර ගෙන සිටී.

හමුදා කඳවුරු සඳහා විශාල ඉඩම් අත්පත් කර ගැනීමට අමතරව ආරක්ෂක හමුදා උතුරු හා නැගෙනහිර කුඩා ඉඩම් කැබලි ද යොදා ගනී. ගොවිබිම් පවත්වා ගැනීම, යාපනයේ තල්සෙවන, අම්පාර පානම කලපුවේ කබානා ඉදි කිරීම සහ ත්‍රිකුණාමලය ගෝල්ෆ් පිට්ටනිය වැනි ආදායම් උපදවන ව්‍යාපාරික කටයුතු සඳහා විශාල ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගෙන ඇත. මෙම වානිජ ව්‍යාපාර හමුදාව විසින් පවත්වා ගෙන එන අතර ප්‍රදේශයේ ජනතාවට එම ඉඩම් පාවිච්චි කිරීමට නොහැකි ය. මෙවැනි ව්‍යාපාරවලින් ආදායමක් උපදවා ගන්නා නමුත් වගවීම පිළිබඳ ප්‍රශ්න මතු කරයි.

හමුදාව මෙවැනි අංශවල තවදුරටත් විවිධාංගකරණය කිරීමේ උත්සාහය 2021 දී ශ්‍රී ලංකා යුද හමුදාව යටතේ 'කෘෂිකර්ම සහ පශු සම්පත් සේනාංකයක්' පිහිටුවීමෙන් දැකිය හැකිය.[77] එමගින් කෘෂිකර්මාන්තය වැනි වෙනත් අංශ පවා හමුදාකරණයට ලක් කිරීමේ අවදානමත් මතු කරවයි. ඉන් හමුදාව සිවිල් කාර්යන් තුළට කා වැදීම තවත් තීව්‍ර කරන්නේයැයි බියක් හට ගනී. මෙය සිදු වන්නේ ආරක්ෂක ආයතන තුළ (හමුදා කාර්යන් සහ ආදායම් උපදවන ක්‍රම ගැන වගවීමක් නොමැතිවීම ඇතුළත්) කාර්යක්ෂම අධීක්ෂණයක් නොමැති සන්දර්භයක් තුළ ය. ප්‍රාදේශීය ගොවීන්ට හොඳින් සම්පත් ඇති හමුදා ගොවිපොළ සමග තරග කිරීමට සිදුව ඇති නිසා තරගකාරිත්වය පිළිබඳ ප්‍රශ්න ද මතුව ඇත.

ශ්‍රී ලංකාවේ හමුදාකරණය ජාතික ආරක්ෂාව යන්නෙන් හඳුන්වන තත්වයෙන් ඔබ්බට ගොස් පශ්චාත් යුද වසර තුළ හමුදාව විශාල භූමි ප්‍රදේශ අත්පත් කර ගනිමින් නව ව්‍යාපාරවලට පිවිසීම හේතු යුක්ති කරයි. කෘෂිකර්මය සහ සංචාරක කර්මාන්තය ඇතුළු ආදායම් උපදවන ආර්ථික ව්‍යාපාර ගණනාවකට පිවිසීමෙන් ආරක්ෂක හමුදා ඉඩම්, ආරක්ෂාව පිළිබඳ කටයුතු වලට වඩා ආදායම් ඉපිදවීමට යොමුව ඇත. මෙය සිදු වන්නේ හමුදාව ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් හා ජීවන මාර්ග අත්පත් කර ගෙන ඒවායේ ඵල ප්‍රයෝජන භුක්ති විඳින තත්වයක් යටතේය. ඉඩම්වලින් උපදවන ආදායම්වලට සිදු වන්නේ කුමක්ද යන්න ගැන ඇති සීමිත තොරතුරු නිසා වගවීම සහ පාරදෘශ්‍ය භාවය පිළිබඳ ගැටලු මතු කෙරේ. වැඩි දුරටත් දශක ගණනාවක් තිස්සේ හමුදා අත්පත් කර ගැනීමකට යටත්ව පැවතීමත් ඔවුන් ආර්ථික සම්පත් ඉපදවීමේ කටයුතුවල නිරතවීමත් එවැනි භාවිතා සාමාන්‍යකරණය කිරීමටත් හේතු වේ. එවැනි අත්පත් කර ගැනීමෙන් පීඩාවට පත් ප්‍රාදේශීය ප්‍රජාවන්ට අර්ථාන්විත ප්‍රතිකර්ම නොමැතිවීමෙන් ප්‍රජාව තවදුරටත් කොන් කිරීමටත් ඔවුන් තුළ කෝපයක් ඇති කරවීමටත් හේතුවේ. හානිපූරණය කිරීමේ අවංක උත්සාහයක් නොමැති නිසා මෙය අනාගතයේ ගැටුම් ඇතිවිය හැකි ක්ෂේත්‍ර බවට පත්විය හැකිය.

[76]''අපේ ඉඩම්, අපේ ජීවිතය, මහජන ඉඩම් කොමිසමේ වාර්තාව 2019-2020''

[77]''ශ්‍රී ලංකා යුද හමුදාව කෘෂිකාර්මික සහ පශු සම්පත් සේනාංකයක් පිහිටුවයි''8 ජනවාරි 2021. ඩේලි නිවුස්; http://www.dailynews.lk/2021/01/08/local/238255/sri-lanka-army-sets-agriculture-and-livestock-corps

# 3. සන්හිඳියාව

## වාර්ගික බහුතරවාදය සහ නව රාමු

වාර්ගික බහුතරවාදී මතය පශ්චාත් නිදහස් සමයේ රටේ ප්‍රධාන දේශපාලන බලවේගයක් විය. ඇත්තෙන්ම රටේ සුළුතර ප්‍රජාව මර්දනය කිරීමේ දී එය ඉටු කළ භූමිකාව අලුත් වර්ධනයක් නොවේ. කෙසේ වුවත් රාජපක්ෂ ආණ්ඩුවේ ආපසු පැමිණීමත් සමග සිංහල ජාතිවාදී දේශපාලන ව්‍යාපෘතිය නැවතත් ධෛර්යමත් විය. එමනිසා සංහිඳියාව සහ වගවීමේ ක්‍රියාවලීන්ට නව තවත් බාධා කරයි. විශේෂයෙන්ම පසුගිය ආණ්ඩුව යටතේ මෙම ව්‍යාපෘතියේ තාවකාලික අත්හිටුවීමක් සිදුවූ බවක් සිංහල ජාතිවාදීන් දකින නිසා බහුතර මතවාදී ඉගැන්වීම් වඩාත් සමීපවන ආකාරයට ශ්‍රී ලංකා රජයේ ස්වභාවය සහ ක්‍රියාත්මක වීම වෙනස් කිරීමට දැඩි ප්‍රයත්නයක් ගැනීම උත්සන්න කිරීමේ ප්‍රයත්නයක් දැකිය හැකිය.

2019 සහ 2020 ඡන්ද විමසීම්වලදී ආණ්ඩුවට පක්ෂපාත සිංහල බෞද්ධ ජන කොටස විශාල වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වූ බව දැකිය හැකිය. 2019 ඡන්ද විමසීම මහත් ව්‍යසනයක් ඇති කළ ත්‍රස්තවාදි ප්‍රහාරයක් පැවති පසුබිමක පාලනය සඳහා ප්‍රබල නායකයෙකු පත් කර ගැනීමේ අවස්ථාවක් වන අතර වසංගතයේ පළමු රැල්ල සාර්ථකව මැඩ පැවැත්වීමත් සමග පැවැත් වූ 2020 ඡන්ද විමසීම සහ ලබා ගත් දැවැන්ත ජයග්‍රහණය ආණ්ඩුවේ ජනප්‍රියත්වය තහවුරු කිරීමකි. මෙම මැතිවරණවලින් සහ වැඩ භාර ගැනීමේ දී සිංහල බෞද්ධ ඓතිහාසික ස්ථාන වන අනුරාධපුරය සහ මහනුවර තෝරා ගැනීමෙන් දුන් පණිවුඩය සහ සංකේතාත්මක භාවය ආණ්ඩුවේ ගමන් මග යොමු වන දිශාව ගැන සැක කිරීමට අවස්ථාවක් නොවීය. බෞද්ධ භික්ෂූන් මැතිවරණ ව්‍යාපාරයේ දී සහ ඉන් පසුව තීරණ ගැනීමේ දි ප්‍රධාන භූමිකාවක් ඉටු කළ අතර ඉන් කීප දෙනකු පසුව මූලික නායකත්ව භූමිකා කීපයකටත්, කාර්ය සාධන බලකායන්ට සහ මණ්ඩලවලටත් පත් කරන ලදී. පණිවුඩය පැහැදිලි ය. ආණ්ඩුවට නැති වූ තත්වය නැවත ලබා ගැනීමටත් ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ ප්‍රමුඛත්වය නැවත ඇති කිරීමටත් වරමක් ලැබී ඇත.

මෙය සිදු විය හැක්කේ නව ප්‍රතිපත්ති සහ නීතිමය මුලපිරුම් සහ වෙනත් ප්‍රායෝගික පියවර හරහා ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 2020 දී ගෙන එන ලද විසිවැනි සංශෝධනය ගැන පැවති විවාදයේ දී විධායක පාලනය ස්ථාපනය කිරීමෙන් සහ බලය කේන්ද්‍රගත කරන නව ව්‍යවස්ථාවක් ගෙන ඒමෙන් රාජ්‍යයේ ව්‍යුහය නව රාමුවක් තුළ සකස් කිරීමට අදහස් කරන බව තහවුරු කෙලේය. මෙම චින්තනය බැසිල් රාජපක්ෂගේ අදහස්වලින් පැහැදිලි ය. '' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ශක්තිමත් කණු සහ රාමුවක් අවශ්‍ය ය. අවසනාවකට මෙන් නව තත්වය තුළ මෙම අරමුණ කලින් කලට වෙනස්ව ඇත. පළමු ප්‍රබලම ප්‍රහාරය 13 වැනි සංශෝධනය යි. ඉන් පසුව 16, 18, සහ 19 සංශෝධන ගෙන එන ලදී. සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්ම ජාතියක පදනම වැනි ය. දැන් අපේ ව්‍යවස්ථාව වෙනත් දෙයකට ගොඩ නගන ලද පදනමක් මත ඉදිකළ එකක් සේය. පසුව ඊට තවත් මහල් එකතු කර ඇත. කිසියම් දිනයක මෙම ගොඩනැගිල්ල කඩා වැටී ජනතාව මිය යනු ඇත.''[78] ප්‍රසිද්ධ ප්‍රකාශ සහ ආණ්ඩුවේ ප්‍රධාන තනතුරුවලට කළ නව පත්කිරීම් වලින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රබල විධායක ජනාධිපති ක්‍රමයක් නිර්මාණය කොට 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් තත්වයෙන් වඩාත් ඈත්විය හැකිය. පළාත් සභා සහ දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ලබා දුන් ව්‍යුහයන් බලය බෙදා ගැනීම හුදෙක් සංකේතාත්මක තත්වයකට පත් කිරීම සඳහා ඒවා ඉවත් කරනු හෝ දුර්වල කරනු ඇත.

ආණ්ඩුවේ පණිවුඩය වන්නේ 2020 දැවැන්ත මැතිවරණ ජයග්‍රහණයෙන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වරමක් ලැබී ඇත්තේය යන්නයි. ඒ අනුව කෙටුම්පත් කිරීම ආරම්භ කිරීමට විද්වතුන්ගේ කමිටුවක් පත් කර ඇත. යෝජනා ඉදිරිපත් කිරීමට කමිටුවෙන් ප්‍රසිද්ධ ඉල්ලීමක් කළ අතර කීප දෙනකු

[78] උදිත ජයසූරිය අපට තුනෙන් දෙකේ බහුතරයක් ලබා දීම ජනතාවගේ කාර්යක්- බැසිල් https://www.ft.lk/opinion/Up-to-the-people-to-give-us-a-two-thirdsmajority-Basil/14-703809, 29 July

යෝජනා ඉදිරිපත් කර පසුව කමිටුව මුණ ගැසුණහ. මෙය ලියන අවස්ථාව වන විට එහි ප්‍රගතිය පිළිබඳව ඇත්තේ සීමිත තොරතුරක් පමණි. මෙම ආණ්ඩුව ගැන ජනතාව තුළ වැඩි වන අප්‍රසාදය සහ ඊට මුහුණ දීමට ඇති විවිධාකාර වූ අභියෝග සැලකිල්ලට ගැනීමේ දී ආණ්ඩුවට මෙවැනි ක්‍රියාවලියක් ඉදිරියට ගෙන යෑමට දේශපාලන ඕනෑ කමක් හෝ ශක්තියක් තිබේද යන්න පැහැදිලි නැත.

පවතින දේශපාලන, සෞඛ්‍ය සහ ආර්ථික අභියෝග හමුවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම පිළිබඳව අවිනිශ්චිත භාවයක් පැවතිය ද යෝජිත ව්‍යවස්ථා, කාර්ය සාධක බලකා සහ වෙනත් වර්ධනයන් ගෙන් දැක්වෙන ආකාරයට සිංහල බෞද්ධ බහුතරවාදය පවත්වා ගැනීමේ ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති මුලපිරුම් ගැන සැබෑ බියක් පවතී. ආණ්ඩුව දැනට මුහුණ දී ඇති විවිධාකාර වූ අභියෝගවලින් වෙනතකට යොමු කිරීම සඳහා කෙටුම් පත් ව්‍යවස්ථාවක් ඇතුළත් නව මුලපිරුම් හඳුන්වා දීමේ හැකියාව බැහැර කළ නොහැකිය. පසුගිය මාසවල මෙවැනි යෝජනා ඉදිරිපත් කළ රහස්‍ය භාවය සහ කඩිනම සැලකිල්ලට ගැනීමේ දී මෙම ක්ෂේත්‍රය ගැන දැඩි අවධානයෙන් පසුවිය යුතුය.

## වසංගත තත්වය තුළ සුළුතර අයිතිවාසිකම්

ඉහතින් දක්වන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන බහුතරවාදී පුළුල් ව්‍යාපෘතියක එක කොටසක් පමණි. සිංහල බහුතරවාදී මතවාදය රාජ්‍යය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නය පිටුපස ගාමක බලවේගය වීමට අමතරව රටේ සුළුතර ප්‍රජාවට අහිතකර වන ආකාරයට එදිනෙදා පරිපාලනය සහ මහජන ප්‍රතිපත්තිය හැඩ ගැසීමේ පදනම සහ දැනුවත් භාවය ද වේ.

දෙමළ ජනතාව ඓතිහාසිකව ශ්‍රී ලංකාවේ රාජ්‍යයේ වධ හිංසාවට ලක් කිරීමේ ප්‍රධාන ඉලක්කය වන අතර සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසුව, විශේෂයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව රාජ්‍ය අනුග්‍රහය ලත් මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වයත් සමග මුස්ලිම් ජනතාව ඉලක්ක කර ගැනීම උත්සන්න වීමක් දැකිය හැකිය. කොවිඩ් 19 වසංගත තත්වය මුස්ලිම් ජනතාව ඉලක්ක කර ගැනීමේ නව පසුබිමකි. ඔවුහු මුස්ලිම් ප්‍රජාව, වාර්ගික-බහුතරවාදී කතිකාව පෙරට ගෙන ඒමට දඩමීමා කර ගත්හ.

**බලහත්කාරයෙන් ආදාහනය කිරීම**

වසංගත තත්වය පැවති සමයේ ඉතාමත් කැපී පෙනෙන සිද්ධීන්ගෙන් එකක් වන්නේ බලහත්කාරයෙන් සිදු කළ ආදාහනයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ[79] භූමදානය ආරක්ෂිතව කළ හැකි බව දක්වා තිබුණ ද (සෞඛ්‍ය අමාත්‍යංශයේ මාර්ගොපදේශ ඊට අනුකූල විය.) ආණ්ඩුව කොවිඩ් 19 නිසා මිය ගිය අයගේ මළ සිරුරු භූමදානය තහනම් කෙළේය.

මතු වූ පීඩණය හමුවේ මෙම තීරණය වෙනස් කළ ද ආණ්ඩුව එවැනි පියවර ගැනීමෙන් වැළැක් වූ ආකාරය කැපී පෙනේ. මුලින්ම සෞඛ්‍ය අමාත්‍යංශය විසින් පත් කළ වයිරස් විශේෂඥයන් සහ අනුජීවී විද්‍යාඥයන්ගෙන් සමන්විත කමිටුවේ වාර්තාවෙන් භූමදානය ආරක්ෂිතව කළ හැකි බව සඳහන් කළ ද ආණ්ඩුව එය පිළිගැනීම ප්‍රතික්ෂේප කෙළේය.[80] මෙම ක්‍රියාවලියෙන් පෙන්නුම් කරන්නේ අදාල වෛද්‍ය විශේෂඥතාවය පදනම්ව තීරණ ගන්නා ආණ්ඩුවක් නොව පූර්වයෙන් නියම කර ගත් න්‍යාය පත්‍රයක් අනුව කිසියම් කණ්ඩායමක විශේෂඥතාවය යොදා ගැනීමේ උත්සාහයකි. ඒවාට තර්කානුකූල භාවයක් සහ විද්‍යාත්මක කඩතුරාවක් ලබා දීමේ උත්සාහයකි.

පළමු භූමදානය සැබැවින්ම සිදු කිරීමට පෙර, අවසාන තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු පසට ඇදීම් සහ ව්‍යාකුලතා ඇති විය. අගමැති මහින්ද රාජපක්ෂ[81] ප්‍රකාශයක් කිරීමෙන් පසුව ද ආණ්ඩුවේ සාමාජිකයෝ භූමදානය පිළිබඳ තහනම දිගටම ක්‍රියාත්මක වනු ඇතැයි කීහ.[82] මෙය මහජන ප්‍රතිපත්තියක් පිළිබඳ කරුණක් ගැන පවා ආණ්ඩුව තුළ පවතින ප්‍රති විරුද්ධ බල කණ්ඩායම් පිළිබඳ දර්ශකයක් වීමට අමතරව අවිනිශ්චිත භාවය සහ අසමගිය පිළිබඳ ප්‍රතිරූපයක් ඉදිරියට ගෙන ඒම

---

[79] https://apps.who.int/iris/bitstream/handle/10665/331538/WHO-COVID-19-IPC_DBMgmt-2020.1-eng.pdf

[80] ශ්‍රී ලංකාව කොවිඩ්වලින් මිය ගිය අය දිගටම ආදාහනය කරනු ඇත. ඇමති. 2021 ජනවාරි 7 ඉකොනොමි නෙක්ස්ට්; https://economynext.com/sri-lanka-will-continue-to-cremate-all-covid-dead-minister-77648/

[81] සුල්ෆික් ෆර්හාන්: කොවිඩ් මරණ භූමදානයට අගමැති ගේ කැමැත්ත පළ වේ.2021 පෙබරවාරි 10 නිව්ස් ෆස්ට් https://www.newsfirst.lk/2021/02/10/pm-gives-green-light-in-parliament-for-covid-burials/

[82] හිරන්යදා දේවසිරි: භූමදානය ගැන අගමැති වැඩි දුර අදහස් කිසිත් නැහැ,2021 පෙබරවාරි 12 ද මෝර්නිං; https://www.themorning.lk/nothing-more-from-pm-on-burial-comment/

සැලකිය යුතුය. අඩුම වශයෙන් හෝ මුස්ලිම් ප්‍රජාව කෙරේ 'දැඩි' බවක් පවත්වා ගැනීමට ඇති කැමැත්ත මත දේශපාලන වරමක් ලබා ගත් ආණ්ඩුවකට භූමදානය පිළිබඳ තහනම පවත්වා ගැනීම ඉමහත් දේශපාලන වැදගත් කමකින් යුත් කරුණකි.

ඇත්තෙන්ම අවසානයේ දී වෙනස්වීම සිදු වූයේ ඉම්රාන් ඛාන් ගේ ශ්‍රී ලංකා සංචාරයත් සමග ය. එම සංචාරයෙන් දින කීපයකට පසුව පෙබරවාරි 25 වැනි දා භූමදානයට අවසර දීමේ තීරණය ගනු ලැබිණ.[83] මෙම ප්‍රතිපත්ති වෙනස සිදු වූයේ එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාව සාකච්ඡාවට ගැනීමට පෙරාතුවය. එහි දී ශ්‍රී ලංකාවට පාකිස්ථානයේ සහාය අවශ්‍ය විය. රාජ්‍ය තාන්ත්‍රිකව මෙම ප්‍රතිපත්තිය පවත්වා ගත නොහැකි තත්වයකට පත් වන තෙක් දේශීය සහ විදේශීය විද්‍යාඥයන්ගේ මතය නොසලකා සිටි ආකාරය වැදගත් ය. එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාව විවාදයට ගැනීමට පෙර පාකිස්ථානය වැනි රටවල බලපෑම නොවන්නට ප්‍රතිපත්තියේ වෙනසක් සිදු නොවනු ඇත.

[83]ශ්‍රී ලංකාව අවසානයේ දී කොවිඩ් වින්දිතයන්ගේ භූමදාන තහනම ඉවත් කරයි. 2021 පෙබරවාරි 26. අල් ජසීරා; https://www.aljazeera.com/news/2021/2/26/sri-lanka-finally-lifts-ban-on-burial-of-covid-victims

## බලහත්කාරයෙන් සිදු කළ ආදාහන- කාලවකවානු[84]

**2020 මාර්තු 27**

- WHO භූමදානය ආරක්ෂිත බව ප්‍රකාශ කරයි. සෞඛ්‍ය අමාත්‍යංශයේ මාර්ගෝපදේශ ලෝක සෞඛ්‍ය සංවිධානයේ භූමදානයට ඉඩ සැලසෙන නිර්දේශවලට අනුකූලව නියම කරයිග

**2020 මාර්තු 30**

- දෙවන කොවිඩ් 19 මරණය. සෞඛ්‍ය අමාත්‍යංශයේ සහ WHO මාර්ගෝපදේශ නොසලකා පළමු මුස්ලිම් වින්දිතයාගේ ආදාහනය සිදු කරයි.

**2020 අප්‍රේල් 11**

- ආණ්ඩුව කොවිඩ් 19 මිය ගිය පුද්ගලයන්ගේ සිරුරු ඉවත් කිරීමේ එකම ආකාරය ලෙස භූමදානයට ඉඩ සැලසෙන ගැසට් නිවේදනයක් නිකුත් කරයි.

**2020 නොවැම්බර් 6**

- ඉස්ලාමීය සහයෝගිතාවය සඳහා වූ ස්වාධීන නිත්‍ය මානව අයිතිවාසිකම් මණ්ඩලය භූමදානය කිරීමේ ප්‍රතිපත්තිය ගැන බලවත් කනස්සල්ල ප්‍රකාශ කරයි.

**2020 දෙසැම්බර් 1**

- ශ්‍රේෂ්ඨාධිකරණය බලහත්කාරයෙන් සිදු කරන අදාහන නතර කරන මෙන් ඉල්ලා ඉදිරිපත් කළ සියලු මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉවත දමයි.

**2020 දෙසැම්බර් 8**

- සති දෙකක් වයසැති දරුවෙක් බලහත්කාරයෙන් ආදාහනය කිරීම

**2020 දෙසැම්බර් 16**

- බොරැල්ල කනත්තේ විරෝධය දැක්වීම

**2020 දෙසැම්බර් 30**

- බ්‍රිතාන්‍යයේ මුස්ලිම් සභාව බලහත්කාරයෙන් සිදු කරන ආදාහනයට අභියෝග කරයි.

**2021 ජනවාරි 4**

- සෞඛ්‍ය අමාත්‍යංශයෙන් පත් කළ විද්වත් කමිටුව භූමදානය සඳහා ඉඩ ලබා දීමට මාර්ගෝපදේශ පුනරීක්ෂණය කරයි.

**2021 ජනවාරි 7**

- පවිත්‍රා වන්නිආරච්චි භූමදානය පිළිබඳ තීරණය ගැනිමට ප්‍රධාන කමිටුවේ තීරණය අපේක්ෂාවෙන් සිටින බව පවසයි.

**2021 පෙබරවාරි 10**

- භූමදානයට ඉඩ දෙන බව මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවේ දී කියයි.

**2021 පෙබරවාරි 16**

- කොවිඩ් 19 වින්දිතයන් භූමදානයට ඉඩ දෙන බව ප්‍රකාශ කිරීම මහින්ද රාජපක්ෂගේ පුද්ගලික අදහසක් බව කැබිනට් ප්‍රකාශක උදය ගම්මන්පිල්ල පවසයි.

**2021 පෙබරවාරි 23**

- පාකිස්ථාන අගමැති ඉම්රාන් ඛාන් ශ්‍රී ලංකාවට පැමිණේ.

**2021 පෙබරවාරි 25**

- කොවිඩ් රෝගයෙන් මිය ගිය අයගේ සිරුර භූමදානයට පනවා තිබූ තහනම ඉවත් කරයි.

**2021 මාර්තු 1**

- ඉරණතිවු සූසාන භූමිය භූමදානයට අනුමත කරයි

**2021 මාර්තු 3**

- ඉරණතිවු සූසාන භූමිය තෝරා ගැනීමට විරෝධය

**2021 මාර්තු 9**

- සූසාන භූමිය ඉරණතිවු හි සිට ඔට්ටමාවඩි සුදුපත්තිසේනයි ප්‍රදේශයට වෙනස් කරයි.

[84] ශ්‍රී ලංකාවේ මුස්ලිම් ආගමිකයන්ට භූමදාන අයිතිය අහිමි කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශවලට පටහැනිය සහ පරාජයට නියමිතය– People’s Rights Group https://www.prgsrilanka.org/covid19sl/

**සුළුතරය ඉලක්ක කර ගත් අත්අඩංගුවට ගැනීම් සහ නීතිය යොදා ගැනීම**

සුළුතරය ඉලක්ක කර ගත් වඩාත්ම භයානක යාන්ත්‍රණයන්ගෙන් එකක් වන්නේ පුද්ගලයන් රඳවා ගැනීමට සහ නිහඬ කිරීමට විශේෂිත නීති ආයුධයක් වශයෙන් යොදා ගැනීමය. විශේෂයෙන්ම ප්‍රශ්න සහගත වන පනත් දෙකක් වන්නේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය පනත (ICCPR) සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යි. මෙය සිදු වන්නේ වධ හිංසා කිරීම් සහ නීතිය බලාත්මක කරන නිලධාරීන් භාරයේ සිටින අත්අඩංගුවට ගත් අය මරණයට පත්වීම පිළිබඳ වාර්තා වැඩි වශයෙන්ම ලැබෙන පසුබිමක ය. අලුත් වාර්තා අනුව සියලුම ප්‍රජා කොටස් මෙවැනි තත්වයන්ට මුහුණ දෙති.

මෙම පනත් සෑම ආණ්ඩුවක්ම සුළුතර කොටස් ඉලක්ක කර ගැනීමට යොදා ගත් අතර නව වර්ධනය වන්නේ 2019න් පසුව විසම්මුතියට ඇති අවකාශය වඩාත් හැකිළී තිබීම ය. මෙය විවිධ ආකාරයෙන් සිදු වූ අතර වඩාත් භයානක තත්වයක් වන්නේ මාර්තු 12 වැනිදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ''ප්‍රචණ්ඩ ආගමික අන්තවාදී මතවාදය පැතිරවීම නතර කිරීම'' යනුවෙන් රෙගුලාසි මාලාවක් හඳුන්වා දීම ය. මෙම රෙගුලාසිවලින් අදහස් කරන්නේ ''ප්‍රචණ්ඩ ක්‍රියා හෝ විවිධ ප්‍රජාවන් හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වාර්ගික හෝ ප්‍රජා අසමගිය හෝ වෛරය හෝ එදිරිවාදීකම් ඇති කරන හෝ ඇති කිරීමට අදහස් කරන අය පුනරුත්ථාපනය කිරීම ය.[85]

මෙම රෙගුලාසි නිකුත් කිරීමත් සමග ත්‍රස්තවාදය වැළැක්වීමේ විමර්ශන ඒකකය ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නව රැඳවුම් මධ්‍යස්ථානයක් ලෙස ගැසට් කර ඇත.[86] කීප දෙනකුම මෙයට අභියෝග කළ අතර දැනට එම කරුණ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. මෙවැනි හිතුවක්කාර සහ අපැහැදිලි රෙගුලාසි, විවේචකයන් හා සුළුතර කොටස් මෙන්ම ආණ්ඩුවේ මතයට වෙනස් මත දරන පුද්ගලයන් පවා ඉලක්ක කර ගැනීමට හැකිවීම අවධානයට යොමුව ඇත.[87] මෙම රෙගුලාසිවල වැදගත් යෙදුම් වන 'පුනරුත්ථාපනය' යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න ගැන සඳහනක් නොවීම සහ අධිකරණ අධීක්ෂණය සහ ආරක්ෂාව ඉවත් කිරීමත් අවධානයට යොමු වන කරුණු ය. නීතිපති දෙපාර්තමේන්තුව එම පුද්ගලයා පුනරුත්ථාපනයට සුදුසුයැයි විශ්වාස කරන්නේ නම් එකම අධිකරණ විමර්ශනයක් ලෙස මහෙස්ත්‍රාත්වරයෙකුගේ අනුමැතියෙන් වසරක කාලයක් ( මෙම කාලය තවත් වසරක් සඳහා දීර්ඝ කළ හැකිය.) සඳහා රඳවා තැබිය හැකිය. ඉතාමත් විස්තීර්ණ සහ අපැහැදිලි භාෂාව සහ ප්‍රබල අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැතිවීමෙන් අපහරණයට අවස්ථාවක් සැලසෙන නිසා සමාජයේ කොටසක් ඉලක්ක කර ගැනීමට පමණක් නොව විසම්මුතිය නිහඬ කිරීමට ද යොදා ගත හැකිය. මීට අමතරව විසම්මුතිය සීමා කිරීමට යොදා ගත හැකි ක්‍රමවේද පැවතීම කනස්සල්ලට හේතුවකි. නොයෙකුත් නව නීති හඳුන්වා දීමේ සූදානමක් ගැන ද වාර්තා වේ.

2019 සිට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ICCPR පනත සහ වෙනත් නීති ව්‍යවස්ථා විසම්මුතිය නිහඬ කිරීමට යොදා ගත් ආකාරය පෙනෙන්නට තිබිණ. මෙම නීතිවලින් වැඩියෙන්ම ඉලක්ක කර ගත්තේ සුළුතර ප්‍රජාවේ ජන කොටස් ය. හිජාස් හිස්බුල්ලා අත් අඩංගුවට ගැනීම මේ පිළිබඳව වඩාත්ම කැපී පෙනෙන සහ බරපතල නිදසුනකි. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ඔහු අත් අඩංගුවට ගැනීම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අවම ප්‍රමිතීන්ට හෝ ගැලපෙන්නේ නැත.[88] ඇසින් දුටු සාක්ෂි සහ හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වෙනස් කිරීමට ගන්නා උත්සාහය පිළිබඳව ලැබෙන තොරතුරු සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ඇති තවත් අය නිදහස් කිරීමේ පොරොන්දුව මත චෝදනා එල්ල කිරීම සඳහා ප්‍රකාශ ඉල්ලා සිටීමත් නිසි ක්‍රියා පටිපාටිය පිළිබඳව සැලකිල්ලක් නොදක්වන බවට කනස්සල්ලට පත් කෙරෙන තත්වයකි.

---

[85]ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෑතක නිකුත් කළ රෙගුලාසි පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය, 2021 මාර්තු 18

[86]ඊශ්වරන් රත්නම්, නව රැඳවුම් මධ්‍යස්ථාන ගැසට් කරයි (2021 ජුනි), ඩේලි මිරර් http://www.dailymirror.lk/front_page/New-detention-facility-gazetted/238-213669

[87]''කළු පෙට්ටිය කපිතාන් වසබ විසිනි– පෝර්ට් සිටියේ සහ සහාග ආණ්ඩුවේ තීරණාත්මක දිනය හෙට (අප්‍රේල් 2021), The Morning https://www.themorning.lk/d-day-for-port-city-and-govt-coalition-tomorrow

[88]ත්‍යාගී රුවන්පතිරණ, හිජාස් හිස්බුල්ලා: ශ්‍රී ලංකාවේ දරදඬු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නවතම වින්දිතයා, 2020 ජුලි , Amnesty International https://www.amnesty.org/en/latest/news/2020/07/sri-lanka-on-hejaaz-hizbullah-and-the-prevention-of-terrorism-act/

හිජාස් ගේ සිද්ධිය අත් අඩංගුවට ගැනීම් ගණනාවක් පිළිබඳ එක් නිදසුනක් පමණි. රම්සි රසීක් සහ කවියෙකු වන අහ්නෆ් ජසීම් අත් අඩංගුවට ගැනීම ආණ්ඩුව වැඩි වැඩියෙන් මුස්ලිම් ප්‍රජාව දඩමීමා කර ගැනීම සහ ඉලක්ක කර ගැනීම පිළිබඳ මූලික වෙනස්වීමක් සනිටුහන් කරයි.[89] මෙම සෑම සිද්ධියකින්ම ICCPR පනත සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සුළුතරය මර්දනය කිරීමේ ආයුධයක් ලෙස යොදා ගැනීම වැළැක්වීම සඳහා සංශෝධනය කළ යුතු ඇයිද යන්න පෙන්නුම් කරයි.

කෙසේ වුවත් මෙම පනත් ආයුධ බවට පත්කර ගැනීම වැඩි වෙමින් පවතින වාර්ගික බහුතරවාදයේ ගැඹුරු ප්‍රශ්න, මුස්ලිම් ප්‍රජාව සිංහල ජාතිවාදී චින්තනය තුළ නව දඩමීමෙකු කර ගැනීම සහ මෙම දේශපාලන ප්‍රවනතාවල බලපෑම යොමු වන්නේ කවර දිශාවකට ද යන්න පෙන්නුම් කරයි. සුළුතර ජන කොටස් ඉලක්ක කර ගැනීම සහ හිතුවක්කාර අත් අඩංගුවට ගැනීම් අවසන් කිරීමට නීතිමය මැදිහත්වීම මෙන්ම බහුතරවාදයට මතවාදීව විරුද්ධවීමේ මැදිහත්වීම් ද අවශ්‍ය ය.

මෙවැනි අත් අඩංගුවට ගැනීම්වල පවතින නෛසර්ගික අසාධාරණයට අමතරව එවැනි මර්දනකාරී ප්‍රවනතාවයන්ට විරෝධය පෑමේ අවස්ථා නොමැතිවීමෙන් කොන් කරන ලද තරුණ ජනතාව තුළ සාමකාමී ප්‍රජාතන්ත්‍රවාදී වෙනසක් කළ නොහැකිය යන හැඟීමක් ඉස්මතුව ඔවුන් අන්තවාදීන් දෙසට යොමු කරනු ඇත. මේ ආකාරයට මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයන් ඉලක්ක කර ගැනීම සහ හිතුවක්කාර ලෙස රඳවා ගැනීම බලධාරීන් ආරක්ෂා කිරීමට අරමුණු කර ගත් ආරක්ෂාවට තර්ජනයක් විය හැකිය.

**බුර්කා තහනම**

මුස්ලිම් ප්‍රජාව තවදුරටත් ඉලක්ක කර ගැනීම නිකාබ් සහ බුර්කාව ඇතුළත් මුහුණු ආවරණය තහනම් කිරීමේ පනත අනුමත කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කිරීමෙන් පැහැදිලි ය.[90] මෙවැනි කැබිනට් තීරණ වැඩි මාධ්‍ය අවධානයකට ලක් නොවන නමුත් මෙම විශේෂිත තීරණය කෙරේ දැඩි මහජන අවධානයක් යොමු වූයේ ආණ්ඩුවේ සාමාජිකයන්ම ඊට පුළුල් ප්‍රචාරයක් ලබා දුන් නිසාය. මෙවැනි ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීමෙන් පෙන්නුම් කරන්නේ වසංගත තත්වය කළමනාකරණය කිරීමට අසමත්වීම සහ ආණ්ඩුවේ අසාර්ථක භාවය පරික්ෂාවට ලක් කිරීමෙන් ජනතාව වෙනතකට යොමු කිරීමට ආණ්ඩුවට ඇති අවශ්‍යතාවය යි. එසේ කිරීමෙන් ආණ්ඩුවට මහජන කෝපය යොමු කිරීමට දඩමීමෙකු නිර්මාණය කිරීමට මෙන්ම ඔවුන්ට දඬුවම් කිරීම හරහා තම වාර්ගිත බහුතරවාදයේ සුජාත භාවය නගා සිටුවීමටත් හැකි වනු ඇතැයි විශ්වාස කරන්නට ඇත. කෙසේ වුවත් මෙම තීරණය ප්‍රසිද්ධියට පත් කිරීමෙන් ආණ්ඩුවට පාලනයේ තම අසාර්ථක භාවය වෙනතකට යොමු කිරීමට හැකි වූ අතර එම නිසාම තහනම ක්‍රියාත්මක කිරීමට ද හැකි වනු ඇත.

බුර්කාව 'ආගමික අන්තවාදයේ සංකේතයක්'[91] වන අතර එමනිසා එය ජාතික ආරක්ෂාව පිළිබඳ කරුණක්යැයි තර්ක කරමින් සරත් වීරසේකර ඉදිරිපත් කළ ප්‍රකාශය එම කාන්තාවන්ට කැලලක් මෙන්ම ඔවුන් අන්තවාදීන්යැයි ජනතාවගේ පිළිකුලට පත් වීමටත් හේතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් තහනම මෙතෙක් නීතියක් බවට පත් නොවූ නමුත් කැබිනට් තීරණය ප්‍රකාශයට පත් කිරීමෙන් බුර්කාව හෝ නිකාබ් අඳින මුස්ලිම් කාන්තාවන් ඉලක්ක බවට පත් විය හැකිය.

මුහුණු ආවරණ තහනම පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් ප්‍රජාව කෙරේ දැඩි ස්ථාවරයක් ගැනීමට යොදා ගත් අතර එය තහනම් කිරීම ද සිදු විය.[92] කිසිම ප්‍රහාරයෙකු මෙම ආවරණ යොදා නොගත් නමුත් ආවරණ තහනම් කිරීමට ආණ්ඩුව එය අවස්ථාවක් කර ගත්තේය. එබැවින් ත්‍රස්තවාදි ප්‍රහාරවලින් පසුව රජය ගත් පියවර කිසියම් සැබෑ ත්‍රස්තවාදී තර්ජනයක් අඩු කිරීමට වඩා වරදකරුවන්යැයි සැලකූ ප්‍රජාවක් මැඩ පැවැත්වීමට ගත් ජනප්‍රිය පියවරකි.

---

[89] ඉසැඩ් එල් මොහමඩ් 'රම්සි රසීක්: සේවයට කැප වූ සාමාන්‍ය ජීවිතයක් සඳහා වූ සුවිශේෂී අරගලයක් පොලිස් අත් අඩංගුවට ගැනීමකින් කනපිට පෙරළීම' (2020 මැයි) ඩේලි එෆ්ටී https://www.ft.lk/opinion/Ramzy-Razeek-An-extraordinary-struggle-for-an-ordinary-life-of-service-upended-by-a-Police-arrest/14-699917

නෙත්මි රාජවසම් 'කවියෙකු අත් අඩංගුවට ගැනීම' (2020 අප්‍රේල්) ද මෝර්නිං https://www.themorning.lk/the-arrest-of-a-poet/

[90] ශ්‍රී ලංකාව බුර්කාව සහ වෙනත් මුහුණු ආවරණ තහනම් කිරීමට යයි. (2021 මාර්තු) බීබීසී https://www.bbc.com/news/world-asia-56386426

[91] ඉහත එම

[92] ''ශ්‍රී ලංකාවේ ප්‍රහාරය: පාස්කු ප්‍රහාරයෙන් පසුව මුහුණු ආවරණය තහනම්'' (2019 අප්‍රේල්), බීබීසී https://www.bbc.com/news/world-asia-48088834

ඒ ආකාරයටම වත්මන් ආණ්ඩුව විසින් මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කර ගැනීමෙන් පෙන්නුම් කරන්නේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට වඩා එහි වාර්ගික බහුතරවාදි සුජාත භාවය පවත්වා ගැනීමේ ප්‍රයත්නයකි. මෙය වඩාත් කැපී පෙනෙන තත්වයක් වන්නේ මෙම විෂය ගැන කරන ලද අධ්‍යයනවලින් ඊට වෙනස් තත්වයක් පෙන්නුම් කරන නිසා ය. පවතින සාක්ෂි අනුව බුර්කා තහනම ත්‍රස්තවාදි ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව සැබැවින්ම වැඩි වීමේ තත්වයකි.[93]

බුර්කාව සහ නිකාබ් තහනම් කිරීම මුස්ලිම් කාන්තාවන්ගේ ආගමික සහ ඇදහීමේ නිදහස ප්‍රකාශයට පත් කිරීමට ඇති අයිතිවාසිකම උල්ලංඝනය කිරීමක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ දෙනකු මහජන අවකාශයට පැමිණීමෙන් වැළැක්වින. විශේෂයෙන්ම මෙවැනි සන්දර්භයක මෙම පියවර මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගැනීමේ පියවර මාලාවකින් එකක් පමණි. මේ ආකාරයට ආගමික නිදහස උල්ලංඝනය කිරීම බහුතර සහ සුළුතර ප්‍රජාවන් අතර ධ්‍රැවීකරණය සහ නොරුස්නා බව තවත් නිර්මාණය කිරීමට හේතු විය හැකිය.

**අනුස්මරණය කිරීම**

මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් මෙවන් ආකාරයක ඉලක්ක කර ගැනීමේ පරිණාමයක් අපට දක්නට ලැබුණ නමුත් ගැටුම් ඇති කිරීමේ ගාමක බලයක් දෙමළ ප්‍රජාව සම්බන්ධයෙන් නිරතුරුවම ක්‍රියාත්මකව තිබිණ. යුද්ධය අවසානයේ සිටම පැවති මෙම තත්වය මෙම ආණ්ඩුවේ සම්ප්‍රාප්තියත් සමග වඩාත් තීව්‍රවීමේ ක්‍රියාවලියකට ලක් විය.

නිදසුනක් වශයෙන් අහිමි වූ තම ප්‍රියයන් සිහිපත් කිරීමට නොහැකිවීම යුද්ධය අවසානයේ සිට දෙමළ ප්‍රජාවගේ කැපී පෙනෙන දුක්ගැනවිල්ලකි. සිහිපත් කිරීම වැළැක්වීම තීව්‍ර වූයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ජයග්‍රහණය සැමරීමේ ජයග්‍රාහී ස්මාරක, සිහිපත් කිරීම තහනම් කළ ප්‍රදේශවලම ඉදි කිරීමෙනි. ඇත්තෙන්ම මෙය වත්මන් ආණ්ඩුවට පෙර සිටම පැවත එන පද්ධතිගත මුල් බැසගත් මතවාදී ගැටලුවකි. මෙවැනි සිද්ධීන් යහපාලන ආණ්ඩුව පැවති කාල සීමවේ ද සිදු විය. එසේ වුවත් විශේෂයෙන්ම මෙම ආණ්ඩුවේ සම්ප්‍රාප්තියත් සමග උතුර සහ නැගෙනහිර දෙමළ ප්‍රජාවේ සාමාජිකයන් සහ රාජ්‍යය අතර නුරුස්සන බව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රශ්න සහගත සිද්ධීන් ගණනාවක්ම සිදු විය.

යුද්ධයේ අවසාන අදියරේ දී මිය ගිය සිවිල් ජනතාව සිහි කිරීමට යාපනයේ විශ්ව විද්‍යාලයේ ඉදි කළ ස්මාරකය ජනවාරි 8 වැනිදා විශ්ව විද්‍යාල බලධාරීන් විසින් බුල්ඩෝසර් දමා විනාශ කිරීම එවැනි අවස්ථාවකි.[94] එසේ කිරීමට විශ්ව විද්‍යාලයේ කුලපති එස්. ශ්‍රීසත්කුනරාජාට උපදෙස් ලැබී ඇත්තේ විශේෂයෙන්ම ආරක්ෂක අංශය, බුද්ධි අංශ සහ අධ්‍යාපන අමාත්‍යංශය වැනි ඉහළ බලධාරීන්ගෙන් ය.[95]

උතුරු හා නැගෙනහිර සිහිපත් කිරීම් දිගින් දිගටම වැළැක්වීම විශේෂයෙන් වැදගත් වන්නේ ජනතා විමුක්ති පෙරමුණේ[96] සාමාජිකයන්ව සිටිය දී මිය ගිය ආදරණීයන් බොහෝ දෙනකු සිහි කිරීම සඳහා අනුස්මරණ පැවැත්වීමට අයිතිවාසිකමක් නිවැරදිව ලැබී ඇති පසුබිමක ය. අසූ ගණන්වල සන්නද්ධ කැරැල්ලක් මෙහෙය වූ මෙම කණ්ඩායම ද ඒ කාලයේ දී ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ආණ්ඩුවෙන් නම් කර තිබිණ.

---

[93]මන්වන්ද සහ සයියා (2017) *'බුර්කාව තහනම් කිරීමෙන් අපව ආරක්ෂා වන්නේද? යුරෝපය තුළ මුහුණු වැස්ම තහනම් කිරීම සහ ත්‍රස්තවාදය*

[94]මීරා ශ්‍රීනිවාසන් , යුද වින්දිකයන්ගේ ස්මාරකය ඉවත් කිරීමෙන් යාපනය විශ්ව විද්‍යාලය උණුසුම් වේ'. (2021 ජනවාරි) ද හින්දු https://www.thehindu.com/news/international/tense-situation-at-jaffna-university-after-authorities-remove-war-memorial/article33535428.ece

[95]එය නැවත ඉදි කරන බව ප්‍රකාශ කිරීමෙන් ජනවාරි 11 වැනිදා උදෑසන මෙම තීරණය හදිසියේම වෙනස් විය. මෙම තීරණය වෙනස් වූයේ මහින්ද රාජපක්ෂ සහ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ අතර පැවති සාකච්ඡාවෙන් පසුවය. මීරා ශ්‍රී නිවාසන්'යාපනය විශ්ව විද්‍යාලයේ ස්මාරකය පිළිබඳව ඉන්දියාව මැදිහත් වේ. (2021 ජනවාරි)
ද හින්දු https://www.thehindu.com/news/international/india-intervened-on-jaffna-varsity-memorial-issue/article33594886.ece

[96]මිය ගිය ජවිපෙ විරුවන් සැමරීමේ 30 වැනි අනුස්මරණය (2019 නොවැම්බර්) ඩේලි මිරර් https://www.dailymirror.lk/news/30th-commemoration-of-fallen-JVP-heroes/239-177805

සිහිපත් කිරීම වැළැක්වීමේ දී දක්නට ලැබෙන මෙම වෙනස, ත්‍රස්තවාදීන් අනුස්මරණය කිරීමට ඉඩ නොදීමේ මූලධර්මය යුක්ති සහගතව සහ සාධාරණව යොදා ගැනීමේ ප්‍රතිපත්තිය භාවිතා කිරීමකි යන්න අභියෝගයට ලක් කරයි. සිංහල ප්‍රජාවට සිහිපත් කිරීමට ලබා දී ඇති අයිතිය දෙමළ ප්‍රජාවේ සාමාජිකයන්ට ලබා නොදීම, මෙම තීරණය අන්තර්-වාර්ගික දේශපාලනයෙන් බැහැර කළ නොහැකි බව සහ මෙම ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී බහුතරවාදයට මතවාදී කැපවීම රජයට බලපෑමක් වී ඇති බව පෙන්නුම් කරයි.

එල්ටීටීඊය වීරත්වයට පත්කිරීමක්යැයි සැලකෙන සිහිපත් කිරීමේ අයිතිය පිළිබඳ මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීමේ දී සිංහල ජාතිවාදීන් සහ එල්ටීටීඊයට හිතවාදී දෙමළ ජාතිවාදීන් අතර පවතින එකමුතුව ද සැලකිල්ලට ගැනීම වැදගත් ය. කෙසේ වුවත් එල්ටීටීඊය පවත්වන අනුස්මරණ සහ තමන්ගේ කැමැත්තක් නැතිව එල්ටීටීඊයට එක් වූ පුද්ගලයන්ගේ පවුල් මිය ගිය තම ඥාතීන් සිහිපත් කිරීමත් අතර වෙනසක් දැකිය යුතුය. අනුස්මරණය කිරීමේ ගැටලුව සිංහල සහ දෙමළ ජාතිවාදීන්ගේ ලෝක දැක්ම සමාන බව දැක්වෙන අවස්ථා ගණනාවකින් එකකි. මෙම සමාන කැපවීම් වර්ධනය වෙමින් පවතින ඒදිරිවාදිකම්වල හේතුවක් මෙන්ම එහි ප්‍රතිඵලයකි. එක් එක් කණ්ඩායමක් අනෙකා සැක කිරීම දිගටම පවත්වා ගැනීමෙන් සැක කිරීමේ සහ ගැටුම් ඇතිවීමේ චක්‍රය පැවතීම සහතික කරයි.

භාෂා ගැටලුව ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන් මාර්ගයේ දිගටම බලපෑම් කරන සාධකයකි. මෑතකදී රටේ නිල භාෂා ප්‍රතිපත්තිය පැහැදිලිවම උල්ලංඝනය කළ අවස්ථා ගණනාවක් දක්නට ලැබිණ. පසුගිය දා වූ එවැනි සිද්ධියක් වන්නේ දෙමළ භාෂාව ඉවත් කර සංඥා පුවරු ගණනාවක් ඉදි කිරීම ය. සියලුම සංඥා පුවරුවල රටේ නිල රාජ්‍ය භාෂා තුනම ඇතුළත් විය යුතුයැයි සඳහන් වන නිල භාෂා රෙගුලාසි කඩ කිරීමකි. දෙමළ ඉවත් කිරීම පිළිබඳ මෑතක දක්නට ලැබුණු හොඳම උදාහරණය ඒ වෙනුවට මැන්ඩරීන් ඇතුළත් කිරීම ය.[97] මැන්ඩරීන් ඇතුළත් කර තිබීම ප්‍රශ්නකාරී ගැටලුවක් නොවන නමුත් ජාතික භාෂාවක් ඉවත් කර ඒ වෙනුවට මැන්ඩරීන් යෙදීම සැලකිය යුතු ගැටලුවක් වන්නේ රජය විසින් භාෂාවක් බැහැර කිරීම පසු ගිය කාල වකවානුවේ ප්‍රධාන ගැටුමක මූලික කාරණාවක් වූ නිසා ය. එය බලවත් කනස්සල්ලට හේතුවකි. මෙම නවතම සිද්ධියේ භූදේශපාලන ලක්ෂණ කෙරේ බලවත් අවධානයක් යොමු වීමෙන් ගැටලුව පෙරමුණට ගෙන ඒමට හේතුවක් විය. කෙසේ වුවත් මෙය දෙමළ ප්‍රජාවේ භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් රජය පොදුවේ අනුගමනය කරන වඩාත් ගොරහැඩි ප්‍රතිපත්තිය ගැන හොඳින් දෘශ්‍යමාන නිදර්ශනයකි. මෙය ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනය කිරීමට ආණ්ඩුව දැක්වූ විරෝධයේ[98] සිට අගමැති මහින්ද රාජපක්ෂ භාෂා අයිතිය පිළිබඳව කළ ප්‍රශ්නකාරී ප්‍රකාශ දක්වා දැකිය හැකිය.[99]

මෙම තත්වය වසංගත සමයේ ආණ්ඩුවේ නිල ප්‍රකාශන සහ පොලිස් නිවේදනවල දෙමළ භාෂා පරිවර්තන නොමැතිවීමෙන් දක්නට ලැබිණ. සංචරණ සීමා පිළිබඳ දැන්වීම් සහ වසංගත තත්වය ගැන නිකුත් කළ මාර්ගෝපදේශ නිකුත් වූයේ සිංහලෙන් පමණි.

ජාතික භාෂා ප්‍රතිපත්තිය පිළිපැදීම බලවත්ව සැලකිල්ලට ගැනීමට නැවත නැවතත් අපොහොසත්වීම පළමුවෙන් සහ ප්‍රමුඛ ලෙසම රාජ්‍යය සුළුතර ප්‍රජාවන්ට කොන්දේසිවලට යටත්ව ඉඩ සලසන නමුත් පැහැදිලිවම සිංහල ප්‍රජාවේ නියෝජනයකි යන බහුතරවාදී සංකල්පය දිගටම බලපැවැත්මේ සංඥාවකි. මෙම ලෝක දැක්ම දිගටම බලවත්ව පැවතීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී එහි බලපැවැත්ම දැනටමත් දුර්වල වී ඇති සංහිඳියා ක්‍රියාවලියට තවත් බාධා කෙරෙන අතර දෙමළ භාෂාව කතා කරන සුළුතරය වඩාත් පරාරෝපණය කරනු ඇත.

### අන්තර්ජාතික වගවීමේ ක්‍රියාවලින් සහ බලපෑම්

ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ වගවීම සහ සංහිඳියාව 2021 මාර්තු මස එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ කවුන්සලයෙන් සම්මත කරන ලද යෝජනාවත් සමග සාක්ෂි රැස්කිරීමේ

---

[97]මීරා ශ්‍රීනිවාසන්, ට්විටර් කතාබහ අස්සේ ශ්‍රී ලංකාවේ මැන්ඩරීන් නාම පුවරුව ඉවත් කිරීමේ සූදානමක 2021 මැයි, ද හින්දු https://www.thehindu.com/news/international/amid-twitter-spat-move-to-replace-mandarin-board-in-sri-lanka/article34622663.ece

[98]නිදහස් දිනයේ දී ශ්‍රී ලංකාව දෙමළ ජාතික ගීය ඉවත් කරයි.' (2021 මැයි), අල් ජසීරා https://www.aljazeera.com/news/2020/2/4/sri-lanka-scraps-tamil-national-anthem-at-independence-day

[99]ශ්‍රී ලංකාව නිදහස් දිනයේ දී දෙමළ ජාතික ගීය ඉවත් කරයි. 2020 පෙබරවාරි අල් ජසීරා https://www.aljazeera.com/news/2020/2/4/sri-lanka-scraps-tamil-national-anthem-at-independence-day

සහ වගවීමේ පුළුල් ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇත.[100] වඩාත් මෑතකදී යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වයේ පිරිහීම ගැන යෝජනාවක් සම්මත කළ අතර ඉන් සාමාන්‍යකරණය වූ වරණීය යෝජනා ක්‍රමය (GPS+) යටතේ ඇති අනුග්‍රහයන්ට ද බලපානු ඇත.[101] ශ්‍රී ලංකාවේ අතීත අපහරණ පිලිබඳව වගවීම ඉල්ලා සිටින උද්ඝෝෂණ ලොව විවිධ රටවල අගනුවර හා ශ්‍රී ලංකාව තුළින් නැගුණු සහ (ජීවත්ව සිටින වින්දිත කණ්ඩායම්, සිවිල් සමාජය සහ දේශපාලන එකතුන්) සහ බාහිරව (එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණ සහ විශේෂ ක්‍රියා පටිපාටි, අන්තර්ජාතික සංවිධාන සහ ඩයස්පෝරාව) නගන ලද හඬින් ප්‍රබල වූ බව පැහැදිලි ය.

අතීතයේ සහ දැනට සිදුවෙමින් පවතින උල්ලංඝනය කිරීමේ පිළිබඳ සාකච්ඡාවල අවධානය වැඩි වශයෙන්ම යොමුව ඇත්තේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, තමිල් ඊළාම් විමුක්ති කොටි (LTTE) සහ වෙනත් පාර්ශ්වයන් කරන ලදැයි චෝදනා සහ ප්‍රති චෝදනා ඉදිරිපත් වන උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙනි. මෙම සාකච්ඡාවල දී විවිධ කණ්ඩායම් අතර බොහෝ විට පවතින තරගකාරී සහ එදිරිවාදී ස්වභාවය ගැඹුරටම මුල් බැස ඇති ස්ථාවර ඉස්මතු කරන අතර ශ්‍රී ලංකාවේ වගවීමේ සහ සංහිඳියාවේ පවතින අවුල් සහගත තත්වය සහ සංකීර්ණ පැතිමානයන් හෙළි කරයි. ගැලපෙන අවකාශයක් අත් කර ගැනීමට සිංහල සහ දෙමළ ජාතිවාදී කණ්ඩායම් අන්තවාදී ස්ථාවරයන්ට යොමුවන බවත් කලින් වගවීම ඉල්ලා එකට නැගී සිටි කණ්ඩායම් තුළ සහ ඒවා අතර බෙදීම් ඇති කරන වින්දිත ධූරාවලීන් නිර්මාණය වන බවත් දක්නට ලැබිණ.

2015 ජනවාරි මාසයේ දී බලය සාමකාමීව මාරුවීමත් සමග විවෘත වූ අවකාශය තුළ බොහෝ දෙනාගේ විවිධාකාර වූ වුමනාවන් වඩාත් කැපී පෙනෙන්නට විය. 2015 යෝජනා අංක 30/1 සම්මත කර ගැනීමට සහාය දැක්වූ කීප දෙනෙක්ම එය ශ්‍රී ලංකාවේ පවතින ගැටුමේ සහ මුක්තියේ මූලික හේතු සාධක ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකාව තුළ සංශෝධන ගෙන ඒමට අවස්ථාවක් සේ දුටහ. ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිකවාදී කණ්ඩායම්වලට සහ ඩයස්පෝරාවේ අන්තවාදී හඬ නැගූ අයට 30/1 යෝජනාවෙන් දුන් ප්‍රතිඥා ප්‍රමාණවත් නැත. ඒ සමගම ආරම්භ වූ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සහ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය දැඩි ලෙස විවේචනයට ලක් වූ අතර සමහර ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීමට ගත් උත්සාහයට විරෝධතා මතු විය. සොයාගත නොහැකි වූ පුද්ගලයන් සඳහා වූ කාර්යාලයක් (OMP) විවෘත කිරීම සහ ක්‍රියාත්මක කිරීමට එරෙහිව විරෝධතා මතු විය. මෙම වර්ධනයන් වින්දිත කණ්ඩායම් සහ සිවිල් සමාජය අතර බෙදීම්වලට තුඩු දුන් අතර ඉන් මෙම ව්‍යාපරයේ පවතින දුබලතාවය හෙළිදරවු කරයි. සමහරුන් බාහිර බලවේගවල බලපෑමට සහ ඒ මත රඳා පැවැත්මට ලක්වීමෙන් තවත් පැතිමානයක් එක් කළ අතර එය නව තලයක සංකූලතාවයක් නිර්මාණය කෙරිණ.

2019 සිට අධිකාරිවාදී සහ හමුදාකරණය වූ පාලනය වේගවත් වීමත් සමග කණ්ඩායම් කීපයක් නැවතත් එක් වූ අතර ඒ හේතුවෙන් වඩාත් ප්‍රබල අන්තර්ජාතික බැඳීමක් සහ ක්‍රියාත්මක පියවර ඉල්ලා සිටියහ. මෙය 2021 මාර්තු මස එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ සැසි වාරය ආරම්භ වීමට පෙර දෙමළ දේශපාලන කණ්ඩායම් සහ තවත් අය 2021 පෙබරවාරි මස යවන ලද ඒකාබද්ධ ලිපියකින් දක්නට ලැබිණ.[102] මෙවැනි පියවරවලින් පවතින බෙදීම් සහ මධ්‍යස්ථ හඬ යටපත් කිරීමට සමහර අන්තවාදීන් ගත් උත්සාහය සම්පූර්ණයෙන් ආමන්ත්‍රණය කරනු ඇතැයි සිතිය නොහැකි ය. වින්දිත භාවයේ සහ අනන්‍යතාවයේ දේශපාලනය තදින් මුල් බැස ගත් සන්දර්භයක වගවීම සහ සංහිඳියාව සඳහා බල කිරීමේ ප්‍රයත්න කලකිරීමට පත් කරවන සුලුය. මෙවැනි විවිධාකාර වූ අභියෝග සැලකිල්ලට ගැනීමේ දී ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය තුළ සියලු ගැටලු ආමන්ත්‍රණය කෙරෙන කල් පවත්නා විසඳුමක් ඇති කර ගත හැකියැයි සිතිය නොහැකිය.

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලයේ දී ප්‍රබල යෝජනාවක් සම්මත කර ගැනීම, අනතුරුව යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගැනීම මෙන්ම කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයේ දෙමළ ජනඝාතන අධ්‍යාපන සතිය පනත යන සියල්ල වත්මන් ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ පවතින විපත්කාරී තත්වයට නිදසුන් ය. ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය ආරක්ෂා කර ගැනීම පිළිබඳව කරන ලද උද්වේගකාරී ප්‍රකාශ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ කරුණකට වඩා දේශීය ප්‍රජාව අරමුණු කර ගත් ප්‍රලාපයකට වැඩි දෙයක් නොවේ. වැඩි දුරටත් මෙවැනි

---

[100]ශ්‍රී ලංකාවේ වගවීම, සංහිඳියාව සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ යෝජනාව 46/1, 2021මාර්තු 23

[101]විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම ඇතුළත් ශ්‍රී ලංකාවේ තත්වය ගැන යුරෝපා පාර්ලිමේන්තුවේ යෝජනාව 2021 ජුනි 10

[102]ජිනීවා හි එක්සත් ජාතීන්ගේ රැස්වීමේ දී දෙමළ පක්ෂ එක්සත්ව ඉල්ලීම් උත්සන්න කරති' (2021 ජනවාරි), ඩේලි එෆ්ටී https://www.ft.lk/columns/Tamil-parties-unitedly-escalate-demands-at-UN-in-Geneva/4-712182

මූලික වැදගත් අවස්ථාවන්ට මුහුණ දීමට අවශ්‍ය කරන සැලසුම් සහ සූදානම්වීම් නොමැති බව දැක්වෙන අවස්ථා කීපයක්ම තිබුණ අතර ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ගාමක බලය කවුද සහ කුමක්ද ගැන ගැටලු මතු කෙරිණ.

තවත් පැතිමානයක් වන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අන්තර්ජාතික ප්‍රජාව සම්බන්ධ කර ගත් ආකාරය යි. ප්‍රබල මූලධාර්මික වූ ස්ථාවර ගැනීමට නොහැකිවීම, යුද්ධයේ අවසාන අදියරේ දී ඇති වූ මානුෂික අර්බුදයට සූදානමක් නොවීම එක්සත් ජාතීන්ගේ අසාර්ථක භාවය ඉස්මතු කෙරෙන පෙට්‍රි වාර්තාව (Petrie Report )[103] වැනි මුලපිරුම්වලට හේතු විය. අන්තර්ජාතික ප්‍රජාවේ සමහරුන් තුළ මෙවැනි අදහස් හුවමාරුවීමෙන් අන්තර්ජාතික ප්‍රජාවේ කිසිවෙකු මානව අයිතිවාසිකම්, යුක්තිය සහ සංහිඳියාවට අදාල සංවේදී ගැටලු වල නිරතව සිටීමට අමතරව ප්‍රායෝගික සහ සංවර්ධනය කෙරේ නැඹුරු වූ පිවිසුමක් ගන්නේ ද යන්න මතු කෙරේ. මෙවැනි පිවිසුමක් ආණ්ඩුව විසින් මුල පුරන ලද ප්‍රශ්න සහගත වැඩ සටහන් සුජාත කොට ශක්තිමත් කර වින්දිතයන්ට, සිවිල් සමාජයට, මාධ්‍යයට සහ අනෙකුත් අයට ඇති සීමිත අවකාශය පවා හැකිළවීමට පහසුවක් වනු ඇත.

**විපක්ෂය සහ ක්‍රියාකාරිත්වය**

ශ්‍රී ලංකාවේ පාලනය පිළිබඳව ගත් නොයෙකුත් වැරදි පියවර සහ ගැඹුරු වන සෞඛ්‍ය සහ ආර්ථික අර්බුදය විපක්ෂයකට ශක්තිමත්වීමට සහ ප්‍රවේගයක් ගොඩ නගා ගැනීමට සුදුසු අවස්ථාවක් සලසයි. මෙම අවස්ථා උපරිම වශයෙන් යොදා ගැනීමට අපොහොසත්වීම, පැහැදිලි දැක්මක් සහ නායකත්වයක් නැති භේද භින්න වූ විපක්ෂයකට නිදසුනකි. පසුගිය මාසවල විපක්ෂ නායකයාට සහ ප්‍රධාන විපක්ෂය වන සමගි ජන බලවේගයට එරෙහිව විවේචන රැසක් ඉදිරිපත් වූයේ ආණ්ඩුවේ වැඩි වෙමින් පවතින අමනෝඥ කටයුතුවලට සහ දූෂණ, වෙනස් කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වයට ක්‍රියාශීලීව අභියෝග කිරීමට අපොහොසත් වීම නිසාය.

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී විපක්ෂයේ කණ්ඩායම් අතර බල තුලනයේ ප්‍රධාන වෙනස්කම් සිදු වූ අතර සමගි ජන බලවේගය වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ගත් අතර දෙමළ ජනතා සංධානය (TNA) සහ ජාතික ජන බලවේගය (NPP) පිළිවෙලින් දෙවන හා තෙවන තැන්වලට පත් වූහ. ජාතික ජන බලවේගය පාලනයට සහ අධිකාරිවාදයට විරෝධය දැක්වීමේ දී දකුණේ තරුණයන් සහ මධ්‍යස්ථ ඡන්ද දායකයන් සමග එක් වුවද ඔවුන්ට තම ආසන සංඛ්‍යාව රැක ගැනීමට නොහැකි විය. ඔවුන්ගේ නියෝජනය පාර්ලිමේන්තු ආසන තුනකට සීමා විය. දෙමළ ජාතික සන්ධානයට ද ඔවුන්ගේ පාර්ලිමේන්තු ආසන 16 රැක ගැනීමට නොහැකි වූ අතර දිනා ගත හැකි වූයේ ආසන 10ක් පමණි. ඔවුන් ගේ දුර්වලවීම දේශපාලන විසඳුමක් ලබා ගැනීමේ පැහැදිලි ප්‍රගතියක් අත් කර ගත නොහැකිවීම සහ ආර්ථික දුෂ්කරතාවයන්ට විසඳුම් නොමැති වීම ගැන දෙමළ ඡන්ද දායකයන්ගේ කලකිරීමට හේතුව බව පැහැදිලි ය. මේ තත්වය නිසා දෙමළ ජාතික ජනතා පෙරමුණ (TNPF) සහ තමිෂි මක්කල් තේශීය කුට්ටම් (TMTK) යන පක්ෂවලට පාර්ලිමේන්තුවට පිවිසීමට හැකි විය.

වැඩි දුරටත් පසුගිය වසර කීපය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ කීපයක දුර්වලවීමක් දක්නට ලැබිණ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එකම ජයග්‍රහණය වූයේ යාපනයේ දි අත් කර ගත් විශාල ජයග්‍රහණය යි. එහි අපේක්ෂකයාට වැඩිම මනාප සංඛ්‍යාවක් ලැබුණ අතර දිස්ත්‍රික්ක ලැයිස්තුවේ පළමු තැනට පත් වූයේය. ප්‍රදේශයේ ජීවන මාර්ගයන්ට සහ සංවර්ධනයට මුල් තැන දෙන බවට ශ්‍රීලනිපය දුන් පොරොන්දුව බොහෝ දෙනාට ආකර්ෂණයන් වූ අතර ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වයේ යථාර්ථය හෙළි කිරීමකි. වැඩි දුරටත් එක්සත් ජාතික පක්ෂය මෑත වසරවල දැක්වූ බෙලහීන ක්‍රියාකාරිත්වයට පිළිතුර වූයේ අන්ත මැතිවරණ පරාජයක් අත් කර දීමෙනි. ඔවුන්ට ලබා ගත හැකි වූයේ ජාතික ලැයිස්තුවෙන් එකම ආසනයක් පමණි. එම ආසනයට මාස දහයක් යන තෙක් නමක් ඉදිරිපත් කිරීමට නොහැකිවීම මැතිවරණ ගණනාවක් පරාජයට පත්වීමෙන් පසුවද නව නායකත්වයක් සොයා ගැනීමට තරම් පරිකල්පනයක් නැති බවට නිදසුනකි. අවසානයේ දී එම අසුනට නායක රනිල් වික්‍රමසිංහ පත් වූයේය.

ආණ්ඩුවට සුපිරි බහුතරයක් අත්වීමෙන් පාර්ලිමේන්තු කාර්ය පටිපාටිය සහ වැඩ කටයුතු නියම කිරීමට අවස්ථාවක් හිමි විය. මෙය ස්ථාවර නියෝගවලට කරන ලද වෙනස්කම්වලින් සහ විවාදයන්ට කාලය වෙන් කිරීම වැනි පියවර ගණනාවකින් දක්නට ලැබිණ. මෑතක පැවති පෝර්ට් සිටි පනත විවාදයේ දී

[103] 'ශ්‍රී ලංකාව පිළිබඳ අභ්‍යන්තර නිරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පිළිබඳ ප්‍රකාශය' (2012 නොවැම්බර්), එක්සත් ජාතීන්ගේ මහලේකම් https://www.un.org/sg/en/content/sg/speeches/2012-11-14/statement-internal-review-panel-report-sri-lanka

එය හොඳින්ම දක්නට ලැබිණ. මෙම අවස්ථාවේ දී වසංගත තත්වයේ තුන්වැනි රැල්ලක් පවතින නිසා විවාදය කල් දැමීමට විපක්ෂය ඉල්ලා සිටිය ද විවාදයට දින දෙකක් වෙන් කිරීමේ ආණ්ඩුවේ තීරණය නොවෙනස්ව තබා ගැනීමට ආණ්ඩුවට හැකි විය. කතා කිරීමට නියමිතව සිටි විපක්ෂයේ සමහර මංත්‍රීන් අත් අඩංගුවට ගෙන රඳවා ගත් අතර වෙනත් අයට වර්ගවාදී අපහාස වලින් හිරිහැර කිරීමෙන් ප්‍රහාර එල්ල කෙරිණ.

පෙර නොවූ විරූ සෞඛ්‍ය සහ ආර්ථික අර්බුදයක් හමුවේ විපක්ෂයට එක්සත් වීමට නොහැකිවීම පවතින දේශපාලන වාතාවරණ කියා පායි. මීට අඩ වශයෙන් දැක්මක් සහ දේශපාලන විචක්ෂණයක් නොමැතිවීම හේතු විය හැකිය. සමගි ජන බලවේගය බහුතර මතවාදී ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීමේදී පොදු ජන පෙරමුණට සමාන ස්ථාවරයක සිටීමෙන් සුළුතරය කොන් කරන්නේයැයි බොහෝ දෙනකු අදහස් කරයි. මෙය ඡන්ද දායකයින් කලකිරීමට පත්ව අනාගත ඡන්ද විමසීමකදී සහභාගිත්වය අඩු වීමට හේතු විය හැකිය.

මෙහිදී අතීතයේ දේශපාලන විසඳුමක් සහ ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර සංශෝධන වෙනුවෙන් කළ සාර්ථක උද්ඝෝෂණ ව්‍යාපාරය සිහිපත් කළ හැකිය. එවැනි ව්‍යාපාරවලට සුළුතරයේ සහාය හිමි විය. මේ ආකාරයට සැලකිය යුතු ඡන්ද පදනමක් කොන් කිරීම මැතිවරණ පසුබෑමකට ප්‍රධාන හේතුවක් විය හැකි අතර සිංහල ජාතිවාදී බලවේග වඩාත් ශක්තිමත් කරනු ඇත.

සුළුතරය ඇතුළත් විපක්ෂ කණ්ඩායම්වලට හඳුනා ගත් කරුණු පිළිබඳව පොදු වේදිකාවකට පැමිණිය හැකිනම් එය ජාතික දේශපාලනය සහ මැතිවරණ කෙරේ බලපෑමක් විය හැකිය. වසංගත තත්වයට ප්‍රතිචාර දැක්වීමේදී දැක්වූ කලමනාකරණ අකාර්යක්ෂම භාවය, පරිසර විනාශය, ආර්ථික අර්බුදය සහ තවත් පසුබෑම් කීපයක්ම ආණ්ඩුවේ දුර්වලතාවය පෙන්නුම් කරන උදාහරණ යි. එය විපක්ෂය පණ ගැන්වීමට අවස්ථාවක් වුවද නිශ්චිත කාරණයකින් ඔබ්බට යන තිරසර ආකාරයකින් එල ගැන්වෙන තත්වයකට මෙතෙක් පත්ව නැත. අභියෝග උත්සන්න වෙමින් පැවතිය දී අතීතයේ දී මෙන් දැනට සහ ආසන්න අනාගතයේ මුහුණ දීමට සිදු විය හැකි සැබෑ තර්ජනවලට අභියෝග කළ හැකි විවිධ වූ ප්‍රජාතන්ත්‍රීය බලවේගයක් ගොඩ නැගීමට විවිධ වූ දේශපාලන එකතුන්ට හැකි වන්නේ ද යන්න ගැන විමසිලිමත් විය යුතුය.

දුර්වල විපක්ෂයට හාත්පසින් ම වෙනස්ව විවිධ වූ පැතිවලින් ශක්තිමත් විරෝධතා මතු වේ. 20 වැනි සංශෝධනය සහ පෝර්ට් සිටි පනතට විරෝධය දැක්වීමේ දී යෝජිත ව්‍යවස්ථාවලට අභියෝග කිරීමට ආණ්ඩුවේම සභාගයට ඇතුළත් විවිධ වූ කණ්ඩායම් එකට එක් කෙරිණ. ආණ්ඩුව තුළින්ම සහ විපක්ෂය, සිවිල් සමාජය සහ වෙනත් අයගෙන් විරෝධයක් මතුවීම විවිධ වූ න්‍යාය පත්‍ර සහ වෙනස් මතවාදී පදනම් පෙන්නුම් කරයි.

ආණ්ඩුවේ මර්දනකාරී පියවරට, පීඩාවට පත් ප්‍රජාවගේ විරෝධය එල්ල විය. පොතුවිල් සිට පොලිකණ්ඩි දක්වා (P2P)පා ගමන විශේෂයෙන්ම දේශපාලන වැදගත්කමකින් යුත් උදාහරණයකි. විරෝධතාකරුවන් ගේ ඉල්ලීම් දහය වූයේ:

1. දෙමළ බහුතරයක් සිටින ප්‍රදේශවල ඉඩම් අල්ලා ගැනීම නතර කිරීම
2. දෙමළ ප්‍රදේශ හමුදාකරණය සහ උතුර සැලසුම් සහගතව සිංහලකරණය නතර කිරීම
3. මානව අයිතිවාසිකම් අපහරණය කිරීම් හෙළි කරන ජනමාධ්‍යවේදීන් සහ මානව අයිතිවාසිකම් අපහරණය කිරීම්වලට විරෝධය දක්වන සිවිල් සමාජ ක්‍රියාකාරීන් දඩයම් කිරීම නතර කිරීම
4. ගවයන් ඇති කරන දෙමළ ජනතාවට අයත් එළදෙනුන් මැරීම සහ ඔවුන්ගේ තණ කවන ප්‍රදේශ අත්පත් කර ගැනීම නතර කිරීම
5. යුද්ධයෙන් මිය ගිය අය සිහි කිරීමට ඉඩ දීම සහ ස්මාරක විනාශ කිරීම නතර කිරීම
6. කොවිඩ් 19න් මිය ගිය පුද්ගලයන් භූමදානය කිරීමට පනවා ඇති තහනම ඉවත් කිරීම
7. සුළුතරයේ තරුණයන් ඉලක්ක කර ගැනීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම නතර කිරීම
8. නඩු විභාගයක් නැතිව තවම සිර ගත කොට ඇති දෙමළ දේශපාලන සිරකරුවන් ගේ රඳවා ගැනීම අවසන් කිරීම
9. අතුරුදහන් කොට ඇති පුද්ගලයන්ගේ පවුල්වල ඉල්ලීම්වලට පිළිතුරු ලබා දීම

10. වතුකරයේ වැඩ කරන උඩරට දෙමළ ජනයා සඳහා දිනකට රු.1000ක වැටුපක් ගෙවීම[104]

මෙම පා ගමනේ දී දෙමළ සහ මුස්ලිම් දේශපාලකයන් සහ ක්‍රියාකාරින් එක්වීම වැදගත් ය. මෙම පා ගමන පීඩාවට පත් ප්‍රජාවේ දරා ගැනීම සහ මෑතක දී දක්නට නොලැබුණු ආකාරයට පීඩාවට පත් කණ්ඩායම් අතර සහාගයක් ගොඩ නැගීමට ඇති හැකියාවත් පිළිබඳ දර්ශකයකි. දේශපාලකයන් ගණනාවක් පා ගමනට සහභාගිවීමෙන් වැළැක්වීමට උසාවි නියෝග ලබා ගෙන තිබුණ ද බොහෝ දෙනෙක් විරෝධතාවය සංවිධානය කිරීමේ සහ ජනතාව දිරිමත් කිරීමේ මූලික භූමිකාවක් ඉටු කළහ. මුස්ලිම් සහ උඩරට දෙමළ ජනතාවගේ ගැටලු ඇතුළත් කර ගැනීම, උතුර සහ නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් දෙමළ ජනතාවට සුවිශේෂී වූ ගැටලු කෙරේ වැඩි වශයෙන්ම යොමු වූ උතුරු සහ නැගෙනහිර කලින් පැවති විරෝධතා සමග සැසඳීමේ දි කැපී පෙනෙන ලක්ෂණයකි. පසුගිය කාලයේ දී මෙම ප්‍රජාවන් අතර පැවතියේ විරසක වූ සම්බන්ධතාවයක් වුවත් මෙම පා ගමන රාජ්‍ය මර්දනයට ලක් වූ ප්‍රජාවන් අතර තමන්ගේම එක්සත් පෙරමුණක් ඇති කර ගැනීමට පදනමකි.

මෙම සහාග ගොඩ නැගීම සහ රාජ්‍යයේ මර්දනකාරී ක්‍රියාකාරකම්වලට විරෝධය දැක්වීම දිරි ගන්වන නමුත් එය දෙමළ-මුස්ලිම් සම්බන්ධතාවල පවතින ගැටලු සම්බන්ධයෙන් කෝකටත් තෛලයක් නොවේ. පා ගමනේ අවසානයේ දී පොලිකන්ඩි හි පැවති රැස්වීමේ දී දෙමළ ජාතිවාදීන් කළ ප්‍රකාශ එක අතකින් සහයෝගිතාවයක් ඇති කිරීම සංකීර්ණ කරවන අතර අනෙක් අතට පා ගමනේ දී මුස්ලිම් ගැටලු එකතු කර ගැනීම හුදෙක් සංකේතාත්මක කරුණක් බවට පත් කෙරේ. රජයට විරෝධය දැක්වීමේ පදනම වශයෙන් දෙමළ ජාතිවාදී චින්තනය යොදා ගැනීම, විශේෂයෙන් එල්ටීටීඊය උතුරෙන් මුස්ලිම් ජනතාව පලවා හැරීමේ ඉතිහාසය සහ භූමිය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් දෙමළ ජාතිවාදයේ වඩාත් පුළුල් මතවාදී බලපෑම් සමග ගැටේ.[105] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලයේ ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාව සාකච්ඡාවට ගැනීමට නියමිතව තිබීම ඒ අවස්ථාවේ ආණ්ඩුවේ ප්‍රතිචාරය උපක්‍රමීය වශයෙන් සංකීර්ණ කරවීය. ප්‍රතිචාර දැක්වීම විරෝධතාකරුවන් හෙළා දැකීමටත් ආණ්ඩුවේ ඡන්ද පදනම වන අන්ත ජාතිවාදීන් සැනසීමට සහ පා ගමනට එරෙහි මහජන මතය තහවුරු කිරීමටත් ප්‍රමාණවත් විය යුතුය. පා ගමනට එක් වූ පුද්ගලයන්ට එරෙහිව දඬුවම් කිරීමේ අදහස රජයේ ප්‍රතිචාරයේ ගැබ්වීම පුදුමයක් නොවේ. සහභාගි වූවන් අත් අඩංගුවට ගත හැකි බව මහජන ආරක්ෂක ඇමති සරත් වීරසේකර රූපවාහිනී සාකච්ඡාවක දී කිවේය. ''අපි උසාවි නියෝග ලබා ගත් නිසාත්, ඔවුන්ගේ ඡායාරූප අප සතුව තිබෙන නිසාත්, ඔවුන්ගේ වාහන අංක තිබෙන නිසාත්, මේ පුද්ගලයන් කවුද කියන එක අපි දන්නවා. අපිට ඔවුන්ට නඩු පවරා ඔවුන්ගේ වාහන සියල්ල රාජසන්තක කර ඔවුන් සිර ගත කරන්න පුළුවන්.[106]'' මෙම ප්‍රකාශනයෙන් පසුව සහභාගිවූවන්ට එරෙහිව නඩු ගණාවක් පවරන ලදී. ඉන් පසුව දෙමළ ජාතික සන්ධාන පාර්ලිමේන්තු මංත්‍රී ඒබ්‍රහම් සුමන්දිරන් ට බලවත් ජීවිත තර්ජනයක් තිබුනද ලබා දී තිබුණ විශේෂ කාර්ය සාධක බලකායේ ආරක්ෂාව සරත් වීරසේකර ඉවත් කෙළේය.[107] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ICCPR පනත යටතේ කලින් සඳහන් කළ අත් අඩංගුවට ගැනීම් සමග විවේචකයන් ඉලක්ක කර ගැනීමට සහ දඬුවම් දීමට වීරසේකර තම තනතුරේ බලය යොදා ගැනීම විසම්මුතියේ හඬ නිහඬ කිරීමට රාජ්‍යයේ ඇති පුළුල් යොමුවේ කොටසක් නියෝජනය කරයි.

## ඉඩම් පිළිබඳ ගැටුම් සහ සංහිඳියාවට ඇති බලපෑම

ඉහත කොටසේ සාකච්ඡා කළ සෑම කරුණක්ම විය යුතු ආකාරයටම 2019 පසුව නව ආණ්ඩුවේ පැමිණීමෙන් පසුව සමීක්ෂණ සාහිත්‍යයේ සහ ප්‍රසිද්ධ දේශපාලන සාකච්ඡාවේ දීර්ඝ වශයෙන් විභාගයට ලක්ව ඇත. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ අන්තර්-වාර්ගික සම්බන්ධතාවල ගමන් මාර්ගය අපට

---

[104]P2P විරෝධතාවයෙන් පසු සුමන්දිරන්ගේ විශේෂ ආරක්ෂාව ඉවත් කරයි' ( පෙබරවාරි 2021), ඩේලිඑෆ්ටී https://www.ft.lk/columns/STF-security-for-Sumanthiran-withdrawn-after-P2P-protest/4-712954

[105]මහේන්ද්‍රන් තිරුවරන්ජන් P2P පා ගමන සහ ඉන් ඔබ්බට: වාර්ගික බෙදීම් තුළ විරෝධය ගැන නැවත සිතීම (2021 පෙබරවාරි), ද මෝර්නිං https://www.themorning.lk/the-p2p-march-and-beyond-re-imagining-resistance-amidst-ethnic-polarisation/

[106]2021 පෙබරවාරි 8 හිරු සමග පැවති සම්මුඛ සාකච්ඡාව https://www.youtube.com/watch?v=7aXyseftLrw&t=3797s

[107]ඩී බී ඇස් ජෙයරාජ් P2P විරෝධතාවයෙන් පසුව සුමන්දිරන්ගේ STF ආරක්ෂාව ඉවත්කරයි (2021 පෙබරවාරි), ඩේලිඑෆ්ටී https://www.ft.lk/columns/STF-security-for-Sumanthiran-withdrawn-after-P2P-protest/4-712954

අවබෝධ කර ගැනීමට නම් තියුණු පරීක්ෂාවට ලක් කළ යුතු කරුණක් වන ගැටුම්වල මූලාශ්‍රයට මෙම විවාදයේ දී වැදගත් තැනක් හිමිව නැත. ඒ ඉඩම් පිළිබඳ ගැටලුවයි.

ගැටුමේ ගාමක බලවේගයක් ලෙස ඉඩම් ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. එවැනි ගැටුම්වල සංකීර්ණත්වය සහ මුල් බැස ගත් ස්වභාවය පෙන්වන සිද්ධීන් දශක ගණනාවක් තුළ පැතිර ඇත. ඒ ගැන සිද්ධීන් කීපයක් පමණක් නම් කරන්නේ නම්, සංවර්ධනය, වාරිමාර්ග සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බෙදා දීම, ජාතික ආරක්ෂාව සහ මතබේදයට තුඩු දී ඇති ආගමික ස්ථාන වැනි අවස්ථා වටා ගොණුව ඇත. මෙම ව්‍යාපෘතීන් සමහරක දේශපාලන සහ ආර්ථික ස්වභාවය සමහර සිද්ධීන් වඩාත් සංකීර්ණ කරවයි. සුළුතර ප්‍රජාවේ ඉඩම්වලින් ප්‍රදේශයේ වාර්ගික ජනවිද්‍යාත්මක සංයුතිය වෙනස් කිරීමට හා අවතැන් කිරීම සහ සුළුතර ප්‍රජාවේ ඉතිහාසය, සංස්කෘතිය වෙනස් කිරීමේ අරමුණ සමග මෙම ව්‍යාපෘතීන් බැඳී ඇති නිසා සුළුතර ප්‍රජාව ඒ දෙස වසර ගණනාවක් තිස්සේ බැලුවේ සැකයෙනි.

මෙම සංසිද්ධියේ තවත් පැතිමානයක් වන්නේ තම බලයට නතු වූ ප්‍රදේශවල ඉඩම් බෙදා දීමේ බලය හිමි කර ගත් එල්ටීටීඊය සහ වෙනත් සටන්කාමී කණ්ඩායම් ඇතුළත් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ භූමිකාවයි. ඔවුන්ට තම බල ප්‍රදේශයේ ඉඩම්වල හිමිකම, පාලනය, භාවිතය සහ පිවිසීමට බලපෑමක් කළ හැකිව තිබිණ. ඒ අනුව ඉඩම් දශක ගණනාවක් තිස්සේ ගැටුම්වලට හේතු සාධක විය. සමහර ගැටුම් ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය දක්වාම පවතින දීර්ඝ කාලීන ඒවාය.

තවත් පැතිමානයන් ද ප්‍රශ්නකාරී වටපිටාවට දායක විය.[108] මෙම පත්‍රිකාවේ සාකච්ඡා කරන ආකාරයට හමුදාකරණය උත්සන්නවීම මෙන්ම ඉඩම් ගැටලුවට මධ්‍යම ආණ්ඩුවේ භූමිකාව ප්‍රශ්නයක්ව තිබූ අතර තවමත් එසේම පවතී. මේවා සහ තවත් කරුණු පශ්චාත් යුද වසරවල ඉඩම් ගැටලුවේ සංකීර්ණතාවයට දායක වූ අතර සංහිඳියා ප්‍රයත්නයට පසුබෑමක් ද විය. දේශපාලන සහ ආගමික වුවමනාවන් සහ සහජීවනය, ආරක්ෂාව සහ පරිසරය කෙරේ බරපතළ බලපෑම් කරන ආර්ථික ව්‍යාපාතීන්ගේ නව පැතිමානයන් ද පවතින තත්වයට දායක වේ.

මෙම වර්ධනයන් දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ මහජන ඡන්දයෙන් තේරී පත් වූ පළාත් සභා ක්‍රියාත්මක නොවන සන්දර්භයක මධ්‍යම ආණ්ඩුවේ ආයතන ඉඩම් පිළිබඳ කරුණුවලදී වඩාත් ක්‍රියාකාරී භූමිකාවක් හිමි කර ගෙන ඇති පසුබිමක ය. නිදසුනක් වශයෙන් පහත දැක්වෙන සිද්ධීන් ගැන කෙරෙන සාකච්ඡාවලදී පැහැදිලි වන ආකාරයට කොළඹ ඇති රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ඉඩම් බෙදා වෙන් කිරීමේ දී සහ ඉඩම්වලට පිවිසීම, පාලනය සහ භාවිතය තීරණය කිරීමේ දී ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරයි. ආරක්ෂක අංශ සහ බෞද්ධ භික්ෂූන් සමග වැඩ කරන සිවිල් පරිපාලකයන් සහ කාර්ය සාධක බලකා සහ කමිටු[109] වැනි නව සංයුතීන් සමග බලය ඒකරාශිකර ගැනීම නව තලයකට පත්ව ඇත. ඉන් ප්‍රජාවන් අතර බිය, විමතිය සහ ගැඹුරු සැකය වඩාත් තීව්‍ර කිරීමෙන් දුර්වල සාමය නිරන්තරයෙන්ම අභියෝගයට ලක් කරයි.

## ජාතික උරුමය සහ පුරාවිද්‍යාව

ජාතික උරුමය හෝ නටඹුන් ආරක්ෂා කිරීම ආයුධයක් කර ගැනීම අලුත් දෙයක් නොවේ. පසුගිය වසර තුළ අලුතින් මතු වූ ප්‍රබෝධයත් සමග ඉඩම් හිමිකාරිත්වයේ සහ ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවල මෑතක දී සමහර ස්ථාන ජාතික උරුමයන් සේ හඳුනා ගෙන එම ඉඩම් වෙන් කිරීමේ උත්සාහයන් උත්සන්න කිරීම විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර එය යොදා ගැනීමත් දක්නට ලැබිණ. බොහෝ විට රහසිගතව කෙරෙන මෙවැනි මුලපිරුම්වලින්, තම ඉඩම්වලින් අවතැන් කොට මැතිවරණ දේශපාලනයට බරපතළ බලපෑමක් එන ආකාරයට ජනවිද්‍යාත්මක වෙනස්වීම් ඇති වන ආකාරයට නව ජනාවාස ඇති කරන්නේයැයි බියක් පීඩාවට පත් ප්‍රජාවන් තුළ පවතී.

මෙම කතිකාවේ 'ජාතික උරුමය' යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යන්න සහ රාජපක්ෂ ආණ්ඩුවේ සිංහල බෞද්ධ බහුතරවාදී ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන ආකාරයත් විවේචනයට ලක් කළ යුතුය.

[108] හිමිකාරිත්වය තහවුරු කිරීමට ලිපි ලේඛන නොමැතිවීම, සාවද්‍ය ලිපි ලේඛන යොදා ගැනීම, මුල් අයිතිකරුවන් අවතැන් කිරීම, ඉඩම් විකිණීමට බලහත්කාරය යොදා ගැනීම සහ පරිපාලනමය සංකූලතා වැනි කරුණු ගණනාවක් නිසා යුද සමයේත් පශ්චාත් යුද වසරවලත් පුද්ගලික සහ රජයේ ඉඩම්වල හිමිකාරිත්වය සහ පාලනය පිළිබඳ අභියෝග කිරීම් වැඩි විය.

[109] බෞද්ධ නායකයන් සහ ස්ථාන අතර ප්‍රවේශමෙන් සකස් කළ සම්බන්ධතාවය ජනාධිපති මැතිවරණ ව්‍යාපාරයේ දී ද දක්නට ලැබිණ. ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය ආරම්භ වූයේ කොළඹ පන්සලකින් වන අතර බෞද්ධ භික්ෂූහු ඊට ප්‍රබල සහායක් ලබා දුන්හ.

බෞද්ධ උරුමය ආරක්ෂා කිරීමට සහ බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ගෙන දීමට තමා වැඩි කැමැත්තක් දක්වන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අවස්ථා කීපයකදීම අවධාරණය කෙළේය. ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'සෞභාග්‍යයේ දැක්ම' තුළින් සියලු බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමත් ඒවා සංරක්ෂණය කිරීමත් තම යුතුකම බව සඳහන් කරයි. ඔහු මාසිකව රැස්වන බෞද්ධ උපදේශක මණ්ඩලයක් ද පත් කෙළේය.[110]

නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ කරුණු පරීක්ෂා කිරීම සඳහා නැගෙනහිර පළාත් පුරාවිද්‍යා කාර්ය සාධක බලකායක්[111] 2020 ජුනි මස පත් කරන ලදී. මෙම පළාතේ ප්‍රධාන ජන වර්ග තුනම නියෝජනය වුවත් කාර්ය සාධක බලකාය සමන්විත වූයේ බෞද්ධ භික්ෂූන් ඇතුළත් සිංහල සාමාජිකයන්ගෙන් පමණි. කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු වන එල්ලාවල මේධානන්ද හිමි නැගෙනහිර පළාතේ ස්ථාන 2000ක් පරීක්ෂා කොට බෞද්ධ උරුමයන් ලෙස හඳුනාගත් බව ප්‍රකාශ කෙළේය.[112] මෙවැනි ප්‍රකාශයන් කළ ද ස්ථාන 2000ක් හඳුනා ගත්තේ කුමන පදනමක් යටතේ ද යන්න පිළිබඳව තොරතුරු ප්‍රසිද්ධ කර නැත. එහෙත් මෙම ප්‍රකාශයෙන් සහ අනෙක් පියවරවලින් ප්‍රධාන ආගම ආරක්ෂා කිරීම සහ අනෙක් ආගම්වලට වඩා ප්‍රමුඛත්වයක් ලබා දීමේ එතරම් ශුක්ෂම නොවන වැඩ පිළිවෙළක් පෙන්නුම් කරයි.

වැඩි දුරටත් ජාතික උරුමය ආරක්ෂා කිරීම හමුදාකරණය සමග සමීපයෙන් බැඳී ඇත. කාර්ය සාධක බලකායේ ප්‍රධානියා වන්නේ හිටපු හමුදා නිලධාරියෙකු වන ආරක්ෂක ලේකම් ය. බෞද්ධ ස්ථානවල ප්‍රතිසංස්කරණ වැඩ සඳහා සහ මතභේදයට තුඩු දී ඇති ස්ථාන ආරක්ෂා කිරීමට යොදා ගෙන ඇත්තේ හමුදාවේ සහායයි.

කාර්ය සාධක බලකායේ වැඩ රහසිගතව සිදු වන අතර ප්‍රාදේශිකව ලබා ගැනීමට හැකි වන්නේ සීමිත තොරතුරක් පමණි. කාර්ය සාධක බලකායේ සමහර පුද්ගලයන් සහ ආණ්ඩුවට ඇති ඔවුන්ගේ සම්බන්ධතාවය සැලකිල්ලට ගත් විට කාර්ය සාධක බලකායෙන් ක්‍රියාත්මත කරන මුලපිරුම් නැගෙනහිර පළාතේ ඉඩම්වල හිමිකාරිත්වය සහ පාලනය පිළිබඳව සැලකිය යුතු බලපෑමක් කරන බවට සාධාරණ සැකයක් මතු වේ. එවැනි මුලපිරුම්වලින් නැගෙනහිර පළාතේ සුළුතරය වඩාත් පීඩාවට පත් විය හැකිය. බුද්ධි සේවා දුර්වල කිරීම, පූජ්‍ය ස්ථාන බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සහ පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ කිරීම පිළිබඳව ජනාධිපති මෑතක දී කළ ප්‍රකාශවලින් ද වත්මන් ආණ්ඩුවේ ආධාරකරුවන් වන අන්ත ජාතිවාදී කොටස්වල න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා හමුදා කරණය වූ සහ ව්‍යාප්තවාදී සිංහල ආයතන යොදා ගන්නා චින්තනය පෙන්නුම් කරයි.[113]

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෑත වසරවල, විශේෂයෙන්ම පහත සාකච්ඡා කෙරෙන සමහර ප්‍රදේශවල ඉඩම් පාලනය පිළිබඳව වැඩි භූමිකාවක් ඉටු කරන බව මාධ්‍ය වාර්තා සහ ප්‍රදේශයේ ජනතාව පෙන්වා දෙති.[114] පවතින රහසිගත භාවය සහ නිසි ක්‍රියා පටිපාටියක් නොමැතිවීම නිසා කාර්ය සාධක බලකාය සහ මධ්‍යම ආණ්ඩුවේ අනෙකුත් ආයතන සුළුතර ප්‍රජාවගේ ඉඩම් අත්පත් කර ගැනීමට උත්සාහ කරන්නේයැයි බියක් ඔවුන් තුළ පවතී. වාර්තා වූ එවැනි අවස්ථා කීපයකටම බෞද්ධ භික්ෂූන්ගේ සහභාගිත්වය ද තිබිණ.

මතභේදයට තුඩු දි ඇති විශේෂ ස්ථානයක් වන්නේ අම්පාරේ මුතු මහා විහාරය යි. පුරාවිද්‍යා කාර්ය සාධක බලකායේ ප්‍රධානි මෙන්ම ආරක්ෂක ලේකම් 2020 වසරේ මෙම ස්ථානයට ගොස් පන්සලට උපරිම ආරක්ෂාව ලබා දෙන ලෙස නියෝග කෙළේය.[115] මෑතක සිට යොමුව ඇති අවධානය සහ ආරක්ෂක හමුදා සිටීම දශක ගණනාවක් තිස්සේ තමන් පදිංචිව සිටි සහ වගා කළ ඉඩම් තමන්ට අහිමි කරනු ඇතැයි බියක් ප්‍රදේශයේ ජනතාව තුළ ඇත. දැනට පදිංචි වී සිටින සහ වගා කරන තමන්ගේ ඉඩම් අත් කර ගැනීමට පන්සලේ භික්ෂුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කරන්නේයැයි ඔවුහු පවසති. හේතු ගණනාවක් නිසා මතභේදයට තුඩු දී ඇති ස්ථානයක් මෑතක දී

---

[110] නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරයා 'සමාජ අසාධාරණය පිළිබඳ කමිටුවක්' පත් කළ අතර එහි වැඩ කටයුතු 2021 ජනවාරි සිට ඇරඹිණ.

[111] 2020 ජුනි 2 දින අංක 2178/17 විශේෂ ගැසට් පත්‍රයෙන් පිහිටුවන ලදී.

[112] උතුර සහ නැගෙනහිර පුරාවිද්‍යා කැනීම්: ස්ථාන 10ක වැඩ ඇරඹේ. (2021 ජනවාරි) ද මෝර්නිං https://www.themorning.lk/antiquities-excavation-in-north-east-work-commences-on-10-sites/

[113] 2021 ජුනි 25 ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ කතාව

[114] අදාල පනත් කීපයක් වන්නේ 1940 අංක 09 පුරාවස්තු ආඥා පනත සහ සංශෝධන, 1998 පුරාවස්තු (සංශෝධන) පනත. විෂය භාර ඇමතිවරයාට පුරාවිද්‍යා ස්ථාන නම් කර ගැසට් කිරීමට පුළුල් බලතල තිබෙන නිසා ඒ අනුව සුළුතර ප්‍රජාව වැඩි වශයෙන්ම සිටින ප්‍රදේශ එසේ හඳුනා ගනු ඇතැයි බියක් ඔවුන් තුළ පවතී.

[115] ඉඩම් අයිතිය සඳහා වන ජනතා ව්‍යාපාරයෙහි ප්‍රකාශනය, 2020 මැයි 20

ගත් මුලපිරුම් නිසා ප්‍රදේශයේ උණුසුම්කාරී තත්වයක් පැවතීමට තවත් උදාහරණයකි. ඉන් තමන්ගේ ඉඩම්වලින් ඉවත් කරන්නේයැයි සුළුතර ප්‍රජාව තුළ ඇති බිය වඩාත් තහවුරු කරයි.

අම්පාර දිස්ත්‍රික්කයේ මතභේදයට තුඩු දුන් තවත් ස්ථාන ඇත. තවත් ප්‍රකට ස්ථානයක් වන්නේ දීඝවාපි යයි. පන්සල අවට ඇති විශාල භූමි ප්‍රදේශයක් පන්සලට අයත්යැයි පැවසේ.[116] පන්සල අවට බොහෝ ප්‍රදේශයක ඓතිහාසික සහ ආගමික වැදගත්කමකින් යුත් නටඹුන් රාශියක් ඇති නිසා තවත් ඉඩම් ඇතුළත් කොට ගැසට් පත්‍රයක් නිකුත් කළ යුතුයැයි බහුතරයේ බොහෝ දෙනකු කියති. 2021 පෙබරවාරි මස දීඝවාපි භාරකාර අරමුදල පිහිටුවීමෙන් පසුව ජනතාවට ප්‍රදේශයේ බුදු පිළිම ප්‍රතිසංස්කරණය සඳහා දායක විය හැකිය.[117] මාධ්‍ය වාර්තා අනුව ප්‍රතිසංස්කරණ කටයුතු කරනු ඇත්තේ හමුදාව සිවිල් ආරක්ෂක බලකායේ සහාය ඇතිව ආරක්ෂක ලේකම් ගේ සහ පුරාවිද්‍යා කාර්ය සාධක බලකායේ මූලිකත්වයෙනි.

ජාතික උරුමය සහ පුරාවස්තූන් ආරක්ෂා කිරීමේ මුවාවෙන් නැගෙනහිර පළාතේ තවත් ස්ථාන කීපයක ඉඩම් අත්පත් කර ගැනීමේ බයක් පවතී. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලික සහ රජයේ ඉඩම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ සූදානමක් පවතින බවට ප්‍රදේශයෙන් වාර්තාවේ. ගැසට් නිවේදන නිකුත් කිරීමේ ප්‍රයත්නයක් කීපයක් ගැන ත්‍රිකුණාමලය උපරිමාධිකරණයේ නඩු පවරා ඇත. ඒ අනුව නිලධාරීන්ට එම ඉඩම්වලට පිවිසීම වළක්වන සහ ආගමික පන්සල්වලට ඉඩම් ලබා දීමේ පියවර ගැනීමෙන් වළක්වන අධිකරණ නියෝග නිකුත් කර ඇත.

තවත් සිද්ධියක් වන්නේ මුස්ලිම් සහ දෙමළ ප්‍රජාව දශක ගණනාවක් තිස්සේ පදිංචි වී සිටින සහ වී වගාව කරන මූතූර් හි ප්‍රදේශයකට බෞද්ධ පන්සලක් අයිතිවාසිකම් කීම නිසා බලපෑමට ලක්ව තිබීම ය. මූතූර් කෝට්යාරාම මුල්ල මහා විහාරය නමින් හැඳින්වෙන මෙම පන්සල ඉදි කර ඇත්තේ 2018 දීය. එම ඉඩම් මැනීමට කීප අවස්ථාවක්ම ගොස් ඇති නමුත් එය වැළකී ඇත්තේ ප්‍රදේශයේ ජනතාවගේ විරෝධය නිසා ය. දැනට ඒ පිළිබඳව නඩුවක් මූතූර් මහෙස්ත්‍රාත් උසාවියේ ගොණුකර ඇත.[118]

ඊට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතට පත් කිරීම සඳහා මායිම් ගල් දැමීමේ අදහසින් ඉඩම් මැනීමට අවස්ථා කීපයකදීම උත්සාහ ගෙන තිබිණ. මැයි මාසයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වවුනියාවේ නෙදුන්කර්නි වන සංරක්ෂණයේ පුරා වස්තු ඇති ස්ථානයක් සොයා ගෙන ඇති බවට මාධ්‍ය වාර්තා පළ විය.[119] මාධ්‍ය වාර්තා අනුව මෙම ස්ථානය පිළිබඳ තොරතුරු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා යුද හමුදාවේ 16 වැනි සිංහ රෙජිමේන්තුව විසිනි. ජනවාරි මාසයේ දිනක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යාපනය දිස්ත්‍රික්කයේ කන්දරොඩේ හි ස්ථානයක ඉඩම් කොටසක් මැනීමට ගිය අවස්ථාවේ එය ප්‍රදේශයේ පාර්ලිමේන්තු මංත්‍රීට දැන ගැනීමට ලැබීමෙන් ඔහු පැමිණ එය නතර කෙළේය. 2020 නොවැම්බර් මස මඩකලපුව දිස්ත්‍රික්කයේ මලෙයි කුමාරන් කෝවිලේ ද මෙවැනිම සිද්ධියක් දක්නට ලැබිණ. ප්‍රදේශයේ අය පවසන ආකාරයට මෙම හින්දු කෝවිල ශත වර්ෂ ගණනාවක් පැරණි වන අතර ප්‍රදේශයේ ජනතාව දශක ගණනාවක් තිස්සේ එහි පුද පූජා කරති. 2020 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එහි පැමිණ මායිම් ගල් දමා ඇත. ඒ ගැන පෙර දැනුම් දීමක් නොවූ අතර අසළ තිබූ ශිලා ලිපියක් ද විනාශ කර ඇත. ඒ ආකාරයටම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිරියායි ගමේ දෙමළ ගොවීන් ශත වර්ෂ ගණනාවක් තිස්සේ වගා කළ ඉඩම් අක්කර 950ක ප්‍රදේශයක් ආවරණය වන ආකාරයට මායිම් ගල් දමා ඇත. මෙවැනිම සිද්ධීන් ත්‍රිකුණාමලයේ තෙන්මරවඩි සහ ඉරණයික්කර්නි හි සිදු කර ඇත. මෙම බාධාවන් නිසා ගොවීන්ට එහි යා නොහැකිව තම ඉඩම්වලට පිවිසිය නොහැකි විය.

---

[116] වැඩි විස්තර සඳහා බලන්න - පූජනීය ස්ථාන සහ අසහ්‍ය දේශපාලනය: ආගමික ස්ථාන සහ ජනවාර්ගික සබඳතා පිළිබඳ ආතතීන්, මුස්ලිම්වරුන් සඳහා ලේකම් කාර්යාලය, 2015

[117] දීඝවාපිය ප්‍රතිසංස්කරණයට අරමුදලක් පිහිටුවයි. (2020 අගෝස්තු), ඩේලි නිවුස් http://www.dailynews.lk/2020/08/31/local/227403/fund-be-set-renovate-deegawapiya

[118] නිදසුනක් වශයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැසට් කිරීමට හඳුනා ගත් ස්ථන 600කට අධික සංඛ්‍යාවක් දක්වයි. එය උතුර සහ නැගෙනහිර කිසියම් දිස්ත්‍රික්කයකින් හඳුනා ගෙන ඇති ඉහළම සංඛ්‍යාවයි. අම්පාර දිස්ත්‍රික්කය සඳහා ද එවැනිම ලැයිස්තුවක් පවතින බව එහි වෙසෙන අය පවසති. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අයදුම් පතක් අනුව මන්නාරම දිස්ත්‍රික්කයේ ස්ථාන 26ක්, මුලතිවු හි ස්ථාන 53ක් හා වවුනියා දිස්ත්‍රික්කයේ ස්ථාන 43ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පරීක්ෂාවට පත් කිරීමට හඳුනා ගෙන ඇත. ක්ෂේත්‍ර චාරිකා 2021 පෙබරවාරි සහ මාර්තු

[119] වවුනියා වන සංරක්ෂිතයේ පුරාවිද්‍යාත්මක සොයා ගැනීමක්", සන්ඩේ ටයිම්ස්, 2021 මැයි 18

ඉහත සඳහන් විස්තරය සිංහල බෞද්ධ බහුතරවාදීන් සමහර ස්ථාන ප්‍රමුඛතා ගත කොට ආරක්ෂා කිරීමට 'ජාතික උරුමය' යන්න යොදා ගන්නා ආකාරය පිළිබඳ දර්ශකයකි. එම ක්‍රියාවලියේ දී සුළුතර ප්‍රජාව සහ ඉඩම්වලට ඇති ඔවුන්ගේ අයිතිව බැහැර කෙරේ. මෙම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම ආණ්ඩුවේ ආයතන සහ ආරක්ෂක හමුදා යොදා ගන්නා නිර්ලජ්ජා සහගත ආකාරය ප්‍රදේශයේ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවගේ බිය දැඩි කරන අතර සැකය සහ විරසක භාවය තහවුරු කරයි.

පශ්චාත් යුද කාලයේ උතුර සහ නැගෙනහිර, දඹුල්ල, කුරුණෑගල සහ තවත් තැන් ඇතුළු ශ්‍රී ලංකාව පුරාම පාහේ ආගමික පැතිමානයකින් ඉඩම් සඳහා ආරවුල් හට ගෙන ඇති බව දක්නට ලැබිණ.[120] මෙවැනි අවස්ථා කීපයකදීම බෞද්ධ භික්ෂූන් රජයේ සහාය ඇතිව ඉඩම් පිළිබඳ පාලනය ලබා ගෙන සුළුතරයට එම ඉඩම්වලට පිවිසීම සහ/හෝ භාවිතය වළක්වා ඇත. සුළුතරයට වැදගත්කමකින් යුත් ආගමික ගොඩනැගිලි හෝ ඓතිහාසික ස්ථාන විනාශ කිරීමේ අවස්ථා කීපයක්ම වාර්තා වේ. එමෙන්ම ආරක්ෂක හමුදාව අත්පත් කර ගෙන සිටින ප්‍රදේශවල ඇති ආගමික ගොඩනැගිලි විනාශ කළ අවස්ථා ද වාර්තාවේ.

මෑතක දී මුලතිවු දිස්ත්‍රික්කයේ කුරුන්තුමලෙයි කෝවිල ප්‍රවෘත්තියක් බවට පත් වූයේ රාජ්‍ය ඇමති විදුර වික්‍රමනායක එහි තිබූ ත්‍රිශූලයක් විනාශ කොට ඒ වෙනුවට බුදුරුවක් තැන්පත් කිරීම නිසාය.[121] යුද්ධයෙන් පසු වසරවල ප්‍රදේශයේ ආරක්ෂක හමුදා ප්‍රමාණය වැඩි වූ අතර 2020 දී එම ප්‍රදේශයේ ඉඩම් මැනීමක් සිදු කර 'කුරුඳු විහාරය' නමින් 2020 දෙසැම්බර් 14 දිනැති පිඹුරු පතක් සකස් කර ඇති බව ප්‍රදේශ වාසිහු පවසති. මෑතක පළ වූ මාධ්‍ය වාර්තා අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම ප්‍රදේශයේ අක්කර 81ක් තරම් වූ භූමි ප්‍රදේශයක් අත්පත් කර ගැනීමට සූදානම් වේ. එය ප්‍රදේශයේ ජනතාව ද සහතික කරති.[122] වැඩි දුරටත් මෙම ප්‍රදේශය 1921 දී නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතට පත් කර ඇති බව ප්‍රදේශයේ වැසියෝ පවසති. එය නොසලකා එහි ඉදි කිරීම් කටයුතු සිදුවේ. පුරා විද්‍යා දෙපාර්මේන්තුව සහ හමුදාව එහි ඇති ඓතිහාසික හින්දු පූජනීය ස්ථාන විනාශ කොට බෞද්ධ පන්සලක් ඉදි කරනු ඇතැයි බියක් එම ජනතාව තුළ පවතී. මෙම කරුණ පිළිබඳව නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

තවත් පැතිමානයක් වන්නේ බහුතරයේ ආගමට වාසිවන ආකාරයට ඉඩම් බෙදා දීම සිදු කිරීමෙන් සුළුතරයේ ඉඩම් අයිතිය නැතිවන්නේයැයි පවතින බියයි. නිදසුනක් වශයෙන් බෞද්ධ කටයුතු පිළිබඳ අමාත්‍යංශය 2020 නිකුත් කරන ලද ගැසට් නිවේදනයකට[123] අනුව කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් හෙක්ටෙයාර් 137.73ක් ( අක්කර 340.33ක්) රජයේ ඉඩම්යැයි බෞද්ධ ස්ථාන අටකට වෙන් කර දී ඇත. ප්‍රදේශයේ ජනතාව පවසන ආකාරයට මෙම ඉඩම් අයත්වන්නේ සුළුතර ප්‍රජාවේ ජනතාවටය. හිමිකම තහවුරු කිරීමේ ලියකියවිලි ඔවුන් සතුව පවතී.[124] පන්සල් පිහිටුවීමත් සමග බහුතර ප්‍රජාවේ ජන කොටස් පදිංචි කරවීමේ ජනාවාස ඉදි කිරීමෙන් ප්‍රදේශයේ ජන සංයුතිය වෙනස් වනු ඇතැයි බිය තහවුරු වේ.

ස්ථාන කීපයකම යුද්ධයට පෙර බෞද්ධ පන්සල් තිබුණේ නැති බවත් නව ස්ථාන ඉදි කර ඇත්තේ මධ්‍යම ආණ්ඩුවේ සහ හමුදාවේ සහාය ඇතිව බවත් ප්‍රදේශයේ ජනතාව පවසති.

විවිධ ආගම් සහ ප්‍රජාවන් අතර දක්නට ලැබෙන ඉඩම් පිළිබඳ ගැටුම් පුළුල් බලපෑම් ඇති කළ හැකිය. එවැනි ස්ථාන ගණනාවක් උතුරේ සහ නැගෙනහිර දැකිය හැකිය. නිදසුනක් වශයෙන් මන්නාරමේ තිරුකේෂ්වරන් කෝවිල සහ කතෝලික පල්ලිය අතර ආරවුලක් හට ගෙන ඇත්තේ තිරුකේෂ්වරන් කෝවිලට යන මංසන්ධියේ ආරුක්කුවක් ඉදි කිරීමට උත්සාහ ගත් නිසාය. ආරුක්කුව ඉදි කිරීමට කතෝලික පල්ලිය විරුද්ධ විය. පසුව එම ආරවුල උසාවිය ඉදිරියට යැමට තරම් දීර්ඝ විය.

---

[120] වැඩි විස්තර සඳහා බලන්න: සිද්ධස්ථාන සහ මිථ්‍යාදෘෂ්ටික දේශපාලනය: ආගමික සිද්ධස්ථාන සහ වාර්ගික සබඳතා ගැන උණුසුම් තත්වයක් මුස්ලිම් මහ ලේකම් කාර්යාලය 2015

[121] ශ්‍රී ලංකාවේ ඇමති දෙමළ කෝවිලක ඉඩම් අල්ලා ගැනීමට බෞද්ධයන් යොමු කරයි. (2021 ජනවාරි) ටැමිල් ගාඩියන් https://www.tamilguardian.com/content/sri-lankan-minister-leads-buddhist-landgrab-tamil-temple

[122] උතුර සහ නැගෙනහිර පුරා වස්තු කැනීම: ස්ථාන 10ක වැඩ ඇරඹේ (2021 ජනවාරි), ද මෝර්නිං ක්ෂේත්‍ර සංචාරය 2021 පෙබරවාරි; https://www.themorning.lk/antiquities-excavation-in-north-east-work-commences-on-10-sites/

[123] 2020 ඔක්තෝබර් 2 නිකුත් කරන ලද අංක 2196 ගැසට් පත්‍රය

[124] 2021 පෙබරවාරි සහ මාර්තු ක්ෂේත්‍ර චාරිකාවන්

ආගමික පූජ්‍යස්ථාන පසුගිය දශක කීපයක කාලක් තුළ අවස්ථා කීපයකදීම ගැටුම් ඇති වීමට හේතු විය. ඉන් සමහර ගැටුම් යුද්ධයෙන් පසුව හටගත් අතර සමහර ඒවා යුද්ධය පැවති කාලය දක්වාම දිව යයි. මෑත වසරවල ආගමික සුළුතරය හා සම්බන්ධ පූජ්‍යස්ථානවලට ප්‍රහාර එල්ල කිරීමේ වැඩිවීමක් දක්නට ලැබුණ අතර ඒවා සිදු කළ අයට එරෙහිව පියවර ගෙන ඇත්තේ අවස්ථා කීපයකදී පමණක් බව ලිපි ලේඛනවලින්[125] පෙන්නුම් කරයි. මෙය සිදුව ඇත්තේ රාජ්‍ය අනුබලය ලත් ප්‍රචණ්ඩත්වය මහත් අනතුරුදායක මට්ටමකට උත්සන්න වී ඇති පසුබිමක ආගමික සුළුතරය ඉලක්ක කර ගත් පෙළඹවීම් වඩාත් වැඩවිමත් සමග ය.[126] අලුත්ගම සහ දිගන යන ස්ථානවල ප්‍රචණ්ඩ ක්‍රියා හටගත් අතර පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් ප්‍රජාවේ දේපොළ හා ආගමික ස්ථාන ඉලක්ක කර, මනාව සැලසුම් කළ ප්‍රහාර එල්ල විය. අන්තවාදි සිංහල බෞද්ධ කණ්ඩායම්වල සහ සමහර අවස්ථාවල බෞද්ධ භික්ෂූන්ගේ සම්බන්ධතාවය පැහැදිලිව දැක්වෙන සාක්ෂි තිබුණ ද වරදකරුවන්ට දඬුවම් කිරීම සඳහා කිසිම ආකාරයේ නඩු පැවරීමක් සිදු වූයේ නැත. මුක්තිය හිමිවන මෙවැනි පරිසරයක රජය වැරදිකරුවන් ආරක්ෂා කරන්නේය යන හැඟීමක් සුළුතරයේ බොහෝ කොටස් තුළ ඇතිවීම සිංහල බෞද්ධ බහුතරවාදය පෝෂණය කෙරෙන තෝතැන්නක් වී නව විභේදන රේඛා හටගෙන පවතින ගැටුම් දිගටම පවතින තත්වයක් උදා වනු ඇත.

## ඉඩම්, වාරිමාර්ග සහ සංවර්ධන යෝජනා ක්‍රම

කෘෂිකර්මය සහ ආහාර නිෂ්පාදනය නගා සිටුවීම සම්බන්ධයෙන් ආණ්ඩුව සිවිල් ආරක්ෂක බලකාය යොදා ශ්‍රී ලංකාව පුරා වැව් 5000ක් පුනරුත්ථාපනය කිරීම සඳහා 'වාරි සෞභාග්‍යය' වැඩ සටහන හඳුන්වා දුන්නේය.[127] වසංගත තත්වයෙන් ජීවන මාර්ග සහ ආහාර සුරක්ෂිත භාවය කෙරේ විපත්කර බලපෑමක් ඇති කිරීමත් සමග ආර්ථිකය නගා සිටුවීම සහ ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා බැසිල් රාජපක්ෂගේ නායකත්වයෙන් ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවන ලදී. වැව් පුනරුත්ථාපනය සහ ගොවීන්ට ජලය ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද මුලපිරුමක් වුවද එවැනි මුලපිරුම්වලට ප්‍රායෝගික අභියෝග සහ දේශපාලන බලපෑම්වලට මුහුණ දීමට සිදු විය. වාරි මාර්ග යෝජනා ක්‍රම අතීතයේ දී රාජ්‍ය ගොවි ජනපද පිහිටුවීමේ වැඩ සටහනේ ආකාරයක් ලෙස යොදා ගන්නා ලදී. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය වාරි මාර්ග අවශ්‍යතා සපුරාලීමට ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් වුවද ඊට ගැටුම් කීපයකට[128] මුහුණ දීමට සිදු විය. බොහෝ අවස්ථාවල උතුරු සහ නැගෙනහිර ප්‍රාදේශීය නිලධාරීන් සමහර වැඩ සටහන්වල විස්තර කිසිවක් දැන සිටියේ නැත. සියලු තීරණ ගනු ලැබුවේ කොළඹ පදනම්වය. අවධානය යොමු කළ යුතු එවැනි සිද්ධීන් දෙකක් වන්නේ මහවැලි එල් කලාපය යටතේ ඉඩම් බෙදා දීම ය. ඉඩම් බෙදා දීම 1988 සිටම බහුතර ප්‍රජාවට වාසි සැලසෙන ආකාරයට සිදුවන බවට වාර්තා තිබිණ.[129] එල් යෝජනා ක්‍රමය දෙමළ ජනතාව පදිංචි වී සිටි ප්‍රදේශවලට බහුතරයේ ප්‍රජාව ක්‍රමානුකූලව ගෙනෙන ආකාරය උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ නිලධාරීහු පවසති. කලින් දෙමළ නම් තිබූ ගම්වලට සිංහල නම් යෙදූ ආකාරය ද දැකිය හැකිය.[130]

මහවැලි බී කලාපයට අයත් වන්නේ පොළොන්නරුව සහ මඩකලපුව දිස්ත්‍රික්කයි. මඩකලපුවේ ඉඩම් බඩ ඉරිඟු වගාවට වෙන් කර තිබූ අතර ඒවා ප්‍රදේශයෙන් පිටත සිංහල ගොවීන්ට ලබා දීමට සූදානම්යැයි චෝදනා මතු වී තිබිණ. දැන් මහවැලි බී කලාපයේ මාදුරු ඔය දකුණු ඉවුරේ ගැටුමක් හටගෙන ඇත. මෙම ප්‍රදේශය කලින් දෙමළ ගොවීන් ගවයන් තණ කැවීමට යොදා ගත් නමුත් පොළොන්නරුවේ සහ අම්පාර දිස්ත්‍රික්කවලින් ගෙනවිත් පදිංචි කරන ලද සිංහල ගොවීන් සමග ගැටුම් ඇති විය. සිංහල ගොවීන්ට නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරයාගේ සහ වෙනත් නිලධාරීන්ගේ සහයෝගය ලැබුණ නිසා ගවයන් තණ කැවීමට ආ ජනතාවට ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට මුහුණදීමට සිදු වූ

125 අගතිය සහ අනුග්‍රහයඃ ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දූන්ට එරෙහි ප්‍රචණ්ඩතවය පිළිබඳ විශ්ලේෂණයක් , NCEASL 2021

126 මහනුවර දිස්ත්‍රික්කයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය පිළිබඳ තොරතුරු සෙවීමේ වාර්තාව 2018 මාර්තු (2021), Law and Society Trust Ibid; https://www.lstlanka.org/publications/reports/fact-finding-report-on-the-anti-muslim-violence-in-the-kandy-district-march-2018

127 වැව් 5000ක් වහාම පුනරුත්ථාපනය කිරීමට ජනාධිපති උපදෙස් දේ (2020 සැප්තැම්බර්)' Lanka Business Online https://www.lankabusinessonline.com/president-instructs-to-rehabilitate-5000-tanks-immediately/

128 මහවැලි අධිකාරිය භාර ඇමතිවරයාට විශේෂ ප්‍රදේශ නම් කිරීමට, කෘෂිකර්ම සහ සංවර්ධන කාර්යන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සහ බෙදා දීමට පුළුල් බලතල ලබා දෙන ලදී. එවැනි බලතල අතීතයේ දී නව ගොවි ජනපද හඳුන්වාදීමට ව්‍යාපෘති ආරම්භ කිරීමට යොදා ගත් අතර ඒ සමග ජන සංයුතියේ වෙනස්කම් ඇති කරන්නේයැයි බියක් ද විය.

129 මෙම ගැටලුවේ වාර්ගික සහ දේශපාලන පැතිමාන පිළිබඳ වැඩි විස්තර මෙහි ලබා ගත හැකිය. භවානි ෆොන්සේකා සහ දර්ශා ජෙගදීශ්වරන්, ''ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ඉඩම් අත්පත් කර ගැනීම හා අදාළ ගැටලු සහිත දේශපාලනය, ප්‍රතිපත්තීන් සහ භාවිතයන්, "විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2013 නොවැම්බර් 19

130 නිදසුනක් වශයෙන් කලින් මුන්දිහෙකුලම්, පාදකලුකුලම් පුමාදකන්දාල් නමින් හැඳින් වූ ස්ථාන දැන් හැඳින් වෙන්නේ ජානකපුර, සමුදුවැව, නෙළුම් වැව යනුවෙනි. ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡාව වර්ෂ 2021

අතර ඔවුන්ගේ දේපොළ ද විනාශ කළ අවස්ථා වාර්තා විය. වී වගා කන්නයේ දී ප්‍රශ්නයට ලක්ව ඇති ප්‍රදේශයේ තණ කැවීමට ගෙන ආ ගවයන් 200,000කට ආසන්න සංඛ්‍යාවක් පීඩාවට පත් වූ බව ප්‍රදේශයෙන් ලැබුණ වාර්තාවල සඳහන් විය.[131] 2020 අප්‍රේල් සිට බහුතර ප්‍රජාව, මහවැලි අධිකාරියේ සහාය ඇතිව එම ප්‍රදේශයට අනවසරයෙන් ඇතුලු වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගවයන්ට තණ කැවීමට නොහැකි විය. එය ප්‍රදේශයේ කිරි නිෂ්පාදනය පහත වැටීමට හේතු වූ අතර එය ජාතික කිරි සැපයුමට ද බලපෑමකි. මෙම කරුණ දැන් මඩකලපුවේ අධිකරණය සහ අභියාචනාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

## ස්වභාවික සම්පත් සහ නව ගැටුම්

ඉඩම් පිළිබඳ තවත් පැතිමානයක් වන්නේ මෑත වසරවල නව ගැටුම් කරා වර්ධනය විය හැකි උත්සන්නවීමේ අවසානාවන්ත තත්වයයි. සංරක්ෂණය ප්‍රමුඛතාවයක් බව නිල ප්‍රකාශනවල සඳහන් වුවද, ඉඩම්, ජලය, ජීවන මාර්ග සහ පරිසරයට දීර්ඝ කාලීන බලපෑම් විය හැකි විනාශ සිදු කිරීමේ භයානක ප්‍රවනතාවයක් හෙළි කරන සිද්ධීන් රැසක් මෑතක දක්නට ලැබිණ.

ආර්ථික පුනර්ජීවනය ප්‍රමුඛතාවය කර ගත් තාක්ෂණ තාන්ත්‍රීය සහ හමුදාකරණය වූ පාලන මොඩලය ස්වභාවික සම්පත්, වන ජීවී සහ පරිසරය ආරක්ෂණය සඳහා වූ ක්‍රියා පටිපාටි නොසලකා හරියි. මේ දක්වා සමුද්‍ර ජීවීන්ට, ජීවන මාර්ගයන්ට සහ පරිසරයට විනාශකාරී බලපෑම් කළ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ හට ගත් ගින්න, නිසි අවධානයක් නොමැතිකම මෙන්ම දේශපාලන සහ ආර්ථික පෙළඹවීම් මත දැඩි ලෙස රැඳෙන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ගැනත් ප්‍රශ්න මතු කරයි.

යුද්ධයෙන් පසු වසරවල පරිසරය සහ වනජීවීන් ආරක්ෂා කිරීමට වැඩි අවධානයක් යොමු විය. සෞභාග්‍යයේ නව දැක්මේ එක් ක්ෂේත්‍රයක් වන්නේ විශේෂිත නීති රීති කෙරේ නිසි අවධානය යොමු කරමින් ''තුලනාත්මක සමාජ, ආර්ථික සහ පාරිසරික භාවිතාවන් තුළින් තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම ය.'' පාරිසරික ආරක්ෂාව පිළිබඳ ආණ්ඩුවේ චින්තනය වන්නේ නගර අලංකාරය, නගර සංවර්ධනය සහ ඇවිදින මං තීරු සහ නාගරික උද්‍යාන ඉදි කිරීම ය.'[132] නමුත් ස්වභාවික සම්පත් රැක ගැනීම කෙරේ ඇති කරන බලපෑම කනස්සල්ලට හේතුවකි. තමා පරිසරයට ආදරය කරන ගරු කරන පුද්ගලයෙකුයැයි ජනාධිපති පැවසුව ද ඔහුගේ පාලනය යටතේ මෙතෙක් වාර්තා වූ විශාලතම පරිසර හානිය සිදුවේ.[133] ඊට පරිසරය, ස්වභාවික සම්පත් සහ වන ජීවීන්ට කිසියම් ආකාරයක රැකවරණයක් සැලසෙන පවතින නිති රාමු ඉවත් කිරීම හෝ ලිහිල් කිරීමට ආණ්ඩුව ගත් පියවර ඇතුළත් ය.

බලවත් අවධානය සහ විරෝධයක් මතු වූ ක්ෂේත්‍රවලින් එකක් වන්නේ රක්ෂිත වනාන්තර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් ඉවත් කිරීමේ චක්‍රලේඛය සහ කැළෑ ඉඩම් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් යටතට පත් කිරීම ය. ඒ තුළින් මෙම ඉඩම් වඩාත් විනාශයට ලක් විය හැකි නිසා දැඩි විරෝධයක් මතු විය.[134]

තවදුරටත් කැබිනට් මණ්ඩලයේ යෝජනාවකින් වැලි සහ වෙනත් ද්‍රව්‍ය ප්‍රවාහනයට බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවය ද ඉවත් කරන ලදී. ඒ අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නැතිව කැනීම් කිරීමට ඉඩ දීමකි. එය උසාවියේ අභියෝග කිරීමට ලක් විය. බලපත්‍ර ඉවත් කිරීමේ පියවර ක්‍රියාත්මක වුවහොත් සීමාවකින් තොරව කැනීම් කටයුතු කිරීමට ඉඩ සැලසෙන නිසා බරපතළ පාරිසරික හානියකට හේතු විය හැකිය. සැලකිය යුතු ලාභයක් අත්වන නමුත් විශාල පරිසර හානියක් සිදුවන නීති විරෝධී වැලි කැනීම් ගැන නිතර වාර්තා වේ. මඩකලපුවේ වාලච්චෙනෙයි, සහ චෙන්කලාඩි සහ මන්නාරමේ තලෙයිමන්නාරම සහ පේසාලෙයි සහ තවත් ප්‍රදේශවල දීර්ඝ කාලීන බලපෑම් විය හැකි වැලි කැනීම් සිදු වන බව දක්නට ඇත.[135]

---

[131]ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡාව වර්ෂ 2021 පෙබරවාරි

[132]'නිදහස් දින කතාව' (2021 පෙබරවාරි) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ ජනාධිපති ගේ නිල වෙබ් අඩවිය:

[133]මිනෝලි ද සොයිසා 'පරිසරය ඝාතනය කිරීම: හරිත සුන්දර දිවයින අපවිත්‍ර කිරීම'(2021 පෙබරවාරි), ග්‍රව්න්ඩ් වීව්ස් https://groundviews.org/2021/02/13/committing-ecocide-the-desecration-of-a-green-and-pleasant-land/

[134]ඩිනාර්සාඩ් රහීම්, 'සෙසු රාජ්‍යයන්හි වනාන්තර සහ ශ්‍රී ලංකාවේ වැසි වනාන්තර ජෛව ආරක්ෂාව' (නොවැම්බර් 2020), ග්‍රව්න්ඩ් වීව්ස් https://groundviews.org/2020/11/23/other-state-forests-and-the-conservation-of-sri-lankas-rainforest-biota/

[135]2021 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු ක්ෂේත්‍ර චාරිකාවන්

කනස්සල්ලට හේතු වන තවත් කරුණක් වන්නේ වනාන්තර ආරක්ෂා කිරීමේ නාමයෙන් යොදා ගන්නා ක්‍රමවේදයෙන් නව ගැටුම් ඇති කිරීම ය. කැලෑ ආරක්ෂා කිරීමේ මුවාවෙන් සමහර ප්‍රජා කොටස් සම්ප්‍රදායිකව ජීවත් වූ සහ වගා කළ ඉඩම්වලට පිවිසීම වැළැක්වීමට නිලධාරීන් ක්‍රියා කරන්නේ කෙසේද යන්න පිළිබඳ වාර්තා උතුර සහ නැගෙනහිරෙන් ලැබී ඇත. ඊට අමතරව දශක ගණනාවක් තිස්සේ වගා කටයුතු කළ හෝ ගවයින්ට තණ කැවීමට යොදා ගත් ඉඩම්වලින් ඔවුන් ගේ පිවිසීම වැළැක්වීමේ හෝ සීමා පැනවීමේ කැළඹීමට පත් කෙරෙන ප්‍රවනතාවයක් ද පවතී. මඩකලපුව දිස්ත්‍රික්කයේ ශත වර්ෂ ගණනාවක් තිස්සේ ගවයින්ට තණ කැවීම සඳහා යොදා ගත් රජයේ ඉඩම්වලට පිවිසීම දැන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ සිවිල් ආරක්ෂක බලකාය විසින් වළක්වයි. මෙවැනි සීමා කිරීමේ සිද්ධීන් උතුරු සහ නැගෙනහිර වෙනත් ප්‍රදේශවලද සිදු වේ. ප්‍රදේශයේ ජනතාව වසර ගණනාවක් තිස්සේ වගා කටයුතුවලට යොදා ගත් ඉඩම්වලට පිවිසීම හා වගා කිරීම වැළැක්වීම මධ්‍යම ආණ්ඩුවේ තවත් ආයතනයක් සුළුතර ජන කොටස්වලට ඉඩම් යොදා ගැනීමට ඇති අයිතිය අහිමි කිරීමට සහ ඔවුන්ගේ ඉඩම්වලින් ඉවත් කිරීමට පවතින නීති රාමුව යොදා ගන්නා බවට බියක් ඔවුන් තුළ පවතී.

## 4. සංවර්ධන ගමන් මාර්ගය සහ එහි බලපෑම්

ආර්ථික පුනරුදය, කාර්යක්ෂමතාවය සහ ස්ථාවරත්වය මෙම ආණ්ඩුවේ සාර්ථකත්වයට මෙන්ම ජනතාව නගා සිටුවීමට අවශ්‍ය මූලික ලක්ෂණ ලෙස හුවා දක්වන ලදී. මෙය 2019 සහ 2020 මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර දෙකේදීම සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ කළ මූලික ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් මෙන්ම ආයෝජන සහ රැකියා අවස්ථා නගා සිටුවීමේ නව සංවර්ධන මුලපිරුම් එළි දැක්වීම්වලදී කරන ලද ප්‍රකාශනවලින් ද දක්නට ලැබිණ. එහෙත් මෙතෙක් මැතක දක්නට ලැබුණු වර්ධනයන්ගෙන් පෙන්නුම් කරන ආකාරයට පොරොන්දු සම්පූර්ණයෙන් ඉටු කර නැති අතර පාලනය, ආර්ථිකය, ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ භූ දේශපාලනය පිළිබඳව ආණ්ඩුවේ තෝරා ගත් ප්‍රතිපත්ති උපනතිය බරපතළ තත්වයක් ඇති කළ හැකි බව දැක්වෙන සිද්ධීන් ගණනාවක් දක්නට ලැබිණ. මෙම කොටසින් සංවර්ධනය ප්‍රමුඛතාගත කිරීම, මෙතෙක් එහි ඇති බලපෑම සහ ගැටුම් නිර්මාණය විය හැකි සහ පවතින ගැටුම් උත්සන්න වියහැකි අවධානයට යොමු විය යුතු ක්ෂේත්‍ර ගැන කෙටියෙන් පරික්ෂා කරනු ඇත.

### පෝර්ට් සිටි ව්‍යාපෘතිය

පෝර්ට් සිටියට බලවත් කොමිසන් සභාවක් සහ පරිපාලනමය රාමුවක් ලබා දෙන නීතිමය රාමුවක් වන කොළඹ පොර්ට් සිටි ආර්ථික කොමිසන් සභා පනත නීතිගත කිරීමට හැකිවීම ආණ්ඩුවේ මූලික ව්‍යවස්ථාමය ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. මෙය එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මුල්ම දවස් කීපය වුවද, පාලනය, ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ භූ දේශපාලනය සම්බන්ධයෙන් ගැඹුරු අවධානය යොමු විය යුතු සිද්ධීන් ගණනාවක් එම ක්‍රියාවලිය තුළින් මතු විය. මෙම අවධානයන් වෙනත් බොහෝ වර්ධනයන්ගෙන් ද පෙන්නුම් කරන අතර පෝර්ට් සිටි ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව කලාපයේ ඊළඟ ආර්ථික කේන්ද්‍රය බවට පත් කෙරෙන සියලු ව්‍යාධීන්ට විසඳුමක් ලෙස ද වර්ණනා කරන ලදී. සංවර්ධනය සහ ආර්ථික පුනරුදය ප්‍රමුඛතාගත කරමින් අනෙකුත් ක්ෂේත්‍ර බැහැර කිරීම සහ ක්‍රියාවලිය වටා ඇති අපැහැදිලිතාවයත් සහ මෙවැනි විශාල ව්‍යාපෘතීන්වල ඇති බලපෑම වටා විවිධාකාර ගැටලු ගැට ගැසේ.

**ක්‍රියාවලිය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ ගැටලු:** ආණ්ඩුව සීමිත ප්‍රසිද්ධ විවාදයකට සීමා කළ පනතක් සම්මත කර ගැනීමෙන් එය ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී විවිධාකාර වූ ගැටලු මතු විය. සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සමයට සහ පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන්නේ ද යන්න අභියෝග කිරීමේ අවස්ථා වසා දැමීමට හේතු වන ප්‍රසිද්ධ නිවාඩු ගණනාවකට පෙරාතුව පනත සභාගත කර සම්මත කර ගැනීම කඩිනමින් කරන ලද බව දක්නට ලැබිණ. එසේ වුවත් පෙත්සම් 19ක් සහ තවත් අය පනතට අභියෝග කිරීමට ඉදිරිපත් වූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය එය අප්‍රේල් උසාවි නිවාඩු සමයේ දීම විභාග කිරීමට රැස් විය. කොමිසමේ සංයුතිය සහ බලතල, පාර්ලිමේන්තුව සහ නියාමන අධිකාරීන් යටපත් කිරීම, ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමියේ තරගකරුවන් දුර්වල කරන දිරි ගැන්වීම් ලබා දීම සහ පාරදෘශ්‍ය භාවය සහ වගවීමේ ප්‍රශ්න වැනි කරුණු ඇතුළත් පනතේ බොහෝ ලක්ෂණ අභියෝග කෙරිණ.

පෙත්සම්කරුවන් අතර කැපී පෙනෙන්නේ ආණ්ඩුවේ බලවත්ම ආධාරකරුවන් ද වීමය. පනත විවේචනය කරමින් ඔවුන් කළ ප්‍රසිද්ධ ප්‍රකාශන වලින් යෝජිත ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට වන බලපෑම ද ඉස්මතු කර දැක්වූ කරුණකි. පෝර්ට් සිටි මගින් චීනයට දේශීය කටයුතුවලදී වැඩි බලපෑමක් කළ හැකි වන්නේ කෙසේද, දීර්ඝ කාලීන භූ දේශපාලන සහ ජාතික බලපෑමක් ඇති වන ආකාරයට එක් අන්තර්ජාතික ක්‍රියාකාරිකයෙකු මත රැඳී සිටීමේ තත්වයක් නිර්මාණය කිරීම අවධානය යොමු කරන ලද කරුණුය.

කාර්යක්ෂම අධීක්ෂණයක් නොමැතිව පුළුල් බලතල සහිත පූර්ණ බලැති කොමිසමක් ඇති කිරීමේ ප්‍රයත්නය ශ්‍රේෂ්ඨාධිකරණයේ දී පසුබෑමකට ලක් විය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සංශෝධන ගණනාවක් අවශ්‍ය බව තීරණය කෙළේය. ශ්‍රේෂ්ඨාධිකරණය වගන්ති 72කින් යුත් පනතට සංශෝධන

25ක් යෝජනා කිරීම වැදගත් ය. සමහර වගන්ති සංශෝධනය නොකරන්නේනම් පනත තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කර ජනමත විචාරණයකට යොමු කළ යුතු බවද සඳහන් කෙරිණ.[136]
වසංගත තත්වයේ තුන්වැනි රැල්ල පවතින අතර තුර විවාදයට දින දෙකක් වෙන් කිරීම, රට වෙළා ඇති සෞඛ්‍ය සහ ආර්ථික අර්බුදය සැලකිල්ලට ගැනීමේ දී මෙය ප්‍රමුඛතාවයක් වන්නේ කෙසේදැයි බොහෝ දෙනකු ප්‍රශ්න කළහ. යෝජනා කර ඇත්තේ කුමක් ද සහ එහි බලපෑම පිලිබඳව බොහෝ දෙනකු දැනුවත්ව නැති තත්වයක් මැද මෙවැනි කඩිනමක් අවශ්‍ය ඇයි ද යන්න ප්‍රශ්න කෙරිණ. විවාදය කල් තබන ලෙස විපක්ෂයෙන් ඉල්ලීමක් කළ නමුත් විවාදය පැවැත්විනි. මෙම විවාදය පැවැත් වූයේ මංත්‍රීවරයෙකුට කොවිඩ් රෝගය බෝ වී ඇති බව තහවුරු වී ඇති තත්වයක් මැද ය.

මෙවැනි මූලික වැදගත් කමකින් යුත් නීතියක් සම්මත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය සහ පාලනයට අදාල කරුණු ගණනාවක් ඉස්මතු කරයි. ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලිය වසර ගණනාවක් තිස්සේ, සෑම ආණ්ඩුවක් යටතේම කෙටුම් පත් කිරීම සහ ඒ වෙනුවෙන් කරුණු දැක්වීමට ආණ්ඩුවේ ප්‍රධාන නිලධාරීන් සම්බන්ධ කර ගැනිණ. එය පසුගිය වසරවල බොහෝ සෙයින් වෙනස්ව පුද්ගලික නීතිඥයන් ද වඩාත් ක්‍රියාත්මක භූමිකාවක් ඉටු කරන තත්වයකට වෙනස් විය. එය පනතේ ව්‍යවස්ථානුකූල භාවය ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝග කළ විට දක්නට ලැබිණ. නීතිපති දෙපාර්තමේන්තුව පනත වෙනුවෙන් පෙනී සිටි අතර ජනාධිපති ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥයන් දෙදෙනකු විභාගය පැවැත් වෙන අතර තුර පනතට සංශෝධන යෝජනා කළහ. එමනිසා අධිකරණයට සහ පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන්ට පනත වෙනුවෙන් පෙනී සිටීමේ ක්‍රියාවලිය මෙහෙයවන්නේ කවුදැයි ප්‍රශ්න කිරීමට සිදු විය.[137] මින් නීති සම්පාදන ක්‍රියාවලියේ දී දේශපාලන ක්‍රියාකාරිකයන් සහ වෙනත් පෞද්ගලික වුවමනා ඇති අය මැදිහත්වීමේ කනගාටුදායක භාවිතය හෙළිදරවු කරයි. එය ක්‍රියාවලියේ අවංක භාවය ගැන පමණක් නොව වැඩියෙන් දේශපාලනීයකරණය වීම ගැන ප්‍රශ්න මතු කෙරේ.

මෙම පනතට කාරක සභා අවස්ථාවේ දී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව මතු කළ ගැටලු විසඳීම සඳහා සංශෝධන ගණනාවක්ම ඉදිරිපත් කරන ලදී. කාරක සභා අවස්ථාවේ දී සංශෝධන ගෙන ඒම අලුත් දෙයක් නොවේ. සෑම ආණ්ඩුවක්ම තම දේශපාලන වුවමනාවන් ඉටු කර ගැනීම සඳහා කැපී පෙනෙන සංශෝධන ඇතුළත් කිරීමට එය අවස්ථාවක් කර ගන්නේය. මෙය වඩාත් මෑතක දක්නට ලැබුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේ ය. එහිදී කලින් ප්‍රසිද්ධ නොකළ සංශෝධන කාරක සභා අවස්ථාවේදී ඇතුළත් කළ නිසා එමගින් යෝජිත සංශෝධන පිළිබඳව ජනතාවට අදහස් දැක්වීමට අවස්ථාවක් නැති විය. එය දැඩි අවධානයට පත් විය යුතු වන්නේ එවිට මහජන පරීක්ෂාවට සහ අධිකරණ අදහස් දැක්වීමට අවස්ථාවක් නොවන නිසාය. එය සෑම ආණ්ඩුවක්ම අතීතයේ දී අනිසි ලෙස යොදා ගෙන ඇත. නීති සම්පාදන ක්‍රියාවලිය දුර්වල කරන මෙවැනි පුරුදු කෙරේ බලවත් සැලකිල්ල යොමුකර වහාම අවධානය යොමු කළ යුතුය. අවධානය යොමු නොවීමෙන් දේශපාලනීය වූ භාවිතා තවදුරටත් ශක්තිමත් වනු ඇත.

මෙම පනත නිවාඩු දින ගණනාවකට පෙර සභා ගත කිරීමෙන් පනතක ව්‍යවස්ථානුකූල භාවය අභියෝග කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති ක්‍රියාවලිය යොදා ගැනීමෙන් සිතාමතාම වැළැක්වීමට ආණ්ඩුව උත්සාහ කෙළේද යන ප්‍රශ්නය මතු කරයි. අධිකරණයේ තීරණය දැන ගැනීමටත් පෙරාතුවම විවාදය සඳහා එක දිනයක් පමණක් වෙන් කිරීමට ආණ්ඩුව උත්සාහ ගැනීමෙන් ආණ්ඩුවට මෙවැනි නීතියක් සම්මත කර ගැනීමට වූ කඩිනම ද ප්‍රශ්න සහගත ය.

පනත සම්මත කර ගැනීමෙන් පසුව පෝර්ට් සිටිය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න විමසා බැලිය යුතුය. පාර්ලිමේන්තු අධීක්ෂණයේ වැදගත්කම තහවුරු කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් කොමිසන් සභාවේ සංයුතියේ සහ බලතලවල කිසියම් වෙනසක් සිදු කෙරිණ. මූලික ආරක්ෂාවන් ඇතුළත් වන සංශෝධන මුල් පනතට එකතු කර ඇති නමුත් වගවීම සහ පාරදෘශ්‍ය භාවය, සේවක ප්‍රමිතීන්, කලාප වෙන් කිරීම සහ පරිසරය ඇතුළත් තවත් කරුණු ගණනාවක් ගැන ප්‍රශ්න සහගත තත්වයක් පවතී. ශ්‍රී ලංකාව කෙරේ ඉමහත් බලපෑමකින් යුතු වුවත් පෝර්ට් සිටි ව්‍යාපෘතිය සම්බන්ධ ක්‍රියාවලිය තවමත් අපැහැදිලි ස්වභාවයකින් වැසී පවතී. ශ්‍රී ලංකාවේ ආර්ථික සෞභාග්‍යය උදා කරන මුලපිරුම් අත්‍යාවශ්‍ය වන නමුත් ක්‍රියාවලිය සහ අන්තර්ගතය ගැනත් මෙවැනි

136 ඉන්දියාව බලා සිටිය දී පෝර්ට් සිටි පනත චීනය දෙසට නැඹුරු වේ' (2021 මැයි), ද මෝර්නිං https://www.themorning.lk/port-city-tilts-balance-toward-china-as-india-watches-on/

137 පෝර්ට් සිටි පනත පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස් - https://www.cpalanka.org/cpa-commentary-on-the-port-city-bill/

ව්‍යාපෘතියකින් වඩාත් ප්‍රතිලාභ අත් කර ගන්නේ කවුද යන්න ගැනත් මෙම ප්‍රයත්නයෙන් මූලික වූ ප්‍රශ්න මතු කරයි.

මෙය ලියන අවස්ථාවේ පනත ක්‍රියාත්මක වීම මුල් අදියරේ පවතින අතර කොමිසන් සභාවට පත්වීම් කර ඇති නමුත් පෝර්ට් සිටි ප්‍රදේශයේ ක්‍රියාත්මක වීමට අවශ්‍ය රෙගුලාසි පිළිබඳව මෙතෙක් කිසිම තොරතුරක් දක්නට නැත. එම නිසා මෙම ව්‍යාපෘතිය ඉදිරි මාසවලදී තියුණු අවධානයට ලක් කළ යුතුය.

**භූ දේශපාලන ගැටලු:** මහා බලවතුන් ගෙන යන භූ දේශපාලන සටන් සම්බන්ධයෙන් මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව ආණ්ඩුව පවසයි. කෙසේ වුවත් ආණ්ඩුවේ ක්‍රියාවන් සහ භාවිතාවන් චීනය සමග වඩාත් වැඩි බැඳීමක් පෙන්නුම් කරයි. වත්මන් ශ්‍රී ලංකාණ්ඩුව සහ චීන කොමියුනිස්ට් පක්ෂය අතර ඇති සම්බන්ධතාවය ප්‍රායෝගික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතාවලට පමණක් සීමා වන්නේ නැත. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ චීන කොමියුනිස්ට් පක්ෂය සහ භාරතීය ජනතා පක්ෂය අනුකරණය කළ යුතුයැයි බැසිල් රාජපක්ෂ කළ ප්‍රකාශය වඩාත් අධිකාරිවාදී පාලන මොඩලයන් සමග තවදුරටත් බැඳෙන බව පෙන්නුම් කරයි.[138]

ජනාධිපති චීනයේ ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමති වෙයි ෆෙන්ගේ හමුවීම විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව චීනය දෙසට නැඹුරු වී ඇති ප්‍රමාණය පිළිබඳ ඉඟියක් ලබා දේ. චීන රජයේ නිල ප්‍රවෘත්ති සේවය වන ෂින්හුවා නිව්ස් මෙම හමුවේ දී ජනාධිපති මෙසේ ප්‍රකාශ කළ බව සඳහන් කරයි. ''චීනය සමග සබඳතා ගොඩ නැගීම ප්‍රමුඛතාවය කර ගත් ශ්‍රී ලංකාව, චීනයේ මූලික වුවමනාවන් සම්බන්ධයෙන් ඇති ගැටලුවල දී එහි ස්ථාවරයට නොසැලී සහයෝගය දක්වනු ඇත.''[139] රජයෙන් පවත්වා ගෙන යන මාධ්‍ය ආයතනයකින් නිකුත් කර ඇති මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අතිශයෝක්තියක් විය හැකි නමුත් ඉන්දියාව සමග ඇති භූ දේශපාලන සටන ජය ගත්තේය යන හැඟීම ගෙන දෙන මෙම ප්‍රකාශය සැලකිල්ලට ගත යුතුය.

පෝර්ට් සිටි මේ පිළිබඳව හොඳම උදාහරණයකි. මෙම ව්‍යාපාතිය ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ දේශපාලන වශයෙන් වඩාත් කැපී පෙනෙන එකක් විය හැකිය. මෙම ව්‍යාපෘතිය කලාපය සහ මාවත (Belt and Road) මුලපිරුමේ කොටසක් වශයෙන් චීනයට ඉමහත් වටිනාකමකින් යුතුය. කේන්ද්‍රීය වැදගත්කමකින් යුත් ප්‍රදේශයක පිහිටි පෝර්ට් සිටිය අප්‍රිකාවේ සහ මැද පෙරදිග බල ශක්ති සැපයුම් කරුවන්ට ආරක්ෂිත වෙළඳ මාර්ගයකට ඉඩ සැලසෙන අවකාශයක් විය හැකිය.

ඉන්දියාවට වඩාත් සමීප ස්ථානයක වරායකට සම්බන්ධවීම සහ එය පාලනය කලාපීය තරඟකාරිත්වය සහ ආරක්ෂාව පිළිබඳ සන්දර්භයක් තුළ භූ දේශපාලන බලපෑම් වැඩි කරනු ඇත. චීනයේ විරුද්ධවාදීන් දකින ආකාරයට පෝර්ට් සිටි චීනයේ 'මුතු වැල' (String of pearls) [140]උපාය මාර්ගයට ඇතුළත් වන කොටසකි. ඒ අනුව නාවික යටිතල පහසුකම් ව්‍යාපාති ඉදි කොට කලාපය තුළ චීනයේ නාවික බලය තහවුරු කිරීමට මුහුදු මාර්ගවලින් සම්බන්ධ කරනු ඇත.

චීනය පෝර්ට් සිටිය සම්බන්ධ කරුණු වලදී කෙතරම් පාලන බලයක් හිමි කර ගනු ඇත්ද යන්න සහ රට තුළ පාලනයට ඉන් ඇති කරන ඵලවිපාක ගැන ප්‍රශ්න පවතී. පොර්ට් සිටියෙන් රටේ ස්වෛරීත්වයට තර්ජනයක් එල්ල වන්නේයැයි ජනතාව තුළ අවදානම වැඩි වෙමින් පවතී.

## සංවර්ධනය පිළිබඳ අනෙකුත් මුලපිරුම් සහ ගැටලු

අවධානය යොමු කළ යුතු වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන් ගණනාවක්ම සකස් කරමින් පවතින බව මාධ්‍ය වාර්තාවලින් අඟවයි. අධිවේගි මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති පිළිබඳව මෑතක දී ගත් තීරණ රැසක්ම ප්‍රමුඛතා ගත කිරීම පිළිබඳව පමණක් නොව ඒවායේ බලපෑම පිළිබඳවත් ප්‍රශ්න මතු කරයි. නිදසුනක් වශයෙන් වහාම අවධානය යොමු කළ යුතු වෙනත් ප්‍රශ්න ගණනාවක් පවතින විට මුදල් හිඟයකට මුහුණ දී ඇතැයි කියන ආණ්ඩුවක් නව ගුවන් පාලම් පහක් සහ කණු මත ඉදි කෙරෙන මාර්ගයක් ඉදි

[138]උදිත රාජපක්ෂ 'බැසිල් රාජපක්ෂ 'සංවර්ධන දශකයට' එක්වන්නැයි පෞද්ගලික අංශයෙන් ඉල්ලයි' (2020 ජූලි), ඩේලිඑෆ්ටී https://www.ft.lk/top-story/BR-invites-private-sector-to-join-decade-of-development/26-703841

[139]සියලු අංශ තුළ ශ්‍රී ලංකාව සහ චීනය ප්‍රායෝගික සහයෝගිතාවය වැඩි කිරීමට සපථ කරති.'' (2021 අප්‍රේල්), Xinhua Net http://www.xinhuanet.com/english/asiapacific/2021-04/29/c_139913168.htm

[140]චීන ආණ්ඩුව 'මුතු වැල' සංකල්පය අපහාසාත්මක යෙදුමක් සේ ප්‍රතික්ෂේප කරයි.

කිරීමට ගත් තීරණය එවැන්නකි.[141] කොළඹ දේපොළ සංවර්ධනය කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ මුලපිරුම් සහ ඒවායින් ජාතික උරුමයන් සේ සැලකෙන ස්ථානයන්ට එල්ල වන බලපෑම් පිළිබඳව මෑතක දී අවධානය යොමු විය. ක්‍රියාවලිය සහ වගවීම පිළිබඳව ගැටලු මතු වී ඇති සෙලන්දිව ආයෝජන (පුද්ගලික) සමාගමට මෙම ඉඩම් පැවරීම බාහිර බලවේගයන්ට තව දුරටත් පාලනය භාර දීමේ නවතම ප්‍රයත්නයක්දැයි ප්‍රශ්නය නගා ඇත.[142] තව දුරටත් 'නගර සියයක් අලංකරණය කිරීමේ' යෝජනාව සහ දරිද්‍රතාවය විසඳීමට අපොහොසත් වූ සහ අඩු ආදායම් නිවාස, අවතැන්වීම සහ ජීවන මාර්ග පිළිබඳ ගැටලු ඇති බොහෝ දෙනකු ජීවත්වන යථාර්ථය තුළ නාගරික පුනර්ජීවන මුලපිරුම ගැන ප්‍රශ්න මත කෙරේ.[143]

මේ සියල්ල සහ සෞභාග්‍යයේ දැක්ම යටතට ගැනෙන අනෙකුත් මුලපිරුම් සංවර්ධනයට සහ ආර්ථික පුනර්ජීවනයට අවශ්‍ය කරන ඒවා සේ හැඳින් වුවද විවිධ පෙරමුණුවල නොවිසඳී ඇති බරපතළ ප්‍රශ්න ගණනාවක් පවතී. පෝර්ට් සිටි ව්‍යාපෘතියේ මෙන්ම ක්‍රියාවලිය සහ විශාල කොන්ත්‍රාත් ලබා දීමට තීරණය කිරීමේ දී ප්‍රමිතීන් නිසි උනන්දුවෙන් අනුගමනය කෙළේද යන ප්‍රශ්න පවතී. වෙනත් කරුණු අතර පාලනය, අයිතිවාසිකම් සහ පරිසරය සහ මෙවැනි සංවර්ධන මුලපිරුම්වලින් පීඩාවට පත් ජනතාව ගැන නිසි අවධානය යොමු කෙළේ ද යනාදිය ගැන ප්‍රශ්න නැගේ. ජනාධිපති මහින්ද රාජපක්ෂ පාලන සමයේ ආරම්භ කළ අලංකරණය කිරීමේ අතීත මුලපිරුම් නොයෙකුත් නීතිමය සහ අයිතිවාසිකම් ගැටලු රාශියක් හා බැඳී ඇත.[144] වැඩි දුරටත් ශ්‍රී ලංකාව තුළ චීනයේ භූමිකාව ව්‍යාප්තවීමත් සමග භූ දේශපාලන ක්ෂේත්‍රයේ සහ ස්වෛරීත්වය සහ ආරක්ෂාව පිළිබඳ කරුණු ගැන අවධානය යොමු කළ යුතුය.

රට තුළ වැඩි වෙමින් පවතින චීන බලපෑම සහ ඇති කර ගත් ගිවිසුම් සහ ව්‍යාපෘතීන් ගැන මහජන විරෝධය මතුවෙමින් පැවතිය ද ඒ ගැන ආණ්ඩුව, නැගෙනහිර බහාලුම් පර්යන්ත (ECT) සහ සහශ්‍රක අභියෝග සහයෝගිතා (ඇම්සීසී) ගිවිසුම් වැනි, පිළිවෙළින් ඉන්දියානු සහ ඇමරිකානු ගිවිසුම් සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරයට එම විරෝධයට සවන් දීමට සූදානම් නැත. චීනය මත රඳා සිටීම අඩු කරන සංවර්ධන ව්‍යාපෘතියක් සේ දක්වන ලද ජපාන සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නතර කිරීම මේ පිළිබඳ තවත් උදාහරණයකි. වසර 40කින් කල් පිරෙන සහ වසර 12ක සහන කාලයකින් යුත් සියයට 0.1ක අනුග්‍රාහක පොලී අනුපාතයක් යටතේ ලබා දෙන ඩොලර් බිලියක 1.8ක ණය මුදලකින් ජපාන ව්‍යාපාතියට අරමුදල් සැපයීමට නියමිතව තිබුණ ද එම වියදම ඵලදායි නොවන්නේය යන්න මත අවලංගු කරන ලදී.[145]

නැගෙනහිර බහාලුම් පර්යන්ත සහ ඇම්සීසී ගිවිසුම්වලින් ඉවත් වීමට පෙරාතුව ඇති වූ සිද්ධීන්ගෙන් එම තීරණ ගැනීමේ දී ජනතා බලපෑමට ප්‍රතිචාර දැක්වීමට ආණ්ඩුව තුළ තිබූ අකමැත්තක් දක්නට තිබුණ ද පෝර්ට් සිටි සම්බන්ධයෙන් එසේ නොවීමෙන් මූලික තීරණ ගන්නා පුද්ගලයන් කෙරේ ඇති චීන බලපෑම පිළිබිඹු වේ. මෙම යටිතල පහසුකම් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ආණ්ඩුව පාර්ශ්වයෙන් තීරණ ගැනීමේ දී ඇත්තෙන්ම කලාපයේ චීනයේ කේන්ද්‍රීය වුවමනාවන් ශක්තිමත් කිරීමට හේතු වේ. ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩා නොවැටීමට චීනය සහතික වනු ඇත. රාජ්‍ය තාන්ත්‍රිකව ණය උගුලට හසු කර ගැනීමේ කතිකාව තුළ ශ්‍රී ලංකාවේ පිහිටීම, රටේ ආර්ථික අසමත්වීම, චීන ආණ්ඩුව කෙරේ අයහපත් ආකාරයට පිළිබිඹු වනු ඇත. වගවීම සහ මානව අයිතිවාසිකම් සම්බන්ධ කරුණුවලදී එක්සත් ජනපදය, ඉන්දියාව සහ යුරෝපය ශ්‍රී ලංකාණ්ඩුව කෙරේ ඇති කරන බලපෑම් ප්‍රතිතෝලනය කිරීමේ දී චීනය ඉටු කරන භූමිකාව ආණ්ඩුවට ද ප්‍රයෝජනවත් ය.

කෙසේ වුවත් ඉන් ශ්‍රී ලංකාවේ අනාගතය සුරක්ෂිතයැයි අදහස් වන්නේ නැත. එක් මහා බලවතෙකු සමග බැඳී සිටීම සම්බන්ධයෙන් අනෙකුත් බලවතුන්ගේ උපාය මාර්ගික ප්‍රතිචාර දැක්වීමේ දී ශ්‍රී ලංකාව අවාසි සහගත තත්වයකට පත් කරනු ඇත.

---

[141]නව ගුවන් පාලම් පහක, කණුමත ඉදි කරන මංතීරු හතරේ අධිවේගී මාර්ගයක වැඩ අද ඇරඹේ, ඩේලි නිවුස්, (2021 ජූනි 7)

[142]නාමිනි විජේදාසඃ කොළඹ වටිනාම ඉඩම් සඳහා සිංගප්පූරු පන්නයේ PPP ව්‍යාපාර ලබන සතියේ ඇරඹේ, සන්ඩේ ටයිම්ස්, (2021 ජූනි 6)

[143]ඉෂාරා මුදුගමුව, ශ්‍රී ලංකාව පුරා නගර සියයක් අලංකරණය කිරීමේ යෝජනාවට ආණ්ඩුවේ අනුමැතිය, ඩේලි නිවුස්, 2021 ජූනි 7; කොළඹ බලහත්කාරයෙන් ඉවත් කිරීමඃ අලංකරණයේ අශෝභන මිල, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2014.

[144]කොළඹ බලහත්කාරයෙන් ඉවත් කිරීමඃ අලංකරණයේ අශෝභන මිල, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2014.

[145]මර්වාන් මාකන් මාකාර්, ශ්‍රී ලංකාව ජපන් අරමුදල් ලබන ව්‍යාපෘති ඉවත දමයි (2020 දෙසැම්බර්), Nikkei Asia https://asia.nikkei.com/Politics/International-relations/Sri-Lanka-to-scrap-Japan-funded-infrastructure-projects

## බලය විමධ්‍යගත කිරීම, සංහිඳියාව පිළිබඳ බලපෑම සහ භූ දේශපාලන අනුමිතිය.

ආණ්ඩුව සංවර්ධනය කෙරේ ඒකායනව යොමුවීම අනෙකුත් බොහෝ ගැටලු පසු පසට දැමීමට හේතු විය. ආණ්ඩුවේ නිල ප්‍රකාශන සහ ප්‍රතිපත්ති නියමයන් මානව අයිතිවාසිකම්, සංහිඳියාව සහ බලය බෙදා හැරීම වැනි කරුණු ආර්ථික සමෘද්ධියේ නාමයෙන් පසු පසට දමා ඇති ආකාරය ඉස්මතු කර දක්වයි. චීනය මෙම ක්ෂේත්‍ර කෙරේ වැඩි සැලකිල්ලක් නොදක්වන නිසා ආණ්ඩුවට දේශපාලන සහ වෙනත් අයිතිවාසිකම් පිළිගැනීම ගැන සැලකිල්ලක් දක්වන අනෙකුත් අන්තර්ජාතික ක්‍රියාකාරීන් නොසලකා තම ප්‍රමුඛතා සමග ඉදිරියට යා හැකිය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වාර්ගික ප්‍රශ්නයට කල් පවත්නා විසඳුමක් සොයා ගන්නා මෙන්, රටේ දේශපාලන ගමන් මාර්ගයේ ඓතිහාසික ගාමක බලයක් වූ ඉන්දියාව නිරන්තරයෙන්ම ඉල්ලා සිටී. මේ තත්වය අදටත් එසේමය. රටේ වැදගත් ප්‍රධාන කරුණු ගණනාවක් ගැන ඉන්දියාවේ බලපෑම දක්නට ලැබෙන නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය වැනි ඉන්දියාව සහාය දැක්වූ සමහර කරුණු පිළිබඳව පැහැදිලි ප්‍රගතියක් නැතිවීම සහ සමහර විසඳුම් අතහැර දමනු ඇතැයි බිය අන්තර්ජාතික ප්‍රජාවේ සමහර කොටස් මුහුණ දී ඇති උභතෝකෝටිකය ඉස්මතු කරයි.

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් ඉන්දියාව ඡන්දය දීමෙන් වැළකී සිටීමට ගත් තීරණය, චීනයට ඉඩ දී ඉවත්වීමට ඉන්දියාව තුළ ඇති අකමැත්ත පෙන්නුම් කරයි. 13 වැනි සංශෝධනය ක්‍රියාත්මත කිරීමටත් පළාත්වලට බලය බෙදා හරින ලෙසත් ඉන්දියාව ශ්‍රී ලංකාවෙන් දිගින් දිගටම ඉල්ලා සිටී. ඇත්තෙන්ම ඉන්දියාවේ උසස් නිලධාරීන් ශ්‍රී ලංකාව ගැන සඳහන් කරන සෑම ප්‍රකාශයකදීම 13 වැනි සංශෝධනය ගැන සඳහන් කර ඇත.

කෙසේ වුවත් එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ දී ඉන්දියාව ඡන්දය දීමෙන් වැළකී සිටීම, ශ්‍රී ලංකාව චීනය දෙසට නැඹුරුවීමෙන් වැළැක්වීමේ භූ උපාය මාර්ගික අවශ්‍යතාවයක් ඉන්දියාවට පවතින බවට දර්ශකයන් වන නමුත් ඒ සමගම ශ්‍රී ලංකා ආණ්ඩුවට සහාය දැක්වීමට ඇති අකමැත්ත ද පෙන්නුම් කරයි. යෝජනාවට විරුද්ධව ඡන්දය දීමට නොහැකි වන්නේ සරලව විශේෂයෙන්ම තමිල්නාඩුවෙන් ලැබෙන ඡන්ද කෙරේ ඉන් ඇති කරන බලපෑම නිසා ය.

නව ආණ්ඩුව යටතේ රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ප්‍රබල වන්නේ බලය බෙදා හැරීම සහ 13 වැනි සංශෝධනය පමණක් නොවේ. දෙරට අතර සමහර ආයෝජන ගිවිසුම්, විශේෂයෙන්ම ජාතික සම්පත්වල කොටස් ඉන්දියානු සමාගම්වලට අලෙවි කිරීම සම්බන්ධයෙන් කිසියම් මට්ටමක ගැටුම් පවතී.

මෙම ගිවිසුම් අතරින් වඩාත්ම අලුත් එක වන්නේත් සමහර විට වඩාත්ම ප්‍රබල වන්නේත් කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය සම්බන්ධයෙනි. කලින් පැවති ආණ්ඩුව යටතේ 2019 මැයි මාසයේ දී නැගෙනහිර බහාලුම් පර්යනතය පිළිබඳව ඉන්දියාව සහ ජපානය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. එම අවබෝධතා ගිවිසුම අනුව වරායේ මෙහෙයුම්වලින් සියයට 49ක් ඉන්දියාවට සහ ජපානයට හිමි වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉතිරි සියයට 51 හිමි වේ. මෙම ගිවිසුම 2019 දී දෙසැම්බර් මස නව කැබිනට් මණ්ඩලය අනුමත කළ නමුත් පසුව 2021 ජනවාරි මස ඉන් ඉවත් විය.[146]

මෙම ගිවිසුමෙන් ඒක පාක්ෂිකව ඉවත්වීමට ශ්‍රී ලංකාණ්ඩුව තීරණය කෙළේ ජාතික සම්පත් විකිණීමට එරෙහිව නැගුණ බලවත් මහජන උද්ඝෝෂණ නිසා ය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෘත්තීය සමිති මෙම ක්‍රියාවලියේ දී මූලික භූමිකාවක් ඉටු කළ අතර විමල් වීරවංශ වැනි ජාතිවාදී දේශපාලකයන් වැනි පුළුල් පරාශයක ක්‍රියාකාරීන් සහ පූජ්‍ය පක්ෂය ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කිරීමෙන් සහ ගිවිසුමට එරෙහි උද්ඝෝෂණ ව්‍යාපාරවලට සහභාගිවීමෙන් ප්‍රබල පීඩණයක් එල්ල විය. නැගෙනහිර බහාලුම් පර්යන්තයේ අයිතියෙන් කොටසක් විකිණීම රටේ සම්පත් දේශප්‍රෙමීත්වයකින් තොරව අත්හැරීමක් සේ හඳුන්වන ලදී.

[146]වාරුමනී ද සිල්වා ''ශ්‍රී ලංකාව නැගෙනහිර බහාලුම් පර්යන්තය ගැන දේශීය ගනුදෙනුවකින් ඉන්දියාව හැල්ලුවට ලක් කරයි. (පෙබරවාරි 2021) ඩේලිඑෆ්ටී https://www.ft.lk/top-story/SL-snubs-India-Japan-with-domestic-deal-for-ECT/26-712480

ඒ වෙනුවට ඉන්දියාවට සහ ජපානයට බටහිර බහාලුම් පර්යන්තයෙන් වඩාත් වැඩි කොටසක් ලබා දීමට රජය ඉදිරිපත් වූයේය.[147] බටහිර බහාලුම් පර්යන්තයේ කොටසක් ඉන්දියාවට ලබා දීමේ දී නැගෙනහිර බහාලුම් පර්යන්තයට මෙන් දැඩි විරෝධයක් ඉදිරිපත් නොවීම සැලකිය යුතුය. ඊට හේතු වූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෘත්තීය සමිති නැගෙනහිර බහාලුම් පර්යන්ත ගිවිසුමට එරෙහිව මුලින්ම ඉදිරිපත් කළ තර්කවලින් දැකිය හැකිය. එක හේතුවක් වූයේ වරාය අධිකාරිය ඒ වන විටත් නැගෙනහිර බහාලුම් පර්යන්තය ඉදි කිරීමට ආයෝජනය කර තිබුණ අතර මෙහෙයුම් ආරම්භ වූ විට එහි ප්‍රතිලාභ වෙනත් පාර්ශ්වයකට ලාභාංශ ගෙවීමෙන් අඩුවනු දැකීමට සේවකයෝ කැමති නොවූහ. තවත් හේතුවක් වූයේ නැගෙනහිර පර්යන්තයේ පිහිටීම ය. එය දකුණු ආසියානු ගේට්වේ පර්යන්තය ආසන්නයේ පිහිටි නිසා ඒ දෙක එක් කිරීමෙන් කුඩා නැව් සහ විශාල නැව් මෙහෙයවීමට අවස්ථාවක් ලැබීමෙන් ඵලදායිතාවය සහ ලාභ වැඩි කර ගැනිමට අවස්ථාවක් ලැබීම ය.

ඉන් පෙන්නුම් කරන්නේ දේශපාලන කතිකාව ශ්‍රී ලංකාවේ සම්පත් විදේශ අයිතියට යටත් කිරීමට එරෙහි විරෝධයක් සේ ප්‍රකාශ වුවද, දේශපාලන වශයෙන් තීරණ ගැනීමේ දී වඩාත් ප්‍රබල වන්නේ අදාල වත්කම් පිළිබඳව ගැට ගැසී ඇති පාර්ශ්වකරුවන්ගේ නිශ්චිත සන්දර්භගත කරුණු බලපෑම ය. මෙම ප්‍රසිද්ධ කතිකාව ජාතික සම්පත් පැවරීමට ඇති අකමැත්තෙන් පණ ගැන්වෙන මතවාදය මත පමණක් පදනම් වුවද එය යථාර්ථයෙන් බැහැර වූ තර්කයක් පමණි.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇති කර ගත් ද්විපාර්ශ්වික ගිවිසුම් පිලිබඳව දෙපාර්ශ්වයෙන්ම ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත්වීම නිසා රාජ්‍ය තාන්ත්‍රික නොරිස්සුම් වඩාත් වැඩි විය. 2003 දී ඉන්දියානු ඔයිල් කෝපරේෂන් අනුබද්ධිත ආයතනයකට ලබා දුන් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ආපසු ශ්‍රී ලංකාවට භාර දුන් බව ඇමති උදය ගම්මන්පිල්ල 2021 පෙබරවාරි මස පැවසුවේය.[148] මෙම ප්‍රකාශය ඉන්දියානු ආණ්ඩුව ප්‍රතික්ෂේප කරමින් එම පහසුකම ''පවතින ද්විපාර්ශ්වික ගිවිසුම්වලට අනුකූලව'' තවමත් පවත්වා ගෙන යන බව කීවේය.[149]

ජාතික සම්පත් ඉන්දියාවට විකිණීම සම්බන්ධයෙන් විරෝධයක් මතුවීම සහ පසුව එම ගිවිසුම් අහෝසි කිරීම නිසා, චීනය සමග ඇති කර ගත් මෙවැනිම ගිවිසුම් සම්බන්ධයෙන් ද විරෝධය දැක්වීමේ ක්‍රියාවලිකට හේතු විය. ශ්‍රී ලංකාවේ සම්පත්වල අයිතිය සහ ජාතික භූමි ප්‍රදේශය වටා ඇති කතිකාව මහජන දේශපාලන සංවාදයේ මාතෘකාවක් බවට පත් වුවද චීනය විසින් අරමුදල් සපයන සහ සම්බන්ධීකරණය කරන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙනස් කිරීමට එතරම් බලපෑවේ නැත. ඉන් වඩාත් කැපී පෙනෙන්නේ පෝර්ට් සිටි ව්‍යාපෘතියයි. ඉන්දියාවට මෙය සරලව ආර්ථික තරගකාරිත්වය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවේ. චීනය ඉන්දියාව වට කොට පාකිස්ථානය, බංග්ලාදේශය හා මාලදිවයින ආයෝජන ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාත්මක කරන අතර පෝර්ට් සිටිය ඉන්දියාවේ පුළුල් ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයේ එක කොටසකි.

## අසමානතාවය උග්‍රවීම

අන් සියල්ලට වඩා සංවර්ධනය කෙරේ යොමුවන බවට අලංකාර කතා තිබුණ ද සංවර්ධනය සඳහා අවශ්‍ය කරන ශ්‍රමය සපයන ජනතාවගේ අවශ්‍යතා සඳහා මෙම අවධානය යොමු වන්නේ නැත. බරපතළ දුෂ්කාරතාවයන්ට මුහුණ දුන් සේවකයන් ප්‍රතිපත්ති අසාර්ථක වීමෙන් පීඩාවට පත් වූ අතර මෙම කාලය තුළ ඔවුන්ට ප්‍රමාණවත් සහනයක් ලැබුණේ නැත. ඒ වසංගත සමයේ ශ්‍රී ලංකාවේ ලැයිස්තු ගත කළ සමාගම් වාර්තාගත ආදායම් උපයා ගත් පසුබිමක ය.[150] කලින් සිටම බරපතළ

[147]මීරා ශ්‍රීනිවාසන් 'ඉන්දායාව සහ ජපානය ශ්‍රී ලංකාවේ වරායේ වෙනත් ව්‍යාපෘතියක් (2021 මාර්තු), ද හින්දු https://www.thehindu.com/news/international/sri-lanka-now-clears-indian-investment-at-another-colombo-port-terminal/article33969407.ece

[148]මීරා ශ්‍රීනිවාසන් ශී ලංකාව ත්‍රිකුණාමලය තෙල් ටැංකි ආපසු ගැනීමට සැරසේ (2021 පෙබරවාරි), ද හින්දු https://www.thehindu.com/news/international/sri-lanka-to-re-acquire-trincomalee-port-oil-tanks/article33862319.ece

[149]මීරා ශ්‍රීනිවාසන් 'ත්‍රිකුණාමලය තෙල් ටැංකි පිළිබඳව ශ්‍රී ලංකාව සමග ඇති කර ගත් ගිවිසුමේ වෙනසක් නැහැ' (2021 පෙබරවාරි) ද හින්දු https://www.thehindu.com/news/international/pact-with-sri-lanka-on-trincomalee-oil-farm-stands-says-india/article33876858.ece

[150]ලැයිස්තුගත සමාගම්වල ඉපැයීම් බිලියන 100 කඩඉම පසුකරත්ම වාර්තා බිඳ වැටේ. (ජුනි 2021) ඩේලිඑෆ්ටී https://www.ft.lk/front-page/Records-tumble-as-listed-firms-earnings-top-Rs-100-b-milestone/44-719204

අසමානතාවයන්ට[151] මුහුණ දෙමින් සිටි සේවකයන් වසංගත තත්වය නිසා වඩාත් නිරාවරණය වී තත්වය වඩාත් උග්‍ර කෙරිණ. සංක්‍රමණික සේවකයන්, නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් සහ වෙනත් අය ඇතුළත් කණ්ඩායම් ගණනාවක් මුහුණ දුන් දුෂ්කරතා වාර්තාගත කළ නමුත් එම ගැටලු නිරාකරණය සඳහා ප්‍රතිපත්ති මට්ටමේ කිසිදු පියවරක් ගත්තේ නැති තරම් ය. මෙය ආණ්ඩුවේ සංවර්ධන ප්‍රතිපත්තියේ පවතින අසමානතා ස්වභාවයත් සමාජයේ සැලකිය යුතු කොටසකගේ අයිතිවාසිකම්වලට වඩා ව්‍යාපාරික ප්‍රජාවේ තම පාක්ෂිකයන්ගේ ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය ලබා දීමත් පෙන්නුම් කරයි.

නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් මෙන්ම වතුකරයේ සේවකයන් ද[152] රට වසා දමා තිබූ කාල සීමාවේ වැඩ කළ යුතු විය. ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා නොදුන් නිසා රෝගය බෝවීමේ අනතුරක් ද තිබිණ.[153] කොවිඩ් 19 වැළඳී ඇතැයි තහවුරු වූ හෝ නිරෝධායනයට ලක් කළ හෝ නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් බොහෝ දෙනකුට වැටුප් රහිත නිවාඩු ගැනීමට සිදු වූ නිසා ඔවුන්ට වෙනත් ආදායම් මාර්ගයක් තිබුනේ ද නැත. ඔවුන්ට පොරොන්දු වූ රු.5000 දීමනාව ද ලැබුණේ නැත. ඊට අමතරව නිදහස් වෙළඳ කලාපයේ සේවකයන්ට එන්නත් ලබා දීමේ දී ප්‍රමුඛතාවයක් හිමි වූයේ ද නැත. බොහෝ දෙනකුට එන්නතේ පළමු මාත්‍රාව හෝ ලැබී නැත. එමනිසා වෛරසයට ගොදුරුවීමේ ඉඩකඩ වැඩි වූ අතර ඔවුන්ට මුහුණ දීමට සිදු වූයේ තම සෞඛ්‍යය හා ජීවන මාර්ගය යන දෙකින් එකක් තෝරා ගැනීමේ අසීරු අවස්ථාවට ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයෝ කොවිඩ් 19ට ගොදුරුවීමේ වැඩිම අනතුරක් ඇති කණ්ඩායම බවට පත් වූහ. යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුවෙන් මෑතක සම්මත කළ යෝජනාවෙන් ඉස්මතු කර දැක්වෙන තවත් ගැටලු පවතින අතර එය GSP+ පහසුකමට ද බලපෑමක් විය හැකි බැවින් ආර්ථික පැතිමානයේ වඩාත් පසුබෑමක් විය හැකියැයි ඇති ශක්තිමත් බියක් පවතී.[154]

වසංගත සමයේ සංක්‍රමණික සේවකයෝ ද බරපතළ ගැටලුවලට මුහුණ දුන්හ. බොහෝ දෙනකු ආදායම් මාර්ගයක් නොමැතිව රටින් පිටත අතර මං වූහ. ආපසු ගෙන්වා ගැනීමේ ප්‍රතිපත්තියේ ද ගැළපීමක් තිබුණේ නැත. විශේෂයෙන්ම කොවිඩ් 19ට ප්‍රතිචාර දැක්වීමේ මුල් අදියරේ දී ප්‍රමුඛතාවය දුන්නේ ගුවන් ගාස්තුව ගෙවීමට හැකි අයට ය. ආර්ථිකව ආන්තික වූ අයට පිළිසරණක් ලැබුණේ නැත. බොහෝ විට ඔවුන්ට ආපසු සිය රටට පැමිණීමට පුද්ගලික පරිත්‍යාග මත යැපීමට සිදු විය.[155]

ඔවුන්ගේ අවශ්‍යතා ලබා දීමට සහ ආරක්ෂිතව ආපසු පැමිණීම තහවුරු කිරීමට ආණ්ඩුව අපොහොසත් වීමෙන් සේවකයන් අවලංගු වූවන් සේ සැලකූ බවට සාක්ෂියකි. ආණ්ඩුව සහ එහි ව්‍යාපාරික හිතවතුන් දේශීය නිෂ්පාදනයට සේවකයන්ගෙන් වන දායකත්වයෙන් සහ විදේශ විනිමය ඉපයුමෙන් ප්‍රතිලාභ ලැබුවත් ආණ්ඩුවේ සංවර්ධන දැක්මේ පිරිවැය දැරීමට සිදු වූයේ ද එම සේවකයන්ටම ය.

මෙම කොටසේ මතු කරන ලද සමහර ගැටලුවලින් පෙන්නුම් කරන ආකාරයට අනෙකුත් ගැටලු නොසලකා සංවර්ධන වැඩි ප්‍රමුඛතාවය බවට පත් කර ගැනීමත් සමග විවිධාර බලපෑම් ඇති කරයි. පවතින සහ නව මුලපිරුම් කීපයකින්ම ආණ්ඩුව පාලනය, පරිසරය සහ කම්කරු ප්‍රමිතීන් නොසලකා

---

[151] විමල් නානායක්කාර ' තුලනය කිරීමේ උත්සාහයක්: ශ්‍රී ලංකාවට කලාපීය ආදායම් අසමානතා ජය ගත හැකි ද? (2018 දෙසැම්බර්) IPS https://www.ips.lk/talkingeconomics/2018/12/27/a-balancing-act-can-sri-lanka-overcome-regional-income-inequalities/
ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2020 ශ්‍රී ලංකාවේ මහ බැංකුව
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/otherpub/publication_sri_lanka_socio_economic_data_folder_2020_e.pdf

[152] යස්මින් ගුණරත්නම් 'ශ්‍රී ලංකාවේ තේ නෙළන්නියන් රට වසා ඇති තත්වයක් යටතේ වැඩ කරන විට සබන් සහ සහන හිඟ තාවයක් (2020 අප්‍රේල්)
ගාඩියන් https://www.theguardian.com/global-development/2020/apr/24/soap-and-solace-scarce-as-sri-lankas-tea-pickers-toil-on-amid-lockdown
එස් කන්ඩිපාන්, ඇම් තේවරාජා ශ්‍රී ලාංකික සේවකයෝ වැඩි වැඩ සහ අඩු පඩිවලට එරෙහිව විරෝධතාවයක (2021 මැයි) World Socialist Web Site https://www.wsws.org/en/articles/2021/05/15/sril-m15.html

[153] ශ්‍රී ලාංකික වෘත්තීය සමිති කොවිඩ් 19 වසංගතයේ අර්ධ වාර්ෂික සංවත්සරයේ දී බ්‍රැන්ඩික්ස් සහ ලෝක බැංකුවෙන් සේවක අයිතිවාසිකම්වලට ගරු කරන මෙන් ඉල්ලයි. https://asia.floorwage.org/wp-content/uploads/2021/04/Sri-Lanka-Press-statement-08.04.2021.pdf

[154] යුරෝපා සංගමයේ යෝජනාව GSP+ පහසුකමට මුෂ්ටි ප්‍රහාරයක් (2020 ජුනි) ඩේලිඑෆ්ටී https://www.ft.lk/news/EU-Parliament-Resolution-throws-down-the-gauntlet-on-GSP/56-719095

[155] මිහි පෙරේරා: සංක්‍රමණික සේවකයන් වහාම ගෙන්වා ගත යුතුයැයි විරෝධතාකරුවෝ පවසති.(2021 ජනවාරි) , ද මෝර්නිං https://www.themorning.lk/protesters-urge-early-repatriation-of-migrant-workers/

සංවර්ධන කතිකාව ගෙන යන්නේ කෙසේද යන්න පැහැදිලි කරයි. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති මුදල් විශුද්ධිකරණයට සහ දූෂණයට ඉඩ ප්‍රස්ථා සැලසිය හැකියැයි සැකයක් පවතී. මුදල් පාලනය පිළිබඳව පවතින ආරක්ෂාවන් ඉවත් කිරීමට උත්සාහ ගැනීමෙන් ශ්‍රී ලංකාවේ චෞරතන්ත්‍රයක් (Kleptocracy) ඇති කිරීමට පහසුවක් විය හැකිය. මෙවැනි පසුබිමක් තුළ තෝරා ගත් සංවර්ධන ආදර්ශය සහ ඉන් ඇති කරන බලපෑම් ප්‍රබල අධීක්ෂණයකට ලක් කිරීම අතිශයෙන් වැදගත් ය.

# නිගමනය

මෙම අධ්‍යයනය  වර්ධනය වන ආර්ථික, සෞඛ්‍ය අභියෝග සහ වර්ගවාදී ජාතික වාග්ලංකාරයෙන් නව භීතියක් ඇති කරමින් සහ අසමානතා තිව්‍ර කරමින් පාලනය, හමුදාකරණය, සංහිඳියාව සහ සංවර්ධනය යන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව දැනට මුහුණ දෙන විවිධාකාර වූ අභියෝග ඉස්මතු කරයි. 2019 සහ 2020 දී මහත් අභිලාෂයෙන් පොරොන්දු ලබා දුන් නමුත් පවතින යථාර්ථය 'සෞභාග්‍යයේ දැක්මෙන්' බෙහෙවින්ම දුරස්ථ වූවකි.

මෙම අපැහැදිලි දැක්ම ආණ්ඩුව තුළම ඇති බෙදීම්වලින් සහ අනාගතය පිළිබඳ හට ගෙන ඇති සටන්වලින් වඩාත් තීව්‍ර විය හැකිය. ඒ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කණ්ඩායම් මෙම තත්වයට ඵලදායි සේ මුහුණ දීමට කිසිවක් නොකරණ තත්වයක් තුළය. මෙම අවස්ථාවේ අවශ්‍යතාවය වන්නේ පැවති යථාර්ථය පිළිගන්නා සහ ඊට විසඳුම් ලබා දෙන පියවර සහ ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය ගැන ජනතාව තුළ විශ්වාසය ඇති කරවන දේශපාලන නායකත්වයක්, ප්‍රතිපත්ති සංගතයක් සහ පැහැදිලි සහ නෛතික පියවර ය. ශ්‍රී ලංකාවේ මෑත අතීතය ත්‍රස්තවාදී ප්‍රහාර, රාජ්‍ය අනුග්‍රහය ලත් ප්‍රචණ්ඩත්වය සහ බිය සහ වෛරය ඇති කරවන ප්‍රචාර බොහෝ දෙනකු වැළඳ ගන්නා සහ එය මැතිවරණයේ දී තීරණ ගැනීමේ දී බලපාන ආකාරය සිහිපත් කරයි. එමනිසා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමට අවශ්‍ය කරන ශක්තිමත් සහ සාමකාමී පියවර සහිත, නායකත්ව සටන්, දේශපාලන පෙළ ගැසීම් සහ ප්‍රතිපත්ති මුලපිරුම් කෙරේ දැඩි අවධානයක් දැක්විය යුතුය.

ප්‍රකාශනය: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), කොළඹ 5, ශ්‍රී ලංකාව

ISBN අංකය – ISBN978-624-5914-02-9

9 786245 914029